# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

## වාරිමාර්ග අංශය

# 2025

වෙළුම - III

## වාර්ෂික කාර්යසාධන වාර්තාව

# වැය ශීර්ෂ - 118

## කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

## වාරිමාර්ග අංශය

# 2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

## අන්තර්ගතය

### වැය ශීර්ෂ අංකය 118

### කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - වාරිමාර්ග අංශය


| | | |
|---|---|---|
| පරිච්ඡේදය 01 | ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 01 |
| පරිච්ඡේදය 02 | ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 07 |
| පරිච්ඡේදය 03 | වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය | 90 |
| පරිච්ඡේදය 04 | කාර්යසාධන දර්ශක | 96 |
| පරිච්ඡේදය 05 | තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 97 |
| පරිච්ඡේදය 06 | මානව සම්පත් පැතිකඩ | 102 |
| පරිච්ඡේදය 07 | අනුකූලතා වාර්තාව | 104 |


ඇමුණුම්


| | |
|---|---|
| ඇමුණුම I | - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - වාරිමාර්ග අංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති |
| ඇමුණුම II | - ක්‍රියාත්මක ආයතන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති / වැඩසටහන් |
| ඇමුණුම III | - Indicator 6.5.1 score |
| ඇමුණුම IV | - විගණකාධිපතිවරයාගේ වාර්තාව - කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය |

# 01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. හැඳින්වීම

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය 2024 නොවැම්බර් මස 25 වන දිනැති 2412/08 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධනය කර ස්ථාපිත කරන ලදී.

ඒ අනුව, අමාත්‍යාංශයෙහි ප්‍රධාන අංශ 4 වන කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අංශ වලින් එකක් ලෙස වාරිමාර්ග අංශය ශ්‍රී ලංකාවේ ජල සම්පත් සංවර්ධනය සහ කළමනාකරණය පිණිස සුවිශේෂි වූ කාර්යභාරයක් ඉටුකරනු ලබයි.

රටේ කෘෂිකාර්මික සංවර්ධනයට දායකවෙමින් ගොවි ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීමත්, ඉන් ඔබ්බට යමින් පානීය, කාර්මික හා විදුලි උත්පාදන යන බහුවිධ අරමුණු ඔස්සේ ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණයත් මෙම අංශය මගින් සිදුකරනු ලබයි.

ඒ අනුව, මධ්‍යම හා මහා වාරි කලාප ආශ්‍රිතව ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් ඔස්සේ ගොවි ප්‍රජාව සවිබල ගැන්වීමත්, ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් එහි ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පවත්වා ගැනීමත් සඳහා විවිධ වැඩසටහන් මෙම අංශය යටතේ ක්‍රියාත්මකවිණි.

## 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

### 1.2.1. දැක්ම

"තිරසාර ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම"

### 1.2.2. මෙහෙවර

ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය තුළින් බහුවිධ අවශ්‍යතා ඉටුකරමින් ප්‍රජාවගේ හා පරිසරයේ යහපැවත්ම සැලසීම

### 1.2.3. අරමුණු

i. රටේ සියලු ජල පරිභෝජන හා බලශක්ති අවශ්‍යතා සඳහා අවශ්‍ය වන ජල සම්පත සංවර්ධනය හා කළමනාකරණය

ii. ඉඩම් හා ජල භාවිත කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම

iii. ගංගා ද්‍රෝණි හා ජල මූලාශ්‍ර සංරක්ෂණය මගින් ජලයේ ගුණාත්මක බව හා තිරසාර බව ආරක්ෂා කිරීම.

iv. ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීමට අවශ්‍ය වාරි ජල හා කෘෂිකාර්මික උපදේශන පහසුකම් සැලසීම

v. සියලු ශ්‍රී ලාංකිකයන්ට සෞඛ්‍ය ආරක්ෂිත ගෘහස්ත ජල සැපයුමක් තහවුරු කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම

vi. පාරිසරික සමතුලිතතාව හා සංවර්ධනය සඳහා අවශ්‍ය ජල පහසුකම් සැලසීම

vii. වාරි පද්ධති ආශ්‍රිත ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම තුළින් කෘෂිකර්මාන්තයේ තිරසාර බව තහවුරු කිරීම

viii. කර්මාන්ත, සංචාරක සේවා අංශ වල ජල අවශ්‍යතා සපුරාලීම

ix. ශ්‍රී ලංකාවේ භූගත ජල සම්පත් සංවර්ධනය, සංරක්ෂණය හා කළමනාකරණය

x. මහවැලි විශේෂ ආර්ථික බලප්‍රදේශ මඟින් ජාතික ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට සක්‍රිය දායකත්වයක් ලබාදීම

## 1.3. ප්‍රධාන කාර්යයන්

i. අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි විෂයන්ට අදාල ප්‍රතිපත්ති සම්පාදනය, ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සමාලෝචනය හා ඇගයීම.

ii. අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව සහ මහජන හිතකාමී අයුරින් ලබාදීම.

iii. ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය සංවර්ධනය කිරීම.

iv. ජල සම්පත් හා වාරි පද්ධති සංවර්ධනය / වාරිමාර්ග සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

v. ජල කළමනාකරණය හා ගොවීන්ගේ වගා අවශ්‍යතා අනුව ජල සැපයුම කළමනාකරණය කිරීම.

vi. ජල පෝෂක ප්‍රදේශ සහ ගංගා ද්‍රෝණි නිශ්චිත වශයෙන් නිර්ණය කර ඒවා තිරසාර අයුරින් සංරක්ෂණය හා සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

vii. මෙහෙයුම හා නඩත්තුව ද ඇතුළුව වාරිමාර්ග පද්ධති හා ගංගා ද්‍රෝණි කළමනාකරණය සහ ගංවතුර තත්ත්වය පිළිබඳ අධීක්ෂණය, පුරෝකථන සහ පූර්ව අනතුරු ඇඟවීම් ලබාදීම

viii. ජල මූලාශ්‍ර හා වාරිමාර්ග පද්ධති සංරක්ෂණය හා ආරක්ෂා කිරීම.

ix. වෙරළ ආරක්ෂණ විධිවිධාන සම්පාදනය කිරීම.

x. කෘෂිකාර්මික සංවර්ධනයට ප්‍රමුඛත්වය දෙමින් ප්‍රතිපත්තිමය ලෙසින්, විදුලි හා පානීය ජලය සැපයීමට අවශ්‍ය ජලාශ හා වාරි පහසුකම් මනා ලෙස කළමනාකරණය කිරීම.

xi. බහුවිධ අවශ්‍යතා සඳහා අවශ්‍ය ජල ප්‍රමාණයන් වෙන්කිරීම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා නිර්ණායක සකස් කිරීම.

xii. ජල මූලාශ්‍ර හා ආශ්‍රිත පරිසර දූෂණය වැළැක්වීමට හා ජලයේ ගුණාත්මක බව තහවුරු කිරීම සඳහා උපාය මාර්ගික වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

xiii. ගොඩබිමට කරදිය ගලා ඒම වැළැක්විමේ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

xiv. අපවහනය සහ ගංවතුර ආරක්ෂණය.

xv. වාරිමාර්ග පද්ධති වල ආයතනික සංවර්ධනය හා ඵලදායීතාවය ප්‍රවර්ධනය කිරීම.

xvi. භූගත ජලය සංවර්ධනය අධීක්ෂණය හා කළමනාකරණය.

xvii. වැසි ජල සංරක්ෂණය, වැසි ජලය රැස්කිරීම ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xviii. ජාතික විදුලිබල සැපයුමෙහි ප්‍රධාන පුනර්ජනනීය බලශක්ති සැපයුම්කරු ලෙස මහවැලි ජලාශ පද්ධති කළමනාකරණය

xix. දේශීය ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රධාන කොටස්කරුවෙකු ලෙස මහවැලි විශේෂ බල ප්‍රදේශ හරහා ලබාදෙන දායකත්වය පුළුල් කිරීම සඳහා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

xx. ඉංජිනේරුමය උපදේශන සේවා ලබා දීම.

xxi. රාජ්‍ය අංශයේ ප්‍රධානතම ඉදිකිරීම් සේවා සැපයුම්කරු ලෙස ප්‍රමිතිගත ඉදිකිරීම් කාර්යයන්හි නිරතවීම

xxii. දේශීය වාරිමාර්ග ඉංජිනේරු සේවාව ආරක්ෂා කරමින් වාරිමාර්ග ක්ෂේත්‍රයේ වෘත්තීය සේවා පුළුල් කිරීම.

## 1.4. සංවිධාන සටහන

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - වාරිමාර්ග අංශය



### 1.5. වාරිමාර්ග අංශය යටතේ පවතින දෙපාර්තමේන්තු

- වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### 1.6. වාරිමාර්ග අංශය යටතේ පවතින ආයතන/ අරමුදල්

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
- වාරිමාර්ග කළමනාකරණ අංශය
- ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
- මධ්‍යම ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම
- මහවැලි උපදේශක කාර්යාංශය

### 1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘති වල තොරතුරු

| අ) ව්‍යාපෘතියේ නම | ආ) දායක නියෝජිතායතනය | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම් (රු. මිලි.) | ඈ) ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|
| මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) අදියර I සහ අදියර II | ආසියානු සංවර්ධන බැංකුව හා ශ්‍රී ලංකා ජනරජය | 160,950.00<br>ඇ.ඩො.මි. 536.50<br>(සංශෝධිත)<br>(ඇ.ඩො 1 = රු. 300) | අදියර I<br>2015 – 2025<br>අදියර II<br>2026 - 2030 |
| උමාඔය බහුකාර්යය සංවර්ධන ව්‍යාපෘතිය<br>(2015 වසරේ සිට දේශීය අරමුදල් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මකවේ) | ශ්‍රී ලංකා ජනරජය හා ඉරානයේ ආර්ථික සංවර්ධන බැංකුව | 99,100.00 (සංශෝධිත)<br>ඇ.ඩො.මි. 514.06<br>(මුලස්ථායී - රු.මි. 89,748.00)<br>(ඇ.ඩො.මි. 50 - ඉරානයේ ආර්ථික සංවර්ධන බැංකුව) | 2010 - 2026 |
| මොරගහකන්ද සහ කළුගඟ ජලාශ ව්‍යාපෘතිය | CDB, SFD, KFAED, OFID, ශ්‍රී ලංකා ජනරජය | 120,700.00<br>(ඇ.ඩො.මි. 770.41) | 2007 - 2025 |
| දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන (CResMPA) | ලෝක බැංකු ණය පහසුකම් | 15,567.00<br>(ඇ.ඩො.මි. 76) | 2021 - 2026 |
| ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) | ලෝක බැංකුව | 20,308.70<br>(ඇ.ඩො.මි. - 70.03) | 2021 - 2027 |
| ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින්ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව - CRIWMP) | හරිත දේශගුණික අරමුදල සහ ශ්‍රී ලංකා ජනරජය | 12,940.00<br>ඇ.ඩො.මි. 52.08<br>(ඇ.ඩො 1 = රු. 250) | 2017 - 2025 |

| අ) ව්‍යාපෘතියේ නම | ආ) දායක නියෝජිතායතනය | ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම් (රු. මිලි.) | ඈ) ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|
| නකල්ස් කඳුවැටියේ අවදානමට ලක්ව ඇති ගංගා ද්‍රෝණි, දිය ඇලි ආශ්‍රිත ප්‍රදේශ සහ පහළ ජල පෝෂක ප්‍රදේශයේ වාසය කරන ගොවීන් සහ වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කිරීම (හරිත දේශගුණික අරමුදල) GCF Knuckles | හරිත දේශගුණ අරමුදල / ශ්‍රී ලංකා රජය - සම මූල්‍ය දායකත්වය | 14,710.00 (ඇ.ඩො.මි.48.975) | 2023 - 2029 |

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1. විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

### 2.1.1. විශේෂ කරුණු හා ප්‍රගතිය

ශ්‍රී ලංකාවේ වාරි කර්මාන්තය නගා සිටුවීම උදෙසා ජල සම්පත් සංවර්ධනය හා කළමනාකරණය මගින් මහඟු පිටුවහලක් ලබා දෙන්නා වූ වාරිමාර්ග අංශය, වී වගාව සඳහා ජලය සැපයීම ඇතුළුව ලංකාවේ සියලු ප්‍රදේශයන් සඳහා විවිධ අවශ්‍යතාවයන්ට ජලය සැපයීම සිදු කරනු ලබයි.

එසේම ලංකාව පුරා පැතිර ඇති ජලාශ හා වාරිමාර්ග පද්ධති මෙහෙයුම්, නඩත්තු හා සංරක්ෂණ කටයුතු වලට අමතරව වාරිමාර්ග පද්ධතීන් වැඩිදියුණු කිරීමට ද ඉන් ඔබ්බට රටේ පානීය ජල අවශ්‍යතාවය සැපයීමට හා විදුලිබල උත්පාදනය සඳහා වූ ජලය සැපයීම වාරිමාර්ග අංශයේ කාර්යභාරයකි.

වාරිමාර්ග අංශය යටතේ ක්‍රියාත්මක කරන ලද ශ්‍රී ලංකාවේ ප්‍රධාන වාරිමාර්ග ව්‍යාපෘතියක් වන උමා ඔය බහු කාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සාර්ථකව නිමා කරන ලදී. එමගින් රටෙහි සමස්ත විදුලිබල අවශ්‍යතාවයෙන් මෙගාවොට් 120 ක ධාරිතාවයක් ජාතික විදුලිබල පද්ධතියට එකතු කර ඇත. ව්‍යාපෘතිය අවසන් කළ ද, දෝෂ නිවැරදි කිරීමේ කාලය තුළ ඉතිරි වැඩ සහ දෝෂ නිවැරදි කිරීම කොන්ත්‍රාත්කරු විසින් සිදු කළ යුතුය. එබැවින් ව්‍යපෘති කළමනාකරණ ඒකකය (PMU) 2026 .03.31 දක්වා දීර්ඝ කර ඇත.

ගංවතුර, නායයාම් ආදි ව්‍යසනයන්ට අදාලව ලෝකයේ අවදානම් මට්ටමේ ඇති රටවල් අතරට ලංකාව අයත්වන බව හඳුනාගෙන ඇත. ඒ අනුව දේශගුණික අවබලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන (CResMPA) ලෝක බැංකු අධාර මත ආරම්භ කර ඇත. එමගින් ගංවතුර, නායයාම් ආදි ව්‍යසනයන් සඳහා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යන ආයතනවල අනතුරු ඇඟවීම් පද්ධති වැඩිදියුණු කර අදාල පුරෝකථනයන් නිවැරදිව සිදු කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව එම ආයතන වලට අදාල කටයුතු සිදු කරමින් පවතී.

තව ද කැළණි ගඟ ආශ්‍රිත ගංවතුර අවම කිරීම හා පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා ඉහළ ජලාධාර ප්‍රදේශයේ වී ඔය ජලාශය ඉදිකිරීමට අදාල සැලසුම් සකස් කිරීම උපදේශන සමාගම විසින් සිදු කරමින් පවති. අඹතලේ ලවණ බාධකය ඉදිකිරීමට අදාල සැලසුම් සමාලෝචනය කිරීම ආරම්භ කර ඇත. එසේම දිස්ත්‍රික්ක 25 ට අදාලව සුළු හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග ව්‍යාපෘති වල පුනරුත්ථාපන කටයුතු ද සිදු කරමින් පවති.

මධ්‍යම හා මහා පරිමාණ වාරිමාර්ග ව්‍යාපාර වල මූලස්ථායි වැඩ හා ඇළ පද්ධති පුනරුත්ථාපනය, යටිතල පහසුකම් සංවර්ධනය සහ ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශය සංරක්ෂණය කිරීමේ මූලික

සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරිම මූලික කර ගත් ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපාතිය (IWWRMP) ද ඉලක්ක සපුරා ගැනිම සඳහා නිරන්තර කාර්යභාරයක් සිදු කරමින් සිටී.

මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනට (MWSIP) අදාල උතුරු මැද පළාත් මහ ඇළ (NCPCP) ව්‍යාපෘතියේ කි.මි. 27.7 ක් දිග උමගේ ඉදිකිරිම් කටයුතු හා මිනිපේ දකුණු ඉවුරු ගේට්ටු නිර්මිතයේ කටයුතු සිදු කරමින් පවති. කළු ගඟ - මොරගහනක්ද යා කරන කි.මි. 8.8 ක් දිග ඇළෙහි/ උමගේ ප්‍රගතිය 100% කි. මෙම ව්‍යාපෘතියෙහි පළමු අදියර 2025 වසරේ අවසන් කරන ලද අතර දෙවන අදියරේ කටයුතු ආරම්භ කර ඇත.

ඒකාබද්ධ ග්‍රාම - නගර සංවර්ධනය සහ දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදීමේ ව්‍යාපෘතිය (IRDCRP) යනු ශ්‍රී ලංකාවේ, විශේෂයෙන් වාරිමාර්ග පද්ධතිය හා කෘෂිකර්මාන්තය මත යැපෙන ග්‍රාමීය දිස්ත්‍රික්ක වල ඉහළ දරිද්‍රතාවය හා දේශගුණික බලපෑම්වලට ලක්වේ යැයි නම්කරන ලද ප්‍රදේශ වලට  අවශ්‍ය බහු ආංශික මැදිහත් වීම් සිදුකරනු ලබන ව්‍යාපෘතියකි. එහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය පිහිටුවා ඇති අතර මූලික අදියරේ පවතින ව්‍යාපෘතියකි. ලෝක බැංකුවේ සහය ඇතිව ක්‍රියාත්මක වේ.

මෙම ජයග්‍රහණ වලට අමතරව 2025 වසරේ නොවැම්බර් මස සිදු වූ දිට්වා සුළි කුණාටුව සහ ගංවතුර හේතුවෙන් වාර්මාර්ග පද්ධතියට සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් වලට ඇති වූ බලපෑම යථා තත්ත්වයට පත්කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි වසර අවසානයේ වැඩි අවධානයක් යොමුකිරීමට සිදුවිය.

ඒ අනුව මේ වනවිට කඩිනමින් යථාවත් කළ යුතු වාරි යටිතල පහසුකම් තාවකාලික පිළියම් යොදා යථාවත් කර ඇති අතර 2026 වසර තුළ දී ද ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක වීමට නියමිතය. මේ සඳහා හදිසි අවස්ථා ප්‍රතිචාර සංරචකය යටතේ (CERC) ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) මගින් ඇ.ඩො. මිලියන 12 ක් සහ දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන (CResMPA) ව්‍යාපෘතියෙන් ඇ.ඩො. මිලියන 10 ක් වෙන් කර ඇති අතර අනෙකුත් ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙනු ඇත.

වාරිමාර්ග අංශය යටතේ ක්‍රියාත්මක වූ ප්‍රධාන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය පහත පරිදි සාරාංශගත කොට දැක්විය හැකිවේ.

## 1. මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP)

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල (රු.මි.)** | 160,950.00<br>ඇ.ඩො.මි. 536.50<br>(සංශෝධිත)<br>(ඇ.ඩො 1 = රු. 300) | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | පොළොන්නරුව,<br>අනුරාධපුර,<br>මාතලේ,<br>කුරුණෑගල |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය | **ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | • පළමු අදියර - හෙක්ටයාර 32,800<br>• දෙවන අදියර - හෙක්ටයාර 68,000 |
| **ව්‍යාපෘති කාලය** | පළමු අදියර : 2015 - 2025<br>දෙවන අදියර : 2026 - 2030 | **ප්‍රතිලාභීන්** | 1,399,000 පමණ |
| **ප්‍රතිපාදන 2025 (රු.මි.)** | 30,973.73 | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 20,565.35 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 138,127.87 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 35.5 |
| **2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • කළු ගඟ මොරගහකන්ද හුවමාරු ඇළ (KMTC) ව්‍යාපෘතිය නිම කර මහවැලි අධිකාරිය වෙත භාරදීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදුවෙමින් පවතී.<br>• මිනිපේ වම් ඉවුරු ඇළ පුනරුත්ථාපන ව්‍යාපෘතිය (MLBCRP) සම්පූර්ණ කර වාරිමාර්ග දෙපාර්තමේන්තුව වෙත භාරදීමේ ක්‍රියාවලිය දැනට සිදුවෙමින් පවතී.<br>• ඉහළ ඇළහැර ඇළ ව්‍යාපෘතියෙහි UECP-ICB-2A උමං කැණීම ආසන්න වශයෙන් අවසන් 2025 වසර තුළ කි.මී. 8.77 ක් (සමස්ථ ප්‍රගතිය - කි. මී. 25 ක් පමණ) පමණ වැඩ අවසන් කර ඇත. වැඩසටහනෙහි පළමු අදියර අවසන් කර ඇත. | | |
| **2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | 29,000.00<br>(ආසියානු සංවර්ධන බැංකුව - 24,000 + ශ්‍රී ලංකා රජය - 5,000.00) | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • හුරුළු වැව, මාන්නක්කට්ටිය, ඒරු වැව, මහකන්දරාව, නාච්චදූව, නුවර වැව හා තිසා වැව යන මහා වාරිමාර්ග පද්ධති වල හෙක්ටයාර් 12,300ක වගා තීව්‍රතාවය වැඩි කිරීම සහ උතුරු මැද පළාතේ පානීය ජල අවශ්‍යතාවය සඳහා ඝන මීටර් මිලියන 40ක් වාර්ෂිකව ලබා දීම.<br>• වාණිජ කෘෂිකර්ම සංවර්ධන වැඩසටහන මඟින් ඉහළ ආර්ථික ප්‍රතිලාභ සහතික කිරීම, ඉඩම් සහ ජලයෙහි ඵලදායිතාවය ඉහළ නැංවීම සහ විදේශ විනිමය උත්පාදනය මඟින් ගොවි පවුල් වල ජීවනෝපාය වැඩි දියුණු කිරීමට අපේක්ෂිතයි. | | |

**මහවැලි කලාප වල ආර්ථික අර්බුදයෙන් පීඩාවට පත් ගොවීන් සඳහා ජීවනෝපාය වැඩිදියුණු කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීම.**

| ප්‍රධාන ක්‍රියාකාරකම/ ව්‍යාපෘතිය | 2025 සඳහා ප්‍රතිපාදන (රු.මිලි) | දිස්ත්‍රික්ක | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු. මිලි) |
| 01. ලේයර් වර්ගයේ බිත්තර කිකිළි පැටවුන් 100,000 සහ මාස 5ක් සඳහා අවශ්‍ය ආහාර සැපයීම | 94.9 | අනුරාධපුර, පොළොන්නරුව, මාතලේ, මහනුවර, රත්නපුර | මහවැලි බී, සී, ඩී, ඊ, ජී, එච්, හුරුළුවැව හා වලව කලාපවල පවුල් 1,926 ක් අතර බෙදා දෙන ලද අතර මේ වන විට බිත්තර නිෂ්පාදනය සිදු වෙමින් පවතී | 94.9 |
| 02. මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම | 163.7 | පොළොන්නරුව | මහවැලි බී කලාපයේ අරලගන්විල බීජ ගොවිපල භූමියේ යෝජිත මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය ඉදිකරන ලද අතර එමගින් මහවැලි කලාපවල ඇති මිරිදිය වැව් සඳහා අවශ්‍ය මත්ස්‍ය පැටවුන් නිෂ්පාදනය කිරීම 2026 වසරේ සිට අරඹම කිරීමට නියමිතව ඇත. | 186.9 |
| 03. කිරි ගව පාලනය ප්‍රවර්ධනය කිරීම | 221.8 | අනුරාධපුර, පොළොන්නරුව, මාතලේ | මහවැලි බී, සී, ඩී, ජී, එච් සහ හුරුළුවැව කලාපවල නියමිත සුදුසුකම් සපුරණ ලද ගොවීන් 243 සඳහා පහත සඳහන් පහසුකම් සපයා ඇත.<br>- මාස 3 ක් සඳහා සාන්ද්‍ර ගව ආහාර<br>- තණකොළ කැබලි කරන යන්ත්‍ර<br>- අක්කර 1 හෝ ½ ප්‍රමාණයේ තෘණ වගා භූමි සඳහා,<br>• ක්ෂුද්‍ර ජල පද්ධති<br>• වගා භූමි වටා සාමාන්‍ය හා විදුලි වැට සඳහා අවශ්‍ය උපකරණ<br>• වගා භූමි ස්ථාපනය කර පවත්වාගෙන යාම වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම | 255.6 |

| ප්‍රධාන ක්‍රියාකාරකම/ ව්‍යාපෘතිය | 2025 සඳහා ප්‍රතිපාදන (රු.මිලි) | දිස්ත්‍රික්ක | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු. මිලි) |
| | | | - ඇසොල්ලා ටැංකි හා අප ජල ටැංකි සකස්කරගැනීම වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයීම<br>- ගව දෙණුන් සඳහා සහතික කරන ලද කෘත්‍රිම සිංචන අවස්ථා උපරිම 5ක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන සැපයීම | |

## 2. උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය

<table>
<tr><td colspan="2">ඇස්තමේන්තුගත මුදල (රු.මි.)</td><td>89,748.00</td><td>ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක</td><td>බදුල්ල සහ මොණරාගල</td></tr>
<tr><td colspan="2">මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය</td><td>ඉරානයේ ආර්ථික සංවර්ධන බැංකුව- ඇ.ඩො.මි. 50.00<br><br>ශ්‍රී ලංකා රජය - ඇ.ඩො.මි.479.00 සහ<br>රු.මි. 15.474</td><td>ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන) / වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)</td><td>• පුහුල්පොල වේල්ල - ඝන මීටර මිලියන 0.6<br>• ඩයරබා ජලාශය - ඝන මීටර මිලියන 0.9<br>දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1,500 ක් සහ අලුතින් සංවර්ධනය කළ ඉඩම් හෙක්ටයාර 4,500 ක් සමඟ මුළු හෙක්ටයාර් 6,000 ක වගා ඉඩම්</td></tr>
<tr><td rowspan="2">ව්‍යාපෘති කාලය</td><td>මූලික ගිවිසුම් කාලය</td><td>මූලස්ථායී වැඩ - 2010 මාර්තු - 2015 මාර්තු</td><td rowspan="2">ප්‍රතිලාභීන්</td><td rowspan="2">• ව්‍යාපෘතියේ පහළ නිම්න සංවර්ධනය මගින් පවුල් 6,000<br>• විදුලිබල උත්පාදනය මගින් සමස්ථ ජනතාවටම සෙත සැලසේ.</td></tr>
<tr><td>කාලය දීර්ඝ කිරීම</td><td>2015 මාර්තු - 2026 මාර්තු</td></tr>
<tr><td colspan="2">ප්‍රතිපාදන 2025 (රු.මි.)</td><td>1,920.00</td><td>මූල්‍ය ප්‍රගතිය 2025 (රු.මි.)</td><td>1,288.91 (මූලස්ථායී වැඩ)</td></tr>
<tr><td colspan="2">සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)</td><td>83,207.53</td><td>සමස්ථ භෞතික ප්‍රගතිය (%)</td><td>99.98</td></tr>
</table>

| | |
|---|---|
| **2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • ප්‍රතිඅපනයන ක්‍රියාවලිය ආරම්භ කිරීම<br>• හඳුනාගත් දෝෂ නිවැරදි කිරීම<br>• ව්‍යාපෘතියට අදාලව නිමකරන ලද සටහන් 3,215ක් අදාළ ආයතන වෙත භාරදෙන ලදී. (ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, ලංකා විදුලි බල මණ්ඩලය) |
| **2026 සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | 1,270.00* |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ ගිනිකොන දිග වියළි කලාපයේ ජල හිඟය සමනය කිරීම සඳහා උමා ඔය ද්‍රෝණියේ සිට කිරිඳි ඔය ද්‍රෝණියට වාර්ෂිකව අතිරික්ත ජලය ඝන මීටර මිලියන 145 ක් උමාඔය ද්‍රෝණියේ ජල පරිහරණය කරන්නන් හා පරිසරයට බලපෑම් නොකර හරවා යැවීමයි.<br>• මෙගාවොට් 120 ක ධාරිතාවයකින් යුත් භූගත විදුලි බලාගාරය මගින් වාර්ෂිකව ජාතික විදුලිබල පද්ධතියට ගිගාවොට් පැය 290 ක විදුලි බලයක් එක් කරයි.<br>• මොණරාගල දිස්ත්‍රික්කයේ නව ඉඩම් හෙක්ටයාර 4,500 කට ආසන්න ප්‍රමාණයක් සහ දැනට පවතින කෘෂිකාර්මික ඉඩම් හෙක්ටයාර 1,500 කට පමණ වාරි ජලය සැපයීමට මෙයින් හැකි වන අතර මොණරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල පානීය හා කාර්මික ජල අවශ්‍යතා ඝන මීටර මිලියන 30 ක් ලබා දෙනු ඇත.<br>• තව ද, ජලය ඝන මීටර මිලියන 9 ක් වාර්ෂිකව බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රදේශයට ඩයරබා ජලාශයෙන් සහ ඇටම්පිටිය ප්‍රදේශයට පුහුල්පොල ජලාශයෙන් ලබා දෙනු ඇත. මොණරාගල දිස්ත්‍රික්කයේ වැල්ලවාය සහ තණමල්විල ප්‍රදේශවලට පානීය ජලය අලිකොටආර ජලාශයෙන් ලබා දෙනු ඇත.<br>• 2024 අප්‍රේල් මාසයේ උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය සාර්ථකව නිම කර එහි විදුලිබලාගාරය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව, මෙම ව්‍යාපෘතිය අපේක්ෂිත ඉලක්ක ඉක්මවා සාර්ථකත්වයක් ලබා ඇත. ජාතික විදුලි ජාලයට ජල විදුලි බලශක්තිය ගිගාවොට්-පැය (GWh) 625කට ආසන්න ප්‍රමාණයක් එක් කර ඇති අතර, පසුගිය මාස 21 තුළ පහළ ප්‍රදේශ සංවර්ධනය සඳහා කිරිඳි ඔය ජලපෝෂක ප්‍රදේශයට ඝන මීටර් මිලියන (MCM) 235කට ආසන්න ජල ප්‍රමාණයක් මුදා හැර ඇත.<br>• ඊට අමතරව, බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කවල පානීය ජල අවශ්‍යතා සපුරාලීම සඳහා ඝන මීටර් මිලියන (MCM) 39ක ජල ප්‍රමාණයක් වෙන් කර ඇත. එමගින් මෙම ව්‍යාපෘතිය සඳහා සිදු කළ ආයෝජනයේ ප්‍රතිලාභ මේ රටේ ජනතාවට නිරන්තරයෙන් හිමිවෙමින් පවතී. මෙම විදුලි බලශක්තිය බාහිර මූලාශ්‍රවලින් ලබා ගත යුතු වූයේ නම්, ඒ සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 180කට ආසන්න වියදමක් දැරීමට සිදු විය හැකිව තිබුණි. |

* උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ලැබී නොමැති අතර "ව්‍යාපෘති සඳහා අත්පත් කරගත් ඉඩම්වලට අදාළ වියදම්" යටතේ ප්‍රතිපාදන ලැබී ඇත.

## 3. මොරගහකන්ද සහ කළු ගඟ ජලාශ ව්‍යාපෘතිය

<table>
<tr><td colspan="2">ඇස්තමේන්තුගත මුදල (රු.මි.)</td><td>120,700.00</td><td>ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක</td><td>මාතලේ, පොළොන්නරුව සහ අනුරාධපුරය</td></tr>
<tr><td colspan="2">මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය</td><td>ශ්‍රී ලංකා ජනරජය, සංවර්ධනය සඳහා සෞදි අරමුදල, ජාත්‍යන්තර සංවර්ධනය සඳහා ඕපෙක් අරමුදල, අරාබි ආර්ථික සංවර්ධන සඳහා කුවේට් අරමුදල</td><td>ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)</td><td>• මොරගහකන්ද - ඝන මීටර මිලියන 557.87<br>• කළුගඟ - ඝන මීටර මිලියන 248.00</td></tr>
<tr><td rowspan="2">ව්‍යාපෘති කාලය</td><td>මූලික ගිවිසුම් කාලය</td><td>2007 ජනවාරි - 2015 මාර්තු</td><td rowspan="2">ප්‍රතිලාභීන්</td><td rowspan="2">මාතලේ, පොළොන්නරුව සහ අනුරාධපුරය දිස්ත්‍රික්ක වල ජනතාව</td></tr>
<tr><td>කාලය දීර්ඝ කිරීම</td><td>2015 මාර්තු - 2025</td></tr>
<tr><td colspan="2">ප්‍රතිපාදන 2025 (රු.මි.)</td><td>806.00</td><td>2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)</td><td>798.69</td></tr>
<tr><td colspan="2">සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)</td><td>120,695.34</td><td>සමස්ථ භෞතික ප්‍රගතිය (%)</td><td>99.93</td></tr>
<tr><td colspan="2">2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන</td><td colspan="3">• මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා වන්දි ගෙවීම.<br>- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වශයෙන් ලග්ගල 55ක් ද, නාඋල 13ක් ද, ඇළහැර 16ක් ද මැදිරිගිරිය 96ක් සහ කන්තලේ 91 ක් වශයෙන් ඉඩම් කැබලි තක්සේරුව සඳහා තක්සේරු දෙපාරතමේන්තුව වෙත යොමුකර ඇත (ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 98 දෙනෙකු සඳහා වන්දි මුදල්ගෙවා ඇත).<br>- නාඋල ඉඩම් කැබලි 5ක් ද ඇළහැර ඉඩම් කැබලි 7ක් ද සඳහා තක්සේරුව ලැබී ඇත.<br>- ලග්ගල ඉඩම් කැබලි 22 ක් සහ නාඋල ඉඩම් කැබලි 5ක් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇත.</td></tr>
<tr><td colspan="2">2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)</td><td colspan="3">80.00*</td></tr>
<tr><td colspan="2">ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ</td><td colspan="3">• ඝන මීටර මිලියන 557ක ධාරිතාවයෙන් යුතු මොරගහකන්ද ජලාශය<br>• ඝන මීටර මිලියන 248ක ධාරිතාවයෙන් යුතු කළුගඟ ජලාශය<br>• විදුලි උත්පාදනය - වසරකට ගිගාවොට් පැය 114.5ක ජල විදුලි නිෂ්පාදනයක් සිදු කිරීම. එමඟින් වාර්ෂිකව ඉන්ධන සඳහා පිරිවැය රු.මි. 1,545ක් ඉතිරිවේ.<br>• පොදු පරිහරණය සඳහා ගොඩනැගිලි 465</td></tr>
</table>

| | |
|---|---|
| | • කි.මී.276කින් යුත් මාර්ග පද්ධතිය<br>• කි.මී.330කින් යුත් ඇළ මාර්ග පද්ධතිය<br>• කුඩා වැව් 11ක් ස්ථාපිත කිරීම<br>• සුළු වැව් 20ක් ස්ථාපිත කිරීම<br>• **කෘෂිකාර්මික කටයුතු සඳහා හෙක්ටයාර 5,000ක අමතර බිම් ප්‍රමාණයක් එක්වීම.**<br>• **රට තුළ කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩිකිරීම.**<br>වයාපෘතිය ක්‍රියාත්මක කිරීමත් සමඟ දැනට 100% සිට 154% පමණ වන වගාතීව්‍රතාව 181% දක්වා ඉහළ යනු ඇත. හෙක්ටයාරයකට වී අස්වැන්න වැඩි කිරීම ඇතුළු සෘජු ප්‍රතිලාභ මගින් වාර්ෂිකව ටොන් 123,000ක අතිරේක කෘෂිකාර්මික නිෂ්පාදනයක් ලබා දෙනු ඇත. එමඟින් ලැබෙන වාර්ෂික ශුද්ධ කෘෂිකාර්මික ප්‍රතිලාභ රු.මි. 4,000ක් ලෙස ගණනය කර ඇත.<br>• මාතලේ, පොළොන්නරුව, අනුරාධපුර සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කවලට පානීය හා කාර්මික ජල පහසුකම් සැපයීම.<br>• **මිරිදිය ධීවර කර්මාන්තය -** සාමාන්‍ය මත්ස්‍ය නිෂ්පාදන විභවය වසරකට ටොන් 4,700ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර වාර්ෂික ශුද්ධ ප්‍රතිලාභය රු.මි. 940කි.<br>• **රැකියා අවස්ථා වැඩි  කිරීම -** පුද්ගලයින් 650ක් සෘජුවම ව්‍යාපෘතියට බඳවා ගනු ලැබේ. මැණික් හා ස්වර්ණාභරණ, හෝටල් කළමනාකරණ  හා ස්වයං රැකියා පුහුණු ආදිය පැවැත්වීමෙන්/ සංවිධානය කිරීමෙන් වැඩි තරුණ තරුණියන් පුහුණු කරනු ලැබේ.<br>• **පාරිසරික සංචාරක ව්‍යාපාරය වැඩිදියුණු කිරීම -** වස්ගමුව ජාතික වනෝද්‍යානය, මින්නේරිය ජාතික වනෝද්‍යානය සහ රිවර්ස්ටන් ආදිය සංවර්ධනය කිරීමෙන් පරිසර සංචාරක ව්‍යාපාරය වැඩි දියුණු කිරීම.<br>• **ගංවතුර පාලනය -** සෝමාවතිය සහ මනම්පිටිය ප්‍රදේශවල ඇති වූ ගංවතුර හානි පාලනය කිරීම |

*මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ලැබී නොමැති අතර "ව්‍යාපෘති සඳහා අත්පත් කරගත් ඉඩම්වලට අදාළ වියදම්" යටතේ ප්‍රතිපාදන ලැබී ඇත.

## 4. දේශගුණික බලපෑම් අවම කිරීමේ බහු අදියර වැඩසටහන (CResMPA)

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල (රු.මි.)** | 15,567.00<br>ඇ. ඩො.මි. 76 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්ක |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව (IBRD), ලෝක බැංකුව | **ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | ඝන මීටර් මිලියන 56<br>හෙක්ටයාර 25,000 |
| **ව්‍යාපෘති කාලය** | අවුරුදු 6<br>(2021 - 2026) | **ප්‍රතිලාභීන්** | • වැඩිදියුණු කළ කාලගුණය සහ ගංවතුර අනතුරු ඇඟවීම් වලින් පුද්ගලයින් මිලියන 3.5 ක ආරක්ෂාව වැඩි කිරීම<br>• කැළණි ගංගා ද්‍රෝණියේ ගංවතුර සහ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සඳහා බහුකාර්ය ජල යටිතල පහසුකම් වලින් 1,800,000 ක ජනතාවකට ප්‍රතිලාභ සැලසීම. |
| **ප්‍රතිපාදන 2025 (රු.මි.)** | 9,032.00 | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 2,380.66 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 5,300.02 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 69.10 |
| **2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | නිරීක්ෂණ ජාලය වැඩිදියුණු කිරීම සඳහා<br>• **කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (DOM)** : නවීන පුරෝකථන පහසුකම් හා ප්‍රමාණවත් ඉදිරි කාලයක් සහිත නිවැරදි කාලගුණ අනාවැකි නිකුත් කිරීමේ ධාරිතාව වැඩි දියුණු කිරීමට අවශ්‍ය පරිදි DOM සේවා නවීකරණය කිරීම සඳහා මාර්ග සිතියමක් පිළියෙල කිරීමට බඳවා ගන්නා ලද ජාත්‍යන්තර උපදේශන ආයතනය මගින් තොරතුරු තාක්ෂණ (IT) යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම, උපකරණ සහ පද්ධති ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය පිරිවිතරයන් සහිතව මාර්ග සිතියම පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම පිළියෙල කිරීම. ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල 9 ක් අලුත්වැඩියා කිරීම සඳහාත් අනුරාධපුර, පොළොන්නරුව, මඩකලපුව, ත්‍රිකුණාමලය, ගාල්ල, රත්නපුර, හම්බන්තොට සහ මොනරාගල පිහිටි කාර්යාල සහ නිල නිවාස ප්‍රතිසංස්කරණය කිරීම සඳහාත් අවශ්‍ය මූලික කටයුතු සිදුකිරීම (ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු). | | |

- **වාරිමාර්ග දෙපාර්තමේන්තුව (ID):** ජල විද්‍යාත්මක අධීක්ෂණ පද්ධතිය තත්‍ය කාලීන (Real-time) වෙබ් පාදක අධීක්ෂණ පද්ධතියක් ලෙස වැඩිදියුණු කිරීමට සහ ඒකාබද්ධ කිරීම සඳහා ලබාදුන් උපදේශන සමාගම විසින් පද්ධතිය සංවර්ධනය කරමින් සිටී. ජලවිද්‍යාගාර සහ කාර්යාල පරිශ්‍ර ප්‍රතිසංස්කරණය කිරීමෙන් වැඩිදියුණු කරන ලද ජල විද්‍යාගාරයක්, රසායනාගාර උපකරණ, ICT උපකරණ, ARC GIS මෘදුකාංග, LIDAR ඩ්‍රෝන යානා 3 ක්, ගංවතුර හදිසි අනතුරු ඇඟවීම් ප්‍රදර්ශනය කිරීම සඳහා ස්ථාපනය කරන ලද ඩිජිටල් තිරයක්, උපදේශන සමාගමක් බඳවා ගෙන නව ජල විද්‍යාත්මක මධ්‍යස්ථාන (වැසි මාපක සහ ගංගා මාපක මධ්‍යස්ථාන) ස්ථාපනය කිරීමෙ ස්ථාන හඳුනා ගැනීම සිදුකර ඇත. තවද ප්‍රධාන ජල විද්‍යා මධ්‍යස්ථාන 19 ක් ප්‍රතිසංස්කරණය කර ඇත. ක්ෂේත්‍ර දත්ත රැස්කිරීම, ගබඩා කිරීම සහ සැකසීම සඳහා අධිතාක්ෂණික පරිගණක සහ කාර්යාල කාර්යයන් සඳහා පරිගණක සපයන ලදී. ගංගා ද්‍රෝණි 22 ක ගංවතුර ආකෘති සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය දත්ත සැපයීම සඳහා ප්‍රචාරය කරන ලද LiDAR සමීක්ෂණය සහ හරස්කඩ සමීක්ෂණය සඳහා උපදේශන සමාගමක් බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. ගංගා ද්‍රෝණි 22 ක් සඳහා ගංවතුර ආකෘති සංවර්ධනය කිරීම සඳහා උපදේශන සමාගමක් බඳවා ගැනීම, නව ස්ථානවල ගංගා ජල මාපක 100 ක් සහ ස්වයංක්‍රීය වැසි මාපක 100 ක් ස්ථාපනය කිරීම, තත් කාලීන ජලාශ ජල මට්ටම් නිරීක්ෂණය සඳහා මෙවලම් 40 ක් සැපයීම සහ ස්ථාපනය කිරීම, දත්ත මධ්‍යස්ථානයක් සැපයීම මගින් ගංවතුර හදිසි තත්ත්වයන් පුරෝකථනය කිරීම සඳහා මධ්‍යස්ථානයක් පිහිටුවීම, ඩිජිටල් සහ ගොඩනැගිලි සංවර්ධනය ඇතුළු තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැපයීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කිරීම.

- **ජලශක්ති රසායනාගාරය වැඩිදියුණු කිරීම:** හයිඩ්‍රොලික් රසායනාගාරය සහ කාර්යාලය ප්‍රතිසංස්කරණය, විදුලි පද්ධතිය සහ පාලක පැනලය ප්‍රතිස්ථාපනය කරන ලදී.

- **ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRO):** ඉහළ අවදානම් සහිත බිම්ස්ථාන 14ක ස්වයංක්‍රීය වැසි මිනුම් යන්ත්‍ර 150ක් ස්ථාපනය කිරීම සඳහා කොන්ත්‍රාත්තුවක් ලබාදී ඇත. භාවිතයට ගැනීමට නොහැකිව තිබූ වර්ෂා මාපක 330 ක් ස්වයංක්‍රීය වැසි මාපක මගින් ප්‍රතිස්ථාපනය කරන ලද අතර පද්ධතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වේ, ICT උපකරණ, ඩිජිටල් තිර සහ අධිතාක්ෂණික පරිගණක සැපයීම තුළින් ස්ථාපිත කරන ලද හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. සේවා වැඩිදියුණු කිරීම සඳහා සපයන ලද ඩෙස්ක්ටොප් සහ ලැප්ටොප් පරිගණක, රට තුළ වායු ගුණාත්මක සංවේදක ජාලයක් ස්ථාපිත කිරීම සඳහා මධ්‍යස්ථාන 100 ක් ස්ථාපනය සඳහා උපකරණ ලබාදීම සහ NBRO වෙත නායයෑම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීම සඳහා gINT, ZodST20, Arc GIS, MATLAB, SarProz, GMS ground water pro, Arc Hydro ground water, VR SIMLAB, Pix4d වැනි මෘදුකාංග සපයන ලදී.

| | |
|---|---|
| | • **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC)**: 5KV ජනක යන්ත්‍ර, ගලවා ගැනීමේ නල (rescue tube), GPS වාහන නිරීක්ෂණ පද්ධතිය, vanilla probe සහ PABX පද්ධතිය සහ හදිසි අනතුරු දැන්වීමේ මෙගා ෆෝන් 3330ක් ලබා දීම, ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල 25ක් නවීකරණය කිරීම සඳහා මාර්ග සිතියමක් සකස් කිරීමට උපදේශන සේවාවක් බඳවාගැනීම. ඒ අනුව උපදේශක සමාගම ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල 10ක් ප්‍රතිසංස්කරණය කිරීම, දිස්ත්‍රික් කාර්යාල 5ක නව ඉදිකිරීම් සහ ඇමතුම් මධ්‍යස්ථානය, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ පූර්ව අනතුරු ඇඟවීමේ ගුවන් විදුලි සන්නිවේදන පද්ධතිය සහ බහු උපද්‍රව අනතුරු ඇඟවීමේ කුළුණු වැඩිදියුණු කිරීම සඳහා සැලසුම්, ඇස්තමේන්තු සහ ටෙන්ඩර් ලේඛන සකස් කර ඇත; ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල 10ක් ප්‍රතිසංස්කරණය සහ දිස්ත්‍රික් කාර්යාල 5ක් අලුතින් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් බඳවා ගැනීම සඳහා ටෙන්ඩරය ප්‍රකාශයට පත් කර ඇත. තීරණ සහාය පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා උපදේශකයෙකු බඳවා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී (ID, NBRO සහ DOM මගින් ඒකාබද්ධ කරන ලද බහු-උපද්‍රව පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම).<br><br>• **ලවණතා බාධක ඉදිකිරීම්:** කැළණි ගඟ හරහා අඹතලේ ස්ථිර ලවණතා බාධකයක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු බඳවා ගැනීම සඳහා සැලසුම් සහ ටෙන්ඩර් ලේඛන අවසන් කිරීම සඳහා CRIP යටතේ සකස් කරන ලද මූලික සැලසුමක් සමාලෝචනය කර වැඩිදියුණු කිරීම සඳහා EGIS ඉංජිනේරු සහ සමුද්‍රීය සමාගමක් සැලසුම් සමාලෝචන සහ අධීක්ෂණ උපදේශක (DRSC) ලෙස බඳවා ගන්නා ලදී.<br>ඉදිකිරීම්වල මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ පිරිවැය-ඵලදායීතාවය වැඩිදියුණු කිරීම සඳහා පවතින සැලසුම වැඩිදියුණු කිරීමට අදාළව අමතර වැඩ විෂය පථයක් සඳහා යෝජනාවක් උපදේශන සමාගම විසින් ඉදිරිපත් කර ඇත.<br>මේ සම්බන්ධයෙන් TOR සමාලෝචනය කර නිර්දේශ කිරීම සඳහා පත් කරන ලද තාක්ෂණික සමාලෝචන කමිටුව (TRC) විසින් ලබා දී ඇති නිර්දේශ ද සැලකිල්ලට ගෙන විෂය පථය වෙනස්වීම සහ අතිරේක පිරිවැය පිළිබඳ තීරණයකට එළඹීමට නියමිතය.<br><br>• **වී ඔය ජලාශය සංවර්ධනය කිරීම:** පහළ කැළණි ද්‍රෝණියේ ගංවතුර පාලනය කිරීම සඳහා සහ වරාය නගරයට සහ කොළඹ අගනගරයට පානීය ජලය සැපයීම සඳහා වැසි සමයේදී වැසි ජලය ගබඩා කිරීම සඳහා යටියන්තොට වී ඔය ජලාශය සඳහා සවිස්තරාත්මක සැලසුමක් සකස් කිරීම සඳහා ඉරාන Mahab Ghodss බඳවාගන්නා ලදි.<br>තාක්ෂණික සමාලෝචන කමිටුව (TRC) විසින් ආරම්භක වාර්තාව පිළිගෙන ඇත. ජලාශ ඉදිකිරීම සඳහා වෙන් කර ඇති ප්‍රදේශයේ නායයෑමේ මුල් සලකුණු දැකිය හැකි බැවින්, නායයෑමේ අවදානම තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා නිර්දේශය ලබා ගැනීම සඳහා ගොඩනැගිලි පර්යේෂණ ආයතයට පැවරීමක් සිදු |

| | |
|---|---|
| | කර ඇත. ඒ අනුව, නායයෑමේ ව්‍යුහාත්මක විසඳුමක් සොයා ගැනීම සඳහා නායයෑමේ අවදානම සහ නායයෑමේ පරිමාව හඳුනා ගැනීම සඳහා නායයෑම් අවදානම පිළිබඳ අධ්‍යයනයක් සිදු කරමින් පවතී. එය සවිස්තරාත්මක සැලසුමේ ව්‍යුහාත්මක විසඳුම සැපයීම සඳහා යොදාගනු ලැබේ. සැලසුම සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය භූලක්ෂණාත්මක සමීක්ෂණය සහ භූ තාක්ෂණික සමීක්ෂණ සිදු කිරීම සඳහා උපදේශක සමාගමක් බඳවා ගෙන ඇත.<br>වී ඔය ජලාශය ඉදිකිරීමෙන් බලපෑමට ලක් වූ ප්‍රජාවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වේ. ඒ තුළින් සියලුම පාර්ශ්වකරුවන් ආවරණය වන පරිදි ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී මට්ටම්වල දැනුවත් කිරීමේ සහ උපදේශන රැස්වීම් මාලාවක් මෙම ව්‍යාපෘතිය විසින් පවත්වා ඇත. බලපෑමට ලක් වූ පවුල් 203 ක් පමණ සඳහා නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම සඳහා සහ සමාජ බලපෑම් තක්සේරු අධ්‍යයනයක් සිදු කිරීම සඳහා උපදේශන සමාගමක් බඳවා ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත. ඉදිකිරීම් හා සම්බන්ධ විය හැකි පාරිසරික බලපෑම් හඳුනා ගැනීම සඳහා පාරිසරික බලපෑම් තක්සේරුවක් (EIA) පැවැත්වීම සඳහා තවත් උපදේශකයෙකු බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| **2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)** | 9,150.00 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • දිස්ත්‍රික්ක 25 ක ක්‍රියාත්මක කරන ලද වාරිමාර්ග පුනරුත්ථාපන පැකේජවලින් සෘජුව සහ වක්‍රව ප්‍රතිලාභ ලැබූ පුද්ගලයින් 612,500 ක්<br>• ගංවතුර හා නියඟ අවදානමෙන් හෙක්ටයාර 31,230ක කුඹුරු ඉඩම් ආරක්ෂා කර ඇති අතර ප්‍රධාන, මධ්‍යම හා සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමවල කිලෝමීටර 141 ක ඇළ මාර්ග වැඩිදියුණු කර ඇත. |

**ව්‍යාපෘති අරමුණු ප්‍රතිඅරමුණුකරණය (Repurposing) යටතේ ක්‍රියාත්මක ප්‍රධාන, මධ්‍යම හා සුළු වාරිමාර්ග ව්‍යාපාර වල හදිසි හා අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතුවල ප්‍රගතිය - 2025**

| දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති | | | 2026 නව පැකේජ | වෙන්කිරීම (රු. මිලියන) | | | | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2024 | 2025 | එකතුව | | 2024 | 2025 | 2026 | එකතුව | භෞතික (%) | මූල්‍ය (රු.මිලි.) |
| 1. අම්පාර | 55 | 4 | **59** | **0** | 437.1 | 34.51 | - | **471.61** | 95.93 | 230.51 |
| 2. අනුරාධපුරය | 45 | 0 | **45** | **12** | 255.73 | 201.94 | 101.5 | **559.17** | 97.27 | 146.02 |
| 3. බදුල්ල | 43 | 25 | **68** | **3** | 149 | 95.79 | 29 | **273.79** | 93.45 | 124 |
| 4. මඩකලපුව | 25 | 14 | **39** | **14** | 276.2 | 73.65 | 100 | **449.85** | 100.00 | 233.49 |
| 5. කොළඹ | 46 | 0 | **46** | **2** | 136.42 | 41.58 | 75 | **253** | 95.22 | 78.57 |
| 6. ගම්පහ | 40 | 0 | **40** | **13** | 79.34 | - | 50 | **129.34** | 85.41 | 37.36 |
| 7. කළුතර | 24 | 0 | **24** | **4** | 69.04 | - | 50 | **119.04** | 86.67 | 26.43 |
| 8. රත්නපුර | 129 | 0 | **129** | **2** | 323.83 | - | 50 | **373.83** | 98.29 | 246.11 |
| 9. මහනුවර | 11 | 3 | **14** | **15** | 28.3 | - | 83.32 | **111.62** | 100 | 20.99 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 10. මාතලේ | 12 | 1 | **13** | **17** | 46.75 | - | 60 | **106.75** | 98.33 | 33.39 |
| 11. නුවරඑළිය | 7 | 0 | **7** | **9** | 33.97 | - | 40.64 | **74.61** | 100 | 25.83 |
| 12. කෑගල්ල | 24 | 0 | **24** | **10** | 36.03 | - | 29 | **65.03** | 100 | 27.79 |
| 13. කුරුණෑගල | 36 | 1 | **37** | **17** | 138.83 | 154.74 | 150 | **443.57** | 96.94 | 94.3 |
| 14. හම්බන්තොට | 48 | 3 | **51** | **16** | 306.48 | - | 150 | **456.48** | 99.90 | 231.63 |
| 15. මන්නාරම | 43 | 0 | **43** | **6** | 168.88 | - | 90 | **258.88** | 89.88 | 86.03 |
| 16. වවුනියාව | 30 | 10 | **40** | **2** | 136.06 | 61.33 | 20 | **217.39** | 100 | 98.65 |
| 17. කිළිනොච්චිය | 13 | 0 | **13** | **0** | 88.99 | - | - | **88.99** | 100 | 42.57 |
| 18. මුලතිව් | 7 | 0 | **7** | **0** | 68.09 | - | - | **68.09** | 82.86 | 15.16 |
| 19. යාපනය | 17 | 0 | **17** | **0** | 92.45 | - | - | **92.45** | 85.41 | 45.65 |
| 20. මොණරාගල | 89 | 11 | **100** | **15** | 499.39 | 83.23 | 87.5 | **670.12** | 98.97 | 321.99 |
| 21. පොළොන්නරුව | 138 | 6 | **144** | **14** | 760.4 | 60.06 | 125 | **945.46** | 95.50 | 560.21 |
| 22. පුත්තලම | 24 | 9 | **33** | **45** | 188.33 | 21.71 | 75 | **285.04** | 87.46 | 119.01 |
| 23. ත්‍රිකුණාමලය | 42 | 0 | **42** | **27** | 265.12 | - | 175 | **440.12** | 98.21 | 198.84 |
| 24. ගාල්ල | 48 | 0 | **48** | **13** | 205.77 | - | 47.6 | **253.37** | 92.23 | 120.26 |
| 25. මාතර | 39 | 0 | **39** | **16** | 195.62 | - | 78.65 | **274.27** | 100 | 136.38 |
| **එකතුව** | **1035** | **87** | **1122** | **272** | **4986.13** | **828.55** | **1,667.21** | **7,481.89** | **95.83** | **3301.15** |

## 5. ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල (රු.මි.)** | 20,308.70<br>ඇ.ඩො. 1 = රු. 290.00 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | සියලුම දිස්ත්‍රික්ක |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ලෝක බැංකුව සහ ශ්‍රී ලංකා රජය | **ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) - 229,010 |
| **ව්‍යාපෘති කාලය** | 2021 මැයි - 2027 ඔක්තෝම්බර් | **ප්‍රතිලාභීන්** | 1,469,293 |
| **ප්‍රතිපාදන 2025 (රු.මි.)** | 5,550.00 | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 1,749.47 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 7,950.74 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 81.87 |
| **2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | ඇළ මාර්ග සහ වේලි ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළුව වැඩ කොන්ත්‍රාත් පැකේජවල ප්‍රගතිය<br>• වාරිමාර්ග දෙපාර්තමේන්තුව - සමස්ථ වශයෙන් වැඩ කොන්ත්‍රාත් පැකේජ 20ක් ඉලක්ක කොටගෙන වැඩ කටයුතු නිම කෙරෙමින් පවතී.<br>• ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - සමස්ථ වශයෙන් වැඩ කොන්ත්‍රාත් පැකේජ 31ක් ඉලක්ක කොටගෙන වැඩ කටයුතු නිම කෙරෙමින් පවතී.<br>• උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව - සමස්ථ වශයෙන් වැඩ කොන්ත්‍රාත් පැකේජ 18ක් ඉලක්ක කොටගෙන වැඩ කටයුතු නිම කෙරෙමින් පවතී. | | |

| | |
|---|---|
| | • නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව- සමස්ථ වශයෙන් වැඩ කොන්ත්‍රාත් පැකේජ 16 ක් ඉලක්ක කොටගෙන වැඩ කටයුතු නිම කෙරෙමින් පවතී.<br>• උපදේශන සේවා - පැකේජ 26ක් ක්‍රියාත්මක වෙමින් පවතී. පැකේජ 6ක් සම්පූර්ණ කර ඇත.<br>• භාණ්ඩ - පැකේජ 19 සම්පූර්ණ කර ඇත<br>• ඇ.ඩො. මිලියන 10 ක ප්‍රතිඅරමුණුගත කිරීමේ ක්‍රියාකාරකම් (කුඩා හා මධ්‍යම වාරිමාර්ග යටිතල පහසුකම් පුනරුත්ථාපන කටයුතු) යටතේ වැඩ කොන්ත්‍රාත්තු ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් කළමනාකරණ කටයුතු (වැඩ පැකේජ 760) මේ වනවිට නිමකොට ඇත. |
| **2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | 5,100.00 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන වේලි 34 ක අවදානම් මට්ටම අඩු කරලීම.<br>• හෙක්ටයාර 91,831 ක වාරිමාර්ග භූමි ප්‍රමාණයකට වැඩි දියුණු කළ හෝ අළුතින්ම වාරිමාර්ග සේවා ලබා දීම.<br>• හෙක්ටයාර 35,000ක භූමි ප්‍රමාණයකට වඩාත් හොඳ තත්වයේ භූමි සංරක්ෂණ/දර්ශන ලබාදීම.<br>• ජාතික ජල සම්පත් ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාවට හඳුන්වා දීම.<br>• පුද්ගලයන් 1,100,000.00 දෙනෙකුට දේශගුණ විපර්යාස වලට ඔරොත්තු දෙන යටිතල පහසුකම් ඔස්සේ ප්‍රතිලාභ ලබා දීම. |

**ව්‍යාපෘති අරමුණු ප්‍රතිඅරමුණුකරණය (Repurposing) යටතේ ක්‍රියාත්මක ප්‍රධාන, මධ්‍යම හා සුළු වාරිමාර්ග ව්‍යාපාර වල හදිසි හා අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතුවල ප්‍රගතිය - 2025**

| අංක | දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති ගණන | 2025 ට අයත් ව්‍යාපෘති | සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය (රු. මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික (%) | මූල්‍ය (රු. මි.) |
| 1 | අම්පාර | 70 | 0 | 217.50 | 100 | 193.14 |
| 2 | අනුරාධපුරය | 51 | 0 | 145.00 | 100 | 132.02 |
| 3 | බදුල්ල | 28 | 1 | 107.11 | 98 | 74.02 |
| 4 | මඩකලපුව | 37 | 0 | 136.98 | 100 | 130.64 |
| 5 | කොළඹ | 13 | 0 | 40.31 | 100 | 8.43 |
| 6 | මාතර | 18 | 0 | 40.31 | 100 | 32.41 |
| 7 | ගාල්ල | 23 | 0 | 49.11 | 100 | 29.00 |
| 8 | ගම්පහ | 18 | 0 | 80.52 | 100 | 22.09 |
| 9 | හම්බන්තොට | 38 | 2 | 132.92 | 96 | 97.92 |

| අංක | දිස්ත්‍රික්කය | අනුමත ව්‍යාපෘති ගණන | 2025 ට අයත් ව්‍යාපෘති | සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණය (රු. මි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික (%) | මූල්‍ය (රු. මි.) |
| 10 | කළුතර | 8 | 0 | 80.52 | 100 | 12.83 |
| 11 | මහනුවර | 9 | 0 | 40.31 | 100 | 31.10 |
| 12 | කෑගල්ල | 4 | 0 | 46.69 | 100 | 12.42 |
| 13 | කුරුණෑගල | 21 | 0 | 76.56 | 100 | 58.46 |
| 14 | මන්නාරම | 26 | 2 | 120.83 | 96 | 95.27 |
| 15 | මාතලේ | 30 | 0 | 80.62 | 100 | 68.29 |
| 16 | මොණරාගල | 72 | 1 | 283.52 | 98 | 162.41 |
| 17 | නුවරඑළිය | 17 | 0 | 80.52 | 100 | 55.72 |
| 18 | පොළොන්නරුව | 88 | 0 | 320.55 | 100 | 270.10 |
| 19 | පුත්තලම | 13 | 0 | 40.31 | 100 | 35.37 |
| 20 | රත්නපුර | 54 | 1 | 112.04 | 98 | 160.53 |
| 21 | ත්‍රිකුණාමලය | 48 | 1 | 231.13 | 98 | 194.14 |
| 22 | වවුනියාව | 31 | 0 | 145.00 | 100 | 126.20 |
| 23 | කිලිනොච්චිය | 17 | 0 | 80.52 | 100 | 70.53 |
| 24 | මුලතිව් | 8 | 0 | 40.31 | 100 | 33.98 |
| 25 | යාපනය | 29 | 3 | 170.81 | 94 | 116.08 |
| මුළු ගණන | | **771** | **11** | **2,900.00** | | **2,223.09** |

## 6. ඒකාබද්ධ ජල කළමනාකරණ ප්‍රවේශයක් තුළින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කුඩා ඉඩම් හිමි ගොවීන්ගේ දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ ශක්තිය වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (වැව්ගම් පුබුදුව - CRIWMP)

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල (රු.මි.)** | 12,940.00<br>(ඇ. ඩො 1 = රු. 250)<br>ඇ.ඩො. මි. 52.08 | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | අනුරාධපුර, පොළොන්නරුව, කුරුණෑගල, පුත්තලම, වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | හරිත දේශගුණ අරමුදල / ශ්‍රී ලංකා රජය - සම මූල්‍ය දායකත්වය | **ජලාශ ධාරිතාව (ඝන මීටර මිලියන)/ වගා බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** | සූළු වාරි පද්ධති - 325<br>හෙක්ටයාර - 5,000 |
| වයාපෘති කාලය | 2017 ජූනි - 2025 දෙසැම්බර් | **ප්‍රතිලාභීන්** | 1,950,374 |
| **ප්‍රතිපාදන 2025 (රු.මි.)** | 1,200.00 | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | රු.මි 1,295.00<br>(වාරි මාර්ග අමාත්‍යාංශය - රු.මි 1,174)<br>(එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන - රු.මි 121) |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | රු.මි 12,660.00<br>(වාරි මාර්ග අමාත්‍යාංශය - රු.මි. 8,749)<br>(එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන - රු.මි. 3,911) | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 100 % |
| **2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ** වැඩසටහන | • පෙර වසරේ සංවර්ධන කටයුතු ආරම්භ කළ වැව් ද ඇතුළත්ව වැව් 42 ක උඩු ගං සංවර්ධනය නිම කිරීම<br>• ත්‍රිකුණාමලයේ කෘෂි තාක්ෂණ ගොවිපල සංවර්ධනය<br>• පාසල් වගා උද්‍යාන 7 ක්, වෙළඳපල ඉලක්ක කරගත් ගෙවතු 100 ක් සහ ආහාර සුරක්ෂිතතා ගෙවතු 1,300 ක් සංවර්ධනය කිරීම<br>• කලින් ලබා දුන් කොන්ත්‍රාත්තු සඳහා රෝපණ ද්‍රව්‍ය බෙදා හැරීම<br>• දිස්ත්‍රික්ක 7 ක යාය වැඩසටහන ක්‍රියාත්මක කිරීම<br>• කුඩා පෙරහන් පද්ධති සහිත පාසල්වල පෙරහන් නඩත්තුවට උපකාර වීමට වහල මත සූර්ය පද්ධති ස්ථාපනය කිරීම<br>• කුඩා පෙරහන් පද්ධති 20 ක් ස්ථාපනය කිරීම ක්‍රියාත්මක කිරීම | | |

| | |
|---|---|
| | • ගැඹුර මැනුම් 66 ක් සවි කිරීම<br>• දැනටමත් ප්‍රදානය කර ඇති කොන්ත්‍රාත්තු හා සම්බන්ධ ආපදා ප්‍රතිචාර සූදානම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.<br>• ගංගා ද්‍රෝණි තුනක ගංවතුර කළමනාකරණය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOPs) සකස් කිරීම<br>• පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල ප්‍රතිපල ඇගයීමක් (Impact assessment) සිදු කරන ලදී<br>• ව්‍යාපෘතියේ උගත් පාඩම් සහ ප්‍රතිපල ඉදිරිපත් කිරීම් සහිතව climate action symposium නිමා කිරීම<br>• අවසාන ඇගයීම සහ ව්‍යාපෘතිය අවසන් කිරීමේ වාර්තාව නිම කර ඇත. |
| **2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | ව්‍යාපෘතිය 2025 වසරේ නිමකර ඇත. |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • ග්‍රාමීය වාරිමාර්ග පද්ධති 325 ක් වැඩි දියුණු කිරීම සහ දේශගුණික සුහුරු කෘෂිකාර්මික පිළිවෙත් මඟින් මෙම සුළු වාරි පද්ධති වල ඇති හෙක්ටයාර 9,750 ක වගා තීව්‍රතාවය 0.8 සිට 1.6 දක්වා වැඩි කර මෙම ප්‍රදේශයේ ජනතාවගේ දේශගුණික විපර්යාසයන්ට අනුහුරු වීමේ හැකියාව නඟා සිටුවීම .<br>• ප්‍රතිලාභීන් 520,000 කට කෘෂි දේශගුණික උපදේශන ලබා දීම තුළින් දේශගුණික විපර්යාසයනට අනුහුරු වීමේ හැකියාව නඟා සිටුවීම.<br>• දේශගුණයට ඔරොත්තු දෙන, විමධ්‍යගත ජල කළමනාකරණ විසඳුම් වන ග්‍රාමීය ජල සම්පාදන ක්‍රම 07 ක් පිහිටුවීම, වැඩි දියුණු කළ ජල පිරිපහදු පද්ධති (විශාල පරිමාණ 70 ක් සහ කුඩා පරිමාණ 16 ක්) ස්ථාපනය සහ වැසි ජල රැස්කිරීමේ ටැංකි පද්ධති 4,000 ක් ස්ථාපනය, පානීය ජල කළමනාකරණ සැලසුම් සකස් කිරීම හරහා අවදානමට ලක්විය හැකි ප්‍රජාවට (පුද්ගලයන් 122,715 කට) වසර පුරා සුරක්ෂිත පානීය ජලය සැපයීම.<br>• ඵලදායි කාලගුණික තත්ත්ව අධීක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම, කෘෂි කාලගුණ උපදේශන, ජල කලමණාකරණ උපදේශන බෙදා හැරීම, පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති ශක්තිමත් කිරීම සහ ආපදා සඳහා ප්‍රතිචාර දැක්වීමේ හැකියාව වැඩිදියුණු කිරීම මගින් ගංවතුර සහ නියඟයේ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ (පුද්ගලයින් 450,000 ක්) ඒ සඳහා අනුවර්තනය වීමේ හැකියාව වැඩිදියුණු කිරීම. |

## 7. නකල්ස් කඳුවැටියේ අවදානමට ලක්ව ඇති ගංගා ද්‍රෝණි, දිය ඇළි ආශ්‍රිත ප්‍රදේශ සහ පහළ ජල පෝෂක ප්‍රදේශයේ වාසය කරන ගොවීන් සහ වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තුදීමේ ශක්තිය වැඩිදියුණු කිරීම (හරිත දේශගුණික අරමුදල)

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල (රු.මි.)** | 14,710.50<br>(GCF - GOSL : 8,800 +<br>GCF - ICRAF : 3,150 +<br>GOSL - CoFi : 2,760)<br>(ඇ.ඩො. 1 = රු.300) | **ප්‍රතිලාභ ලැබෙන දිස්ත්‍රික්ක** | මාතලේ, මහනුවර, අනුරාධපුර, කුරුණෑගල, පුත්තලම |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | හරිත දේශගුණික අරමුදල සහ ශ්‍රී ලංකා රජය | **ව්‍යාපෘති ප්‍රදේශය** | ඉහළ ජල පෝෂක ප්‍රදේශ - හෙක්ටයාර 166,254<br>පහළ ජල පෝෂක ප්‍රදේශ - හෙක්ටයාර 506,264<br>එකතුව - 672,518 |
| **ව්‍යාපෘති කාලය** | අවුරුදු 6<br>(2023 ජනවාරි - 2029) | **ප්‍රතිලාභීන්** | කාන්තා - 690,015<br>පිරිමි - 635,201<br>එකතුව - 1,343,216 |
| **ප්‍රතිපාදන 2025 (රු.මි.)** | 2,200.00 | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 494.00 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** | 1,030.00 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 19.35% |
| **2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • මාර්ග දෙපස ජලාපවහන පද්ධතියේ කිලෝමීටර 4 ක කොටසක් සංවර්ධනය කිරීම<br>• හෙක්ටයාර 411ක ඇළ දොළ, ගංගා ඉවුරු දෙපස ඉඩම් ආරක්ෂා කරන ලදී.<br>• ග්‍රාමීය වැව්, පොකුණු 13ක් සහ වාරි මාර්ග 19ක් ප්‍රතිසංස්කරණය කර ඇත.<br>• හෙක්ටයාර 296ක තණබිම්, වනාන්තර ඉඩම් සහ වාණිජ වැවිලි ඉඩම් ප්‍රතිස්ථාපනය කරන ලදී.<br>• පැල 2,960,000ක තවාන් නඩත්තු සිදු කරමින් ඇත.<br>• කිලෝමීටර 116ක වනන්තර මායිම සීමා සළකුණු කරන ලදී.<br>• නාම පුවරු 20ක් ස්ථාපිත කරන ලදී.<br>• ග්‍රාම නිලධාරි කොට්ඨාස 50ක් සඳහා ප්‍රජා සහභාගීත්ව ඉඩම් ප්‍රතිෂ්ඨාපන සැලැස්ම (PLRP) සහ ප්‍රජා මට්ටමේ නවෝත්පාදන වේදිකා (CLIP) සකස් කරන ලද අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 43ක ඉඩම් පරිහරණ සැලසුම් සත්‍යාපනය කරන ලදී.<br>• ඉහළ ජලාධාර ප්‍රදේශවල ඉඩම් හා ජල කළමනාකරණය සඳහා මූලධර්ම, නිර්ණායක සහ දර්ශක අදාළ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් සකස්කරන ලදී. | | |

| | |
|---|---|
| | • පාරිසරික සේවා සඳහා ගෙවීම් (PES) රාමුවක් සකස් කරන ලද අතර, ස්වේච්ඡා ව්‍යවසායක ආකෘතියක් සමඟ නියමු ස්ථානයක් හඳුනාගන්නා ලදී.<br>• SHARED පද්ධතිය ආරම්භ කිරීමට මූලික පියවර සම්පූර්ණ කරන ලදී.<br>• කෘෂි වන වගාව සඳහා අනුවර්තන හා සහභාගීත්ව පදනම් වූ සම-සැලසුම්කරණය (co-designing) පිළිබඳ පාර්ශවකරුවන් දැනුවත් කරන ලදී.<br>• තිරසර ඉඩම් කළමනාකරණය (SLM) සහ ඵලදායිතාවය ඉහළ නැංවීමට අදාළ පාලන යාන්ත්‍රණයක් වෙනුවෙන් වන යෝජනාවක් වැඩිදියුණු කරන ලදී.<br>• හරිත ව්‍යවසායන් 5ක් ස්ථාපිත කරන ලද අතර, ආයතනික ධාරිතාවය වැඩිදියුණු කරන ලදී.<br>• ඉහළ සහ පහළ ජලාධාර ප්‍රදේශවල කුඹුරු ඉඩම් හෙක්ටයාර 737.6ක වගා තීව්‍රතාවය ඉහළ නංවන ලදී.<br>• ගෙවතු හෙක්ටයාර් 186.94, උද්‍යාන බෝග හෙක්ටයාර් 30.5, කුළුබඩු බෝග වගා හෙක්ටයාර් 53.2, සහ සුළුපරිමාණ තේ වගා හෙක්ටයාර් 10 තුළ නිෂ්පාදන ක්‍රියාවලිය සහ තිරසරභාවය ශක්තිමත් කරන ලදී.<br>• තේ හෙක්ටයාර් 421, පොල් හෙක්ටයාර් 26, රබර් හෙක්ටයාර් 8, සහ දැව හෙක්ටයාර් 1 යන වැවිලි බිම් ප්‍රතිෂ්ඨාපනය සහ සංවර්ධන කටයුතු සිදු කරන ලදී.<br>• අනුවර්තන මාර්ගෝපදේශ සහ මෙවලම් සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදී.<br>• හරිත අගය දාම උසස් කිරීම සඳහා විකල්ප 7ක් ක්‍රියාත්මක කරන ලදී.<br>• සුළු පරිමාණ ගොවීන් සඳහා හරිත අගය දාමවල කාර්යක්ෂමතාවය සහ නව වෙළඳපොළවලට ප්‍රවේශය 26% ක් ලෙස වාර්තා විය.<br>• ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු නිලධාරීන් සමඟ ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද අතර ක්ෂේත්‍ර නිලධාරීන් 230 සඳහා මූලික පුහුණුව ලබා දෙන ලදී.<br>• පහළ ගංගා නිම්න ප්‍රදේශයේ හෙක්ටයාර 110ක කුඹුරු බිම් ඒකාබද්ධ කිරීමේ ක්‍රමය සිදුකරන ලදී.<br>• ගොවි පවුල් 159ක් සඳහා හරිත රැකියා අවස්ථා 50ක් නිර්මාණය කර ඇත.<br>• එක් ගංගා උප-ද්‍රෝණියක් ඇගයීම සිදු කරමින් පවතී.<br>• කාලගුණ මධ්‍යස්ථාන 25ක් පිහිටුවීමේ කටයුතු සිදුවෙමින් පවතී.<br>• තෝරාගත් ප්‍රමුඛතා ප්‍රදේශ 3ක් සඳහා සැලසුම් සහ පාලන ව්‍යුහයක් සකස් කරමින් පවතී. උප ගංඟා ද්‍රෝණි සඳහා පාලන ව්‍යුහයක් සකස් කර ඇත.<br>• ගංඟා උප ද්‍රෝණි 2ක් සඳහා විශ්ලේෂණ වාර්තා, උප ද්‍රෝණි 4ක් සඳහා පාර්ශවකරුවන් සිතියම් ගත කිරීම, උප ද්‍රෝණි 6ක් භූවමාරු විශ්ලේෂණ පිළිබඳ අතුරු වාර්තාව සහ ගංඟා උප ද්‍රෝණි 6ක පළමු ආකෘති කෙටුම්පත සූදානම් කිරීමේ කටයුතු සිදුකරමින් පවතී.<br>• අදාළ පාර්ශවකරුවන් සමඟ පුළුල් ජලවිද්‍යාත්මක අධ්‍යයනයක් සහ ආකෘතිකරණය ආරම්භ කරන ලදී. |

| | |
|---|---|
| **2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි.)** | 3,250.00 |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • දේශගුණයට ඔරොත්තු දෙන, විවිධාංගීකරණය වූ ජීවනෝපාය විකල්ප අනුගමනය කිරීමෙන් ප්‍රතිලාභ ලබන දළ වශයෙන් මිලියන 1.34 ක ජනතාවක් (කාන්තාවන් 51.4%);<br>• දේශගුණික විචල්‍යතා සහ වෙනස්වීම් වලට ප්‍රතිචාර වශයෙන් කඳුකර හා පහතරට කෘෂි පරිසර පද්ධති සහ ස්වභාවික පරිසර පද්ධති හෙක්ටයාර 672,518ක් ආරක්ෂා කර ශක්තිමත් කිරීම. |

# වාරිමාර්ග දෙපාර්තමේන්තුව

**දැක්ම**

"අහසින් වැටෙන එක දිය බිඳුවකුදු ලෝකෝපකාරයෙන් තොරව මුහුදට ගලා යා නොදෙනු" යන මහා පරාක්‍රමබාහු රජතුමාගේ පාඨය ගුරුතැන්හිලා, පරිසරයද සුරකිමින්, තිරසාර ආර්ථික හා සමාජ සංවර්ධනය සහතික කරනු සඳහා සෑම වැසි ජල බිඳුවක්ම පරිසර හිතකාමී ලෙස තිරසාර අයුරින් මිනිසාගේ යහපත සඳහා යොදා ගැනීමයි.

**මෙහෙවර**

කෘෂිකර්මයට සෘජුවමත්, පාරිසරික, ගෘහස්ත, කාර්මික හා විදුලිජනක අවශ්‍යතා සඳහා වක්‍රවත් අවශ්‍ය ජලය සැපයීම සඳහා සමාන්තර ආයතන සමඟ සහයෝගයෙන් රටේ සම්පත් භාවිතයට ගැනීම, සංවර්ධනය, සංරක්ෂණය, පාලනය, බෙදාහැරීම හා කළමනාකරණය මඟින් එම සම්පත් වලින් රටට උපරිම ප්‍රතිලාභයක් ලබාදීම.

**අරමුණු**

i. පාරිසරික තිරසාරත්වය සහතික කරමින් වාරි ජල සම්පාදිත කෘෂිකර්මය, ජල විදුලි නිෂ්පාදනය, ගංවතුර ආරක්ෂණය, ගෘහස්ත ප්‍රයෝජනය, කාර්මික ප්‍රයෝජනය, ජල ජීවී වගාව සංවර්ධනය උදෙසා භූමි සහ ජල සම්පත් සංවර්ධනය.

ii. වාරිමාර්ග හා ජල අපවහන ව්‍යාපෘතිවල ඇති වගා කළ හැකි ඉඩම් සඳහා උස්සාන වාරිමාර්ග පහසුකම් සැපයීම, ජල අපවහන පද්ධතීන් සැපයීම හා මුහුදු ජලය ගලා ඒම වැලැක්වීම.

iii. ගංවතුර අවදානම ඇති ප්‍රදේශවලට පානීය ජලය සඳහා පහසුකම් සැපයීම ගංවතුර ආරක්ෂණ හා ජල අපවහන පහසුකම් සැපයීම.

iv. ග්‍රාමීය ජනයාගේ ගොවි ආදායම් වැඩි කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම සහ ග්‍රාමීය ප්‍රදේශවල දිළිඳුකම තුරන් කිරීම.

v. තිරසාර කෘෂිකර්මාන්තය සහ වෙනත් භාවිතයන් සඳහා ජලය අරපිරිමැසුම්දායි ලෙස කළමනාකරණය කිරීම.

vi. විශාල, මධ්‍යම ප්‍රමාණයේ සහ අන්තර් පලාත් වාරිමාර්ග ව්‍යාපෘතීන් සඳහා ජලය සහ ඉඩම් සඳහා වූ ඵලදායීතා වර්ධනය.

vii. විශාල, මධ්‍යම ප්‍රමාණයේ සහ අන්තර් පලාත් වාරිමාර්ග පද්ධති සඳහා ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.

viii. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට පවරා ඇති ගංගා ද්‍රෝණිවල ඒකාබද්ධ ජලසම්පත් කළමනාකරණය සහ සහභාගීත්ව කළමනාකරණය.

**ප්‍රධාන කාර්යයන්**

i. පාරිසරික සාධක වලට ප්‍රමුඛතාවය දී ඉඩම් හා ජල සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම සඳහා ගංගා ද්‍රෝණි සංවර්ධනය සම්බන්ධයෙන් ප්‍රධාන සැලසුම් සකස් කිරීම.

ii. වාරිමාර්ග, ජල විදුලිය, ගංවතුර පාලනය සඳහා නව ව්‍යාපෘති සඳහා සවිස්තර සැලසුම් සකස් කිරීම.

iii. නව හා පවතින ගොවිතැන් කළ හැකි ඉඩම් වල අස්වැන්න වැඩි කිරීම සඳහා ගුරුත්ව හා උස්සාන වාරිමාර්ග ක්‍රම යටතේ ජල සංරක්ෂණය, හැරවීම හා බෙදා හැරීම සිදු කිරීම සඳහා නව ව්‍යාපෘති ඉදිකිරීම සහ ගොවීන් පදිංචි කිරීමේ ව්‍යාපෘති සැකසීම.

iv. ජලාපවහන, ගංවතුර පාලන සහ ලවණ දිය බැහැර කිරීම සඳහා ව්‍යාපෘති ඉදි කිරීම මඟින් එම බලපෑම් ඇති ඉඩම් වල ගොවිතැන් කිරීමේ කටයුතු කරගෙන යාමට ඉඩ සැලසීම.

v. ගංවතුරෙන් සිදුවන හානිය අවම කිරීම හෝ අවම කිරීම සඳහා ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ පහසුකම් සැපයීම.

vi. මධ්‍යම හා ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම, ජලාපවහන හා ගංවතුර ආරක්ෂණ යෝජනා ක්‍රම, ලවණ ජලය බැහැර කිරීමේ යෝජනා ක්‍රම, මෙහෙයුම්, නඩත්තු, වැඩිදියුණු කිරීම් සහ පුනරුත්ථාපන කටයුතු කිරිම මගින් ප්‍රශස්ථ ජල කළමනාකරණයක් ප්‍රතිලාභීන්ගේ සහභාගීත්වය ලබා ගනිමින් ඉටු කිරීම, අන්තර් අංශ භාවිතය, ගෘහස්ථ හා කාර්මික භාවිතය සහ පාරිසරික අවශ්‍යතා සඳහා ද ජලය සැපයීම වෙනුවෙන් වාරිමාර්ග ජලාශ ඉදිකිරීම සහ සංරක්ෂණය කර පවත්වා ගැනීම.

vii. කෘෂිකාර්මික හා ගෘහස්ත පරිභෝජනයේ තිරසාර ජල සැපයුම සඳහා වෙලි ඇතුළු ජල යටිතල පහසුකම් නඩත්තු කිරීම හා වැඩිදියුණු කිරීම.

viii. ජල සම්පත් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය කරන පර්යේෂණ, ජල ශක්ති, ජල විද්‍යා, ඉංජිනේරු ද්‍රව්‍ය, ඉංජිනේරු භූ විද්‍යා, භූ විද්‍යාත්මක තොරතුරු, ඉඩම් පරිහරණ යන අංශ වල සිදු කිරීම.

ix. මානව සම්පත් උපරිම ලෙස භාවිතා කිරීම සඳහා මානව සම්පත් සංවර්ධනය.

x. රජයේ මූල්‍ය රෙගුලාසි වලට අනුකූලව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ විගණන පද්ධතිය, ගිණුම් වාර්තා කිරීම, මූල්‍ය කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

xi. ජල සම්පත් වැඩි දියුණු කිරීම, භූ විද්‍යා අධ්‍යයනයන් සිදුකිරීම, පස් වැඩ වල සහ කොන්ක්‍රීට් වැඩ වල ගුණාත්මකභාවය පාලනය, ජල ශක්ති ආකෘති පරීක්ෂාවට ලක් කිරීම, ඉඩම් පරිහරණ සැලසුම් සැදීම සම්බන්ධව රාජ්‍ය දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා පොදු හා පෞද්ගලික ආයතන සඳහා උපදෙස් ලබාදීම.

xii. රටේ ආහාර සුරක්ෂිතතාවය වඩාත් තහවුරු කිරිම සඳහා වාරි ව්‍යාපාරයන්හි ඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන මහා වාරි හා මධ්‍ය වාරි ව්‍යාපාරයන්හි ඒකාබද්ධ හා සහභාගීත්ව වාරිමාර්ග කළමනාකරණ ක්‍රමවේද සංකල්පය මත ව්‍යාපාර කළමනාකාරණය සිදු කිරීම.

**වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් සිදුකරන මහා පරිමාණ සහ මධ්‍යම පරිමාණ වාරි ව්‍යාපෘති**

1. යාන් ඔය ව්‍යාපෘතිය
2. ඇල්ල වැව ජලාශ ව්‍යාපෘතිය
3. මුන්දෙනිආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රුගම් කිතුල් ජලාශය)
4. උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය
5. පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය
6. ඒරු වැව - මහකනදරාව පෝෂිත ඇළ ව්‍යාපෘතිය
7. ගල්ඔය, රාජාංගනය, හුරුළු වැව සහ මින්නේරිය ඇතුළු ප්‍රධාන වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම

01. යාන් ඔය ව්‍යාපෘතිය

<table>
<tr><td colspan="2">ඇස්තමේන්තුගත මුදල</td><td>රු.මි. 48,355.30</td><td>ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක</td><td>අනුරාධපුරය සහ ත්‍රිකුණාමලය</td></tr>
<tr><td colspan="2">මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය</td><td>ශ්‍රී ලංකා ජනරජය</td><td>ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය</td><td>ඝන මීටර මිලියන 169 නව ප්‍රදේශය හෙක්ටයාර 1,515 ඇතුළුව හෙක්ටයාර 8,700</td></tr>
<tr><td rowspan="2">ව්‍යාපෘති කාලය</td><td>මූලික ගිවිසුම් කාලය</td><td>2012 - 2019</td><td rowspan="2">ප්‍රතිලාභීන්</td><td rowspan="2">පවුල් 9,000 ක්</td></tr>
<tr><td>කාලය දීර්ඝ කිරීම</td><td>2019 - 2026</td></tr>
<tr><td colspan="2">2025 සඳහා ප්‍රතිපාදන</td><td>රු.මි. 2,350.00</td><td>2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය</td><td>රු. මි. 1,569.42</td></tr>
<tr><td colspan="2">සමුච්චිත මූල්‍ය ප්‍රගතිය</td><td>රු.මි. 43,525.89</td><td>සමස්ථ භෞතික ප්‍රගතිය (%)</td><td>98.75</td></tr>
<tr><td colspan="2">2025 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන</td><td colspan="3">• ඉස්සන්වැව නව වාරි ඉඩම් සංවර්ධනය කිරීම.<br>• ජයන්ති වැව පහළ නිම්න සංවර්ධනය කිරීම.<br>• දකුණු ඉවුර ඇළ යටතේ ජලය සපයනු ලබන ඇළ පද්ධතිය වැඩි දියුණු කිරීම.<br>• පුල්මුඩේ අමුණ සහ ඒ යටතේ ජලය සපයන ඇළ පද්ධතිය වැඩිදියුණු කිරීම.<br>• ජලාශය සහ වම් ඉවුරු ප්‍රධාන ඇළ ඉදිකිරීම සඳහා අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම.<br>• වාහල්කඩ කපුගොල්ලැව නව මාර්ගය ඉදිකිරීම.<br>• යටිතල පහසුකම් සංවර්ධනය සහ නැවත පදිංචි කිරීම.</td></tr>
<tr><td colspan="2">2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන</td><td colspan="3">රු.මි. 1,000.00</td></tr>
<tr><td colspan="2">2026 සඳහා යෝජිත වැඩසටහන්</td><td colspan="3">• ඉඩම් අත්පත් කර ගැනීම සහ නැවත පදිංචි කිරීම<br>• ප්‍රවේශ මාර්ග සහ පාලම් ඉදි කිරීම<br>• නව වාරි ඉඩම් සංවර්ධනය කිරීම (ඉස්සන් වැව ඇතුළුව)<br>• ජයන්ති වැව පහළ නිම්න සංවර්ධනය<br>• ත්‍රිකුණාමලයේ පවතින පද්ධති 07 ක් වැඩිදියුණු කිරීම<br>• පුල්මුඩේ අමුණ පද්ධතිය වැඩිදියුණු කිරීම<br>• නැවත පදිංචි කිරීමේ ස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය</td></tr>
</table>

| | |
|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • නව වගා බිම් හෙක්ටයාර 1,515 ක් ඇතුළුව සම්පූර්ණ හෙක්ටයාර 8,700ක් සඳහා වාරි පහසුකම් සැපයීම<br>• අනුරාධපුර සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක දෙකෙහිම ජනතාව සඳහා පානීය ජලය සැපයීම.<br>• මාර්ග සංවර්ධනය: කිලෝමීටර් 8 ක කාපට් මාර්ග, කිලෝමීටර 40 ක බොරළු මාර්ග<br>• ජලය, විදුලිය, පාසල්, පොදු ගොඩනැගිලි ආදිය සැපයීම ඇතුළුව මල්පෝරුව, කපුවත්ත, උරුව, ඕමාරකඩ සහ D6 වාහල්කඩ නැවත පදිංචි කිරීමේ ගම්මාන සංවර්ධනය කිරීම.<br>• කිලෝමීටර් 16 ක් දිගින් යුත් අලි වැටවල් ඉදි කිරීම.<br>• ගෝමරන්කඩවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පදවිය මහා වාරි යෝජනා ක්‍රමය, යාන්ඔය අමුණ යෝජනා ක්‍රමය සහ කුඩා/ මධ්‍යම පරිමාණ වැව්වල ජල හිඟය විසඳීම.<br>• මිරිදිය ධීවර හා පශු සම්පත් කර්මාන්තය සඳහා පහසුකම් සැලසීම.<br>• වාහල්කඩ සහ ත්‍රිකුණාමලය අතර ප්‍රවාහන දුර කිලෝමීටර 60 කින් පමණ අවම කිරීම. |

## 02. ඇල්ල වැව ජලාශ ව්‍යාපෘතිය

| | | | | |
|---|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල | | රු.මි. 2,950.00 | **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක** | රත්නපුර |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | ඝන මීටර මිලියන 1.91<br>දැනට පවතින ඉඩම් හෙක්ටයාර 456 සහ නව ඉඩම් හෙක්ටයාර 141.6 |
| ව්‍යාපෘති කාලය | **මූලික ගිවිසුම් කාලය** | 2021 - 2025 | **ප්‍රතිලාභීන්** | පවුල් 4,000 |
| | **කාලය දීර්ඝ කිරීම** | 2025 - 2026 | | |
| **2025 සඳහා ප්‍රතිපාදන** | | රු.මි. 910.00 | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු. මි. 326.31 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | | රු. මි. 801.31 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 51.10 |
| **2025 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | | • ප්‍රධාන බැම්මෙ ඉදිකිරීම් 46.06% ක් අවසන් කර ඇත.<br>• සොරොව්වේ වැඩ කටයුතු 74.90% කින් අවසන් කිරීම.<br>• 2 වන බැම්මෙ ඉදිකිරීම් 76.14% ක් අවසන් කර ඇත. | | |

| | |
|---|---|
| **2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | රු.මි. 1,000.00 |
| **2026 සඳහා යෝජිත වැඩසටහන්** | • ප්‍රධාන වේල්ල ඉදිකිරීම 90% ක් දක්වා අවසන් කිරීම.<br>• සොරොව්ව සහ පහළ පිටවාන ඉදිකිරීම් 95% ක් දක්වා අවසන් කිරීම.<br>• වේල්ල අංක 02 ඉදිකිරීම 100% ක් දක්වා අවසන් කිරීම.<br>• වේල්ල අංක 03 ඉදිකිරීම 100% ක් දක්වා අවසන් කිරීම.<br>• වාන් නිර්මිතය ඉදිකිරීම 96% ක් දක්වා අවසන් කිරීම.<br>• නැවත පදිංචි කිරීම, වන්දි ගෙවීම සහ යටිතල පහසුකම් සැපයීම.<br>• පහළ නිම්න සංවර්ධන කටයුතු සිදුකිරීම |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • කෘෂිකාර්මික හා ගෘහාශ්‍රිත කටයුතු සඳහා ජලය සැපයීමෙන් ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.<br>• වියළි කාලවලදී වාරි කෘෂිකර්මාන්තය සඳහා ජල සුරක්ෂිතතාව සහතික කිරීම.<br>• දැනට පවතින හුලංදාව සහ පනාමුර යෝජනා ක්‍රමයේ භෝග තීව්‍රතාවය වැඩි කිරීම සහ ජලය සැපයිය හැකි ප්‍රදේශය හෙක්ටයාර 141.6 කින් පුළුල් කිරීම.<br>• කොලොන්න ජල සම්පාදන යෝජනා ක්‍රමය සඳහා පානීය ජල ඉල්ලුම දිනකට ඝන මීටර 7,000 ක් සැපයීම.<br>• මිරිදිය ධීවර කර්මාන්තයට සහ පාරිසරික අවශ්‍යතාවලට දායකත්වය සැපයීම. |

## **03.** මුන්දෙණි ආරු ගංගා ද්‍රෝණි සංවර්ධන ව්‍යාපෘතිය (රුගම් කිතුල් ජලාශය)

| | | | | |
|---|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල** | | රු.මි. 24,140.60 | **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක** | අම්පාර, මඩකලපුව |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | | ශ්‍රී ලංකා ජනරජය සහ විදේශ ණය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | රුගම් කිතුල් - ඝන මීටර මිලියන 58<br>මහා ඔය - ඝන මීටර මිලියන 80<br>හෙක්ටයාර 6,500 |
| **ව්‍යාපෘති කාලය** | **මූලික ගිවිසුම් කාලය** | 2016 - 2021 | **ප්‍රතිලාභීන්** | පවුල් 50,000 |
| | **කාලය දීර්ඝ කිරීම** | 2021 - 2028 | | |
| **2025 සඳහා ප්‍රතිපාදන** | | රු.මි. 100.00 | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 2.50 |

| | | | |
|---|---|---|---|
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 386.65 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 2.39 |
| **2025 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අධීක්ෂණය සහ ඇගයීම | | |
| **2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | රු.මි. 50.00 | | |
| **2026 සඳහා යෝජිත වැඩසටහන්** | • ව්‍යාපෘති කළමනාකරණ ඒකක අධීක්ෂණය සහ ඇගයීම<br>• ඉංජිනේරු සැලසුම් සහ වැඩ අධීක්ෂණය සඳහා ජාත්‍යන්තර උපදේශන සේවාව | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • පවුල් 10,000 කට අයත් වගා කළ හැකි සහ වගා කටයුතු සිදු කරන ඉඩම් හෙක්ටයාර 10,500 කට පමණ වාරි පහසුකම් සපයා දීම.<br>• මඩකලපුව සහ අම්පාර දිස්ත්‍රික්කයේ පවුල් 31,000 කට පානීය ජලය සැපයීම.<br>• පහළ නිම්නයේ ගංවතුර පාලනය කිරීම.<br>• ජලාශ දෙකෙහිම මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය වසරකට මෙට්‍රික් ටොන් 800 කින් වැඩි කිරීම.<br>• කිලෝමීටර් 85 ක මාර්ග ජාලයක් ඉදිකිරීම.<br>• නැවත වන වගා වැඩසටහන.<br>• ආදායම් උත්පාදනය කිරීමේ වැඩසටහන් සහ පුහුණුව (කෘෂිකාර්මික හා පශු සම්පත් ව්‍යාප්තිය). | | |

## 04. උමා ඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල** | රු.මි. 22,017.00 | **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක** | මොණරාගල, හම්බන්තොට |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | අලිකොට ආර - ඝන මීටර මිලියන 6.5<br>කුඩා ඔය - ඝන මීටර මිලි. 22.6<br>හඳපානාගල - ඝන මීටර මිලි. 14<br>නව ඉඩම් හෙක්ටයාර 4,500 සහ පවතින ඉඩම් හෙක්ටයාර 1,500 |
| **ව්‍යාපෘති කාලය** | 2013 - 2026 | **ප්‍රතිලාභීන්** | පවුල් 5,700 |
| **2025 සඳහා ප්‍රතිපාදන** | රු.මි. 2,150.00 | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 989.64 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 18,678.64 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 88.53 |

| | |
|---|---|
| **2025 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • කුඩාඔය ජලාශය ඉදිකිරීම - 99.8%<br>• අලිකොට ආර - කුඩාඔය ඇළ ඉදිකිරීම - 85%<br>• කුඩාඔය - සිංහලයාගම ඇළ ඉදිකිරීම - 80 %<br>• ඉඩම් අත්පත් කර ගැනීම, නැවත පදිංචි කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ නැවත වන වගාව - 99% |
| **2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | රු.මි. 2,175.00 |
| **2026 සඳහා යෝජිත වැඩසටහන්** | • කුඩාඔය ජලාශය ඉදිකිරීම අවසන් කිරීම<br>• අලිකොටආර සිට කුඩාඔය හරස් ඇළ ඉදිකිරීම අවසන් කිරීම<br>• කුඩාඔය සිට සිංහලයාගම හරස් ඇළ ඉදිකිරීම අවසන් කිරීම<br>• ග්‍රාමීය වාරි පද්ධති සංවර්ධනය (සුළු වැව් 59)<br>• වැල්ලවාය සහ තණමල්විල ප්‍රදේශවල නව පෝෂිත ඇළ පද්ධතියක් ඉදිකිරීම. |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • උමා ඔය ද්‍රෝණියේ සිට කිරිදි ඔය ද්‍රෝණියට වාර්ෂිකව සැපයෙන ඝන මීටර මිලියන 145 ජලයෙන් වාරි පහසුකම් සැපයීම.<br>• නව ඉඩම් හෙක්ටයාර 4500 කට සහ දැනට පවතින ඉඩම් හෙක්ටයාර 1500 කට ජලය සැපයීම.<br>• මොනරාගල සහ හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා ඝන මීටර මිලියන 30 ක් පානීය හා කාර්මික ජලය සැපයීම.<br>• සත්ත්ව ගොවිපොළ සහ මිරිදිය ධීවර සංවර්ධනය<br>• නවීන තාක්ෂණයේ දැනුම හුවමාරු කිරීම<br>• කුඩා වැව් 59ක් වැඩි දියුණු කිරීම සහ වැව් 110 කට ජලය සැපයීම |

## 05. පහළ මල්වතු ඔය ජලාශ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත මුදල | රු.මි.47,180.00 | **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක** | වව්නියාව, මන්නාරම සහ අනුරාධපුරය |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | ඝන මීටර මිලියන 209<br>හෙක්ටයාර 12,416 (යල කන්නය)<br>හෙක්ටයාර 810 (දෙකන්නයම) |
| **ව්‍යාපෘති කාලය** – **මූලික ගිවිසුම් කාලය** | 2018 - 2022 | **ප්‍රතිලාභීන්** | අනුරාධපුර, මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්කවල ජීවත් වන ජනතාව |
| **ව්‍යාපෘති කාලය** – **කාලය දීර්ඝ කිරීම** | 2022 - 2030 | | |
| **2025 සඳහා ප්‍රතිපාදන** | රු.මි. 2,655.00 | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 312.72 |

<table>
<tr><td>සමුච්චිත මූල්‍ය ප්‍රගතිය</td><td>රු.මි. 2205.05</td><td>සමස්ථ භෞතික ප්‍රගතිය (%)</td><td>11.21</td></tr>
<tr><td>2025 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන</td><td colspan="3">• ජලාශ බැම්ම ඉදිකිරීම සහ අමතර වැඩ<br>• දකුණු ඉවුරෙහි සොරොව්ව ඉදිකිරීම<br>• නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය<br>• පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම<br>• ඉඩම් අත්පත් කර ගැනීම සහ  විපතට පත් ජනතාව සඳහා වන්දි ගෙවීමේ මූලික කටයුතු<br>• වාන් මාර්ගයේ වම් පස ඇති පාෂාණමය කොටස්  පුපුරවා  ඉවත් කිරීම</td></tr>
<tr><td>2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන</td><td colspan="3">රු.මි. 5,000.00</td></tr>
<tr><td>2026 සඳහා යෝජිත වැඩසටහන්</td><td colspan="3">• ජලාශ බැම්ම ඉදිකිරීම සහ ඉතිරි වැඩ<br>• අරීය ගේට්ටු සහිත පිටවාන ඉදිකිරිම හා වාන් මාර්ගයේ වම් පස ඇති පාෂාණමය කොටස්  ඉවත් කිරීම<br>• දකුණු ඉවුරෙහි සොරොව්ව ඉදිකිරීම<br>• නැවත පදිංචි කිරීමේ ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය<br>• පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම<br>• ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීමේ කටයුතු.</td></tr>
<tr><td>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ</td><td colspan="3">• නව වාරි ප්‍රදේශ හෙක්ටයාර 810 ක් (වී සහ අතුරු බෝග ) සඳහා වාරි පහසුකම් සැපයීම.<br>• පවතින වාරි ප්‍රදේශ හෙක්ටයාර 12,416 ක් (යෝධ වැව සහ අකතිමුරිප්පු වැව) සඳහා වාරි පහසුකම් සැපයීම.<br>• වවුනියාව, මන්නාරම සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල වාර්ෂික ගෘහස්ථ ජල ඉල්ලුම සපුරාලීම සඳහා ජලය ඝන මීටර මිලියන 21  සැපයීම.<br>• වාර්ෂිකව  ව්‍යාපෘතිය හරහා  ජනනය  කෙරෙන ගිගා වොට් පැය 4.68 ක විදුලිය  ජාතික විදුලිබල පද්ධතියට එක්  කිරීම.<br>• නව නගර සැලසුම් ව්‍යාපෘතිය යටතේ තන්තිරිමලේ නගරය සංවර්ධනය කිරීම.<br>• වවුනියාව සහ මන්නාරම දිස්ත්‍රික්කවල ගංවතුර අවම කිරීම.<br>• සූර්ය බලශක්ති ව්‍යාපෘති හඳුන්වා දීම<br>• ධීවර හා ජලජ සම්පත් සංවර්ධනය.<br>• අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩිදියුණු කිරීම<br>• විල්පත්තු ජාතික වන රක්ෂිතයේ නැවත වන වගාව සහ සංරක්ෂණය.</td></tr>
</table>

## 06. ඒරු වැව - මහකනදරාව පෝෂිත ඇළ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල** | රු.මි. 2,000.00 | **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක** | අනුරාධපුරය |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | මහකනදරාව (වාන එසවීමෙන් පසු) - ඝ.මී.මි 47.39, හෙක්ටයාර 1658<br>ඒරු වැව (වාන එසවීමෙන් පසු) - ඝ.මී.මි 7.57, හෙක්ටයාර 85 |
| **ව්‍යාපෘති කාලය** | 2024 - 2026 | **ප්‍රතිලාභීන්** | ගොවි පවුල් 5237 සහ පවුල් 20,000 ක් සඳහා පානීය ජල පහසුකම් සැපැයීම. |
| **2025 සඳහා ප්‍රතිපාදන** | රු.මි. 500.00 | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 400.33 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 776.12 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 89.17 |
| **2025 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • ඒරු වැව වැඩිදියුණු කිරීම - 98%<br>• ඒරු වැව සිට මුද්දිරිප්පුව වැව දක්වා පෝෂිත ඇළ වැඩිදියුණු කිරීම - 94%<br>• මුද්දිරිප්පුව වැවේ සිට මහනොච්චිකුලම දක්වා පෝෂිත ඇළ වැඩිදියුණු කිරීම - 98%<br>• මහනොච්චිකුලම වැවේ සිට කනදරා ඔය දක්වා පෝෂක ඇළ වැඩිදියුණු කිරීම- 98%<br>• මුද්දිරිප්පුව සහ මහනොච්චිකුලම වැව් වැඩිදියුණු කිරීම් - 91%<br>• මහකනදරාව මූලස්ථායී වැඩ වැඩිදියුණු කිරීම, මිනුම් කිරීම සහ විමර්ශන කටයුතු.- 91.2% | | |
| **2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | රු.මි. 500.00 | | |
| **2026 සඳහා යෝජිත වැඩසටහන්** | • ඒරු වැව වැඩිදියුණු කිරීම අවසන් කිරීම<br>• ඒරු වැව සිට මුද්දිරිප්පුව වැව දක්වා පෝෂිත ඇළ වැඩිදියුණු කිරීම අවසන් කිරීම<br>• මුද්දිරිප්පුව වැවේ සිට මහනොච්චිකුලම දක්වා පෝෂිත ඇළ වැඩිදියුණු කිරීම අවසන් කිරීම<br>• මහනොච්චිකුලම වැවේ සිට කනදරා ඔය දක්වා පෝෂක ඇළ වැඩිදියුණු කිරීම<br>• මුද්දිරිප්පුව සහ මහනොච්චිකුලම වැව් ඉතිරි වැඩ කොටස් අවසන් කිරීම<br>• මහනොච්චිකුලම සිට කනදරා ඔය දක්වා පෝෂිත ඇළ වැඩිදියුණු කිරීම<br>• මහකනදරාව මූලස්ථායී වැඩ සිදුකිරීම | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | • මහකනදරා ව්‍යාපාරයේ වගා තීව්‍රතාවය 1.6 සිට 2 දක්වා වැඩි කිරීම.<br>• පානීය ජල පහසුකම් සඳහා ජලය සැපයීම.<br>• ඒරුවැව සහ මහකනදරාව ධීවර කර්මාන්තය ඉහළ නැංවීම. | | |

## 07. ගල්ඔය, රාජාංගනය, හුරුළු වැව සහ මින්නේරිය ඇතුළු ප්‍රධාන වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම

| | | | |
|---|---|---|---|
| **ඇස්තමේන්තුගත මුදල** | රු.මි. 2,000.00 | **ප්‍රතිලාභ ලබන දිස්ත්‍රික්ක** | අම්පාර, අනුරාධපුර, පොළොන්නරුව |
| **මූල්‍ය පහසුකම් සැපයෙන ක්‍රමය** | ශ්‍රී ලංකා ජනරජය | **ජලාශ ධාරිතාව/ වගා භූමි ප්‍රමාණය** | හෙක්ටයාර 69,350.98 |
| **ව්‍යාපෘති කාලය** | 2025 (වසර 01) | **ප්‍රතිලාභීන්** | පවුල් 100,000 |
| **2025 සඳහා ප්‍රතිපාදන** | රු.මි. 2,000.00 | **2025 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 1514.15 |
| **සමුච්චිත මූල්‍ය ප්‍රගතිය** | රු.මි. 1514.15 | **සමස්ථ භෞතික ප්‍රගතිය (%)** | 96 |
| **2025 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන** | • ගල්ඔය ව්‍යාපාරයෙහි ගංවතුර හානිය ප්‍රතිසංස්කරණ<br>• රාජාංගනය ව්‍යාපාරයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු<br>• හුරුළුවැව ව්‍යාපාරයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු<br>• මින්නේරිය සහ ගිරිතලේ ව්‍යාපාරයෙහි ප්‍රතිසංස්කරණ කටයුතු | | |
| **2026 වර්ෂය සඳහා ප්‍රතිපාදන** | - | | |
| **2026 සඳහා යෝජිත වැඩසටහන්** | • ප්‍රතිසංස්කරණ වැඩවල ඉතිරි වැඩ - 4%<br>• පියවීමට ඇති අතැති බිල්පත් පියවීම | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තුළින් ලැබෙන සමස්ථ ප්‍රතිලාභ** | වාරි යෝජනා ක්‍රම තුළ ප්‍රශස්ත මට්ටමේ කාර්යක්ෂම ජලය බෙදා හැරීමක් සිදුකර ගැනීම. මෙමගින් බෝග තීව්‍රතාවය වැඩි කිරීම මෙන්ම වක්‍ර ප්‍රතිලාභ ලබන වන ජීවී පද්ධති හා ග්‍රාමීය ජන ජීවිතය නගා සිටුවීම. | | |

**01.** **ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය (හදිසි යටිතල පහසුකම් පුනරුත්ථාපන කටයුතු ද ඇතුළත්ව)**

| | කලාපය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන 2025 (රු. මිලි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| 1 | අම්පාර | 6 | 52.57 | 39.22 | 91 |
| 2 | අනුරාධපුර | 10 | 74.44 | 55.35 | 98 |
| 3 | බදුල්ල | - | - | - | - |
| 4 | මඩකලපුව | 13 | 154.80 | 151.24 | 62 |
| 5 | කොළඹ | 6 | 31.57 | 26.84 | 99 |
| 6 | ගාල්ල | 18 | 103.40 | 89.096 | 91 |
| 7 | හම්බන්තොට | 32 | 169.98 | 164.81 | 97 |
| 8 | නුවර | 2 | 20.14 | 18.44 | 98 |
| 9 | කුරුණෑගල | 3 | 3.94 | 3.05 | 99 |
| 10 | මන්නාරම | 4 | 14.81 | 13.72 | 100 |
| 11 | මොනරාගල | - | - | - | - |
| 12 | පොළොන්නරුව | 17 | 62.99 | 60.712 | 65 |
| 13 | පුත්තලම | 3 | 18.95 | 13.59 | 100 |
| 14 | ත්‍රිකුණාමලය | 22 | 192.76 | 186.83 | 93 |
| | **එකතුව** | **136** | **900.4** | **822.9** | |

**02.** **තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපාර වල අත්‍යාවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු**

| | කලාපය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන 2025 (රු. මිලි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| 1 | අම්පාර | 113 | 225.0 | 200.5 | 65 |
| 2 | අනුරාධපුර | 98 | 596.1 | 592.8 | 91 |
| 3 | බදුල්ල | 87 | 323.2 | 318.1 | 68 |
| 4 | මඩකලපුව | 60 | 400.3 | 400.3 | 98 |
| 5 | කොළඹ | 59 | 76.5 | 73.4 | 66 |
| 6 | ගාල්ල | 62 | 152.6 | 133.5 | 84 |
| 7 | හම්බන්තොට | 121 | 577.4 | 577.4 | 99 |
| 8 | නුවර | 60 | 169.4 | 163.6 | 93 |
| 9 | කුරුණෑගල | 103 | 191.5 | 185.8 | 53 |

| | කලාපය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන 2025 (රු. මිලි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| 10 | මන්නාරම | 40 | 201.3 | 187.5 | 74 |
| 11 | මොනරාගල | 74 | 200.6 | 182.4 | 83 |
| 12 | පොළොන්නරුව | 69 | 251.5 | 250.7 | 89 |
| 13 | පුත්තලම | 57 | 150.7 | 135.5 | 58 |
| 14 | ත්‍රිකුණාමලය | 70 | 411.2 | 410.5 | 99 |
| | **එකතුව** | **1,073** | **3,927.3** | **3,811.9** | |

### 03. ගංගා ද්‍රෝණි සංවර්ධනය හා කළමනාකරණය

| | කලාපය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන 2025 (රු. මිලි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| 1 | අම්පාර | 9 | 40.54 | 37.38 | 92 |
| 2 | අනුරාධපුරය | 4 | 16.84 | 13.92 | 83 |
| 3 | බදුල්ල | 8 | 2.98 | 2.65 | 89 |
| 4 | මඩකලපුව | 15 | 140.31 | 139.79 | 100 |
| 5 | කොළඹ | 10 | 14.57 | 11.11 | 76 |
| 6 | ගාල්ල | 35 | 81.58 | 80.64 | 99 |
| 7 | හම්බන්තොට | 18 | 165.61 | 161.19 | 97 |
| 8 | මහනුවර | 5 | 2.71 | 2.24 | 83 |
| 9 | කුරුණෑගල | 5 | 8.34 | 6.25 | 75 |
| 10 | ITI-ගල්ගමුව | 1 | 0.06 | 0.06 | 100 |
| 11 | මන්නාරම | 4 | 25.52 | 14.01 | 55 |
| 12 | මොනරාගල | 15 | 72.11 | 70.26 | 97 |
| 13 | පොලොන්නරුව | 8 | 25.10 | 20.13 | 80 |
| 14 | පුත්තලම | 7 | 99.25 | 85.11 | 86 |
| 15 | ත්‍රිකුණාමලය | 21 | 202.52 | 198.41 | 98 |
| 16 | RM ශාඛාව | 2 | 0.5 | 0.5 | 100 |
| 17 | ජල විද්‍යා ශාඛාව | 1 | 1.00 | 0.51 | 51 |
| | **එකතුව** | **168** | **899.54** | **844.16** | |

## 04. ගුරුත්ව වාරිමාර්ග කටයුතු

| | කලාපය | ව්‍යාපෘති සංඛ්‍යාව | ප්‍රතිපාදන 2025 (රු. මිලි.) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | | | මූල්‍ය (රු.මි.) | භෞතික (%) |
| 1 | අම්පාර | 18 | 239.41 | 238.77 | 100 |
| 2 | අනුරාධපුර | 100 | 215.26 | 215.26 | 100 |
| 3 | බදුල්ල | 19 | 78.00 | 77.84 | 100 |
| 4 | මඩකලපුව | 10 | 114.14 | 114.14 | 100 |
| 5 | කොළඹ | 28 | 53.50 | 53.16 | 100 |
| 6 | ගාල්ල | 15 | 70.05 | 68.98 | 100 |
| 7 | හම්බන්තොට | 24 | 162.65 | 162.65 | 100 |
| 8 | නුවර | 34 | 103.20 | 101.89 | 100 |
| 9 | කුරුණෑගල | 26 | 104.10 | 103.89 | 100 |
| 10 | මන්නාරම | 10 | 106.00 | 105.75 | 100 |
| 11 | මොනරාගල | 35 | 81.78 | 80.70 | 100 |
| 12 | පොළොන්නරුව | 12 | 176.00 | 175.87 | 100 |
| 13 | පුත්තලම | 14 | 66.90 | 66.20 | 100 |
| 14 | ත්‍රිකුණාමලය | 9 | 124.29 | 124.29 | 100 |
| | **එකතුව** | **354** | **1,695.3** | **1,689.4** | |

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

### දැක්ම

තිරසාර කෘෂිකර්මය, පුනර්ජනනීය බලශක්තිය, පරිසර සංරක්‍ෂණය සහ මහවැලි බල ප්‍රදේශවල පදිංචි පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවනු වස් භූමිය සහ ජලය ප්‍රශස්ත අයුරින් භාවිත කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ආයතනය බවට පත්වීම

### මෙහෙවර

මහවැලි ප්‍රජාව හා ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා පුනර්ජනනීය බලශක්ති උත්පාදනය, හරිත පරිසරය සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය දායක කර ගනිමින් නවීන තාක්ෂණය මත පදනම් වූ නවෝත්පාදක හා තිරසාර කෘෂිකාර්මික ඵලදායිතාවය උදෙසා භූමිය හා ජලසම්පත් ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම සඳහා මෙහෙයවීම

### අරමුණු

i. ජල ඵලදායිතාව, කාර්යක්ෂමතාව සහ ජල ගබඩා ධාරිතාව වැඩි කිරීම
ii. කාර්යක්ෂම ඉඩම් පරිපාලන හා කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම.
iii. සීමිත ඉඩම් සම්පත්වල ආර්ථික වටිනාකම සහ ප්‍රතිලාභ වැඩි දියුණු කිරීම සඳහා කාර්යක්ෂමව භාවිතා කිරීම ප්‍රශස්ත කිරීම.
iv. දේශගුණය, සමාජීය හා ආර්ථික අවදානම් තත්ත්වයන්ට අනුවර්තනය වන අතර 2029 වර්ෂයේදී මහවැලි කලාපයේ බෝග නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 60,000 කින් ඉහළ නැංවීම,
v. නව්‍ය පිළිවෙත් තුළින් උසස් තත්ත්වයේ පශු සම්පත් සහ මිරිදිය ධීවර නිෂ්පාදනය වැඩි දියුණු කිරීම.
vi. තිරසාර හා ලාභදායී ව්‍යාපාර ගොඩනැගීම සඳහා මහවැලි පදිංචිකරුවන් බලගැන්වීමට පහසුකම් සැලසීම.
vii. ආර්ථික සංවර්ධන මුලපිරීම් ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රජා බලගැන්වීම සහතික කිරීම
viii. ප්‍රවේශ විය හැකි අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා සහ සමාජ මුලපිරීම් ප්‍රවර්ධනය කිරීමෙන් ප්‍රජාවන් සවිබල ගැන්වීම
ix. ඵලදායී පාරිසරික හා ජල පෝෂක කළමනාකරණ ප්‍රවේශයන් හරහා 2030 වන විට ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශයෙන් 30% ක් (කිලෝමීටර් 900) සහ මහවැලි පහළ ගංගා නිම්න ප්‍රදේශවලින් 30% ක් (කිලෝමීටර් 1,500) සංරක්ෂණය කර කළමනාකරණය කිරීම.
x. ජලය, ඉඩම්, බලශක්තිය, භූමි සම්පත් සහ මහවැලි වත්කම් වලින් ලැබෙන ආදායම විවිධාංගීකරණය කිරීම.
xi. සම්පත් වෙන් කිරීම ප්‍රශස්ත කිරීම තුළින් මූල්‍ය කළමනාකරණය වැඩිදියුණු කිරීම.

xii. සංවිධානයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සියලුම සේවකයින්ගේ හැකියාවන් ශක්තිමත් කිරීමට සැලසුම් කිරීම.

xiii. ප්‍රශස්ත සම්පත් කළමනාකරණය තුළින් කාර්යක්ෂම පරිපාලන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

**ප්‍රධාන කාර්යයන්**

i. බලශක්ති බෙදාහැරීමට අදාළ කාර්යයන් හැරුණු විට විදුලි බලය ජනනය කිරීම සහ සැපයීම සඳහා ජලාශ, වාරිමාර්ග බෙදාහැරීමේ පද්ධති සහ ස්ථාපනයන් ඉදිකිරීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුළුව මහවැලි ගංගා සංවර්ධන වැඩසටහන සහ වලව ගංගා ද්‍රෝණි සංවර්ධන වැඩසටහන සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

ii. හඳුනාගත් විශේෂ ප්‍රදේශයේ පූර්ණ හා ඒකාබද්ධ සංවර්ධනය පෝෂණය කිරීම සහ සුරක්ෂිත කිරීම.

iii. හඳුනාගත් විශේෂ ක්ෂේත්‍රය තුළ කෘෂිකාර්මික ඵලදායිතාව සහ රැකියා විභවය ප්‍රශස්ත කිරීම සහ ආර්ථික හා කෘෂිකාර්මික සංවර්ධනය ජනනය කිරීම සහ සුරක්ෂිත කිරීම.

iv. හඳුනාගත් විශේෂ ප්‍රදේශය තුළ භෞතික පරිසරය සංරක්ෂණය කර පවත්වාගෙන යාම.

v. හඳුනාගත් විශේෂ ප්‍රදේශය තුළ ප්‍රජාවගේ පොදු සුභසාධනය සහ සංස්කෘතික ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීම සහ එම ප්‍රදේශයේ කටයුතු පරිපාලනය කිරීම.

vi. හඳුනාගත් විශේෂ ප්‍රදේශයක ආර්ථික හා කෘෂිකාර්මික සංවර්ධනය යන දෙකෙහිම පෞද්ගලික ප්‍රාග්ධනයේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සහ සුරක්ෂිත කිරීම.

vii. හඳුනාගත් විශේෂ ප්‍රදේශ සංවර්ධනය කිරීමේදී මහවැලි ගඟ සහ වලව සංවර්ධන වැඩසටහන සැලසුම් කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී රජයේ, පළාත් පාලන ආයතනවල සහ අනෙකුත් ආයතනවල සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීම සහ සුරක්ෂිත කිරීම.

## 1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ සිදුකරන සංවර්ධන කටයුතු

- **2025 වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන : රු. මිලි. 5,000.00**
- **මූල්‍ය ප්‍රගතිය : රු. මිලි. 4,506.59**
- **2026 වසර සඳහා ප්‍රතිපාදන : රු. මිලි. 8,500.00**

| | ප්‍රතිපාදන 2025 (රු. මිලි.) | 2025.12.31 දක්වා ලබාදුන් මුදල (රු.මි.) | 2025.12.31 දක්වා ප්‍රගතිය (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| මහවැලි කලාප (ප්‍රාග්ධන ප්‍රතිපාදන) | **3,600.00** | **3,278.41** | **3,279.48** | **91%** |
| ව්‍යාපෘති | **1,400.00** | **1,227.11** | **1,227.11** | **88%** |
| - කෘෂිකර්ම | 1,020.00 | - | 871.60 | 85% |
| - පශු සම්පත් | 380.00 | - | 355.51 | 94% |
| එකතුව | **5,000.00** | **4,505.52** | **4,506.59** | **90%** |

| # | ව්‍යාපෘතිය / වැඩසටහන | ප්‍රතිපාදන 2026 (රු. මිලි.) |
|---|---|---|
| **1** | **ආයතනික ප්‍රාග්ධනය** | **3,600.00** |
| **2** | **කෘෂිකර්ම හා පශුසම්පත් වැඩසටහන්** | **1,400.00** |
| **3** | **කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය** | **2,500.00** |
| **4** | **මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය** | **1,000.00** |
| | **එකතුව** | **8,500.00** |

**ආයතනික ප්‍රාග්ධනය අංශ අතර බෙදී ඇති ආකාරය**

| # | අංශය | ප්‍රතිපාදන 2026 (රු. මිලි.) |
|---|---|---|
| 1 | තාක්ෂණ සේවා අංශය | 1,139.50 |
| 2 | ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් | 410.00 |
| 3 | කෘෂිකර්ම | 342.99 |
| 4 | පශුසම්පත් | 200.00 |
| 5 | ආයතන සංවර්ධන | 550.00 |
| 6 | වන හා පරිසර | 203.00 |
| 7 | ඉඩම් | 113.00 |
| 8 | විදුලි හා යාන්ත්‍රික | 50.00 |
| 9 | පාලන | 141.50 |
| 10 | මහවැලි කේන්ද්‍රය | 34.50 |
| 11 | ව්‍යාපාර සංවර්ධන | 97.90 |
| 12 | පරිශ්‍ර කළමනාකරණ | 55.11 |
| 13 | ප්‍රවාහන | 119.50 |
| 14 | ගංගා ද්‍රෝණි කළමනාකරණ | 15.00 |
| 15 | මහවැලි ආරක්ෂක බලකාය | 28.00 |
| 17 | ඉඩම් පරිහරණ සැලසුම් | 100.00 |
| | **එකතුව** | **3,600.00** |

## 1.1 කෘෂිකර්මය, පශු සම්පත් සහ ධීවර කටයුතුවල ප්‍රගතිය

### 1.1.1 කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය (2025.12.31 දිනට)

| අනු අංක | ප්‍රධාන සංරචකය | ක්‍රියාත්මක කරන ලද කලාප | 2025 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික ) | ප්‍රගතිය (මෙ.ටො) | % | 2026 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික ) | ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කලාප |
|---|---|---|---|---|---|---|---|
| **1** | **කෘෂිකාර්මික නිෂ්පාදනය** | | | | | | |
| **1.1** | **බීජ - මහවැලි ගොවිපල** | | | | | | |
| | බීජ වී | බී,ජී,සී.එල්, උඩවලව | 2,561 | 548 | 21 | 2,738 | බී, ජී, සී, එල්, උඩවලව |
| **1.2** | **බීජ - ගොවීන්** | | | | | | |
| | බීජ වී | බී,ජී,සී.එල්, උඩවලව | 5,600 | 5,872 | 104 | 5,600 | බී, ජී, සී, එල්, උඩවලව, එච්, හුරුළුවැව |

| | | | | | |
|---|---|---|---|---|---|
| **1.3** | **ආහාර බෝග නිෂ්පාදනය** | | | | |
| **1.3.1** | **වී වගාව** | | | | |
| | **කලාපය** | **2025 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික)** | **ප්‍රගතිය (මෙ.ටො)** | **%** | **2026 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික)** |
| i. | බී | 225,255 | 232,151 | 103 | 229,714 |
| ii. | සී | 253,176 | 245,870 | 97 | 253,181 |
| iii. | ඩී | 13,578 | 19,591 | 144 | 13,218 |
| iv. | ඊ | - | - | - | 885 |
| v. | ජී | 57,118 | 69,849 | 122 | 57,118 |
| vi. | එච් | 201,985 | 245,026 | 121 | 201,985 |
| vii. | එල් | 16,124 | 18,966 | 118 | 14,813 |
| viii. | හුරුළු වැව | 77,703 | 95,126 | 122 | 77,702 |
| ix. | උඩවලව | 132,298 | 136,023 | 103 | 132,298 |
| x. | රඹකැන්ඔය | 10,730 | 16,501 | 154 | 11,339 |
| | **එකතුව** | **987,967** | **1,079,103** | **109** | **996,503** |

| 1.3.2 | ලොකු ළූණු | | | | |
|---|---|---|---|---|---|
| | කලාපය | **2025 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික)** | **ප්‍රගතිය (මෙ.ටො)** | **%** | **2026 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික)** |
| i. | බී | 100 | 0 | 0 | - |
| ii. | සී | 160 | 8 | 5 | - |
| iii. | ඩී | 100 | 4 | 4 | - |
| iv. | ඊ | 0 | 0 | 0 | - |
| v. | ජී | 4,060 | 2,984 | 49 | 1,000 |
| vi. | එච් | 10,400 | 2,792 | 27 | 70,000 |
| vii. | එල් | 240 | 20 | 8 | - |
| viii. | හුරුළු වැව | 16,000 | 6,434 | 40 | 9,000 |
| ix. | උඩවලව | 0 | 0 | 0 | - |
| x. | රඹකැන්ඔය | 40 | 0 | 0 | - |
| | **එකතුව** | **31,100** | **12,242** | **39** | **80,000** |

| 1.3.3 | බඩ ඉරිඟු | | | | |
|---|---|---|---|---|---|
| | කලාපය | **2025 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික)** | ප්‍රගතිය (මෙ.ටො) | **%** | **2026 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික)** |
| i. | බී | 9,280 | 9,215 | 99 | 8,000 |
| ii. | සී | 11,060 | 9,009 | 81 | 10,625 |
| iii. | ඩී | 1,180 | 197 | 17 | 1,180 |
| iv. | ඊ | 2,550 | 819 | 32 | 1,485 |
| v. | ජී | 7,320 | 3,543 | 48 | 4,630 |
| vi. | එච් | 1,000 | 495 | 50 | 900 |
| vii. | එල් | 5,300 | 3,493 | 66 | 3,325 |
| viii. | හුරුළු වැව | 2,850 | 2,323 | 82 | 1,320 |
| ix. | උඩවලව | 15,400 | 16,338 | 106 | 16,450 |
| x. | රඹකැන්ඔය | 1,175 | 870 | 74 | 750 |
| | **එකතුව** | **57,115** | **46,300** | **81** | **48,630** |

| 1.3.4 | මිරිස් | | | | |
|---|---|---|---|---|---|
| | කලාපය | 2025 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික) | ප්‍රගතිය (මෙ.ටො) | % | 2026 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික) |
| i. | බී | 8,000 | 551.7 | 6.9 | 1,845 |
| ii. | සී | 10,625 | 1,598.40 | 15.0 | 1,035 |
| iii. | ඩී | 1,180 | 225 | 19.1 | 225 |
| iv. | ඊ | 1,485 | 297.9 | 20.1 | 495 |
| v. | ජී | 4,630 | 1,737.90 | 37.5 | 1,962 |
| vi. | එච් | 900 | 603 | 67.0 | 810 |
| vii. | එල් | 3,325 | 945.5 | 28.4 | 1,215 |
| viii. | හුරුළු වැව | 1,320 | 1667.7 | 126.3 | 2,610 |
| ix. | උඩවලව | 16,450 | 214.2 | 1.3 | 180 |
| x. | රඹකැන්ඔය | 750 | 189 | 25.2 | 81 |
| | එකතුව | **48,630** | **8030.3** | **16.5** | **10,458** |

| 1.3.5 | වෙනත් ක්ෂේත්‍ර බෝග | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන සංරචකය | කලාපය | 2025 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික) | ප්‍රගතිය (මෙ.ටො) | % | 2026 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික) | යෝජිත කලාප |
| i. | සෝයා | - | 11833.5 | 937.71 | 8 | 9,545 | H1,H |
| ii. | මුං | සියළුම | 2652 | 887.25 | 33 | 2,164.50 | සියළුම කලාප |
| iii. | කව්පි | සියළුම | 1392.3 | 611.91 | 44 | 1,453 | සියළුම කලාප |
| iv. | රටකජු | සියළුම | 4375 | 2405.75 | 55 | 2,485 | |
| v. | උඳු | සියළුම | 3400.5 | 427.95 | 13 | 1,920 | |
| vi. | කුරක්කන් | සියළුම | 1816.8 | 636.72 | 35 | 1570 | |
| vii. | තල | සියළුම | 413.95 | 202.895 | 49 | 456 | |
| viii. | අල බෝග | සියළුම | 66540 | 30837.75 | 46 | 62700 | |

| 1.4 | පලතුරු | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන සංරචකය | කලාපය | 2025 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික) | ප්‍රගතිය (මෙ.ටො) | % | 2026 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික) | යෝජිත කලාප |
| i. | කෙසෙල්, ගස්ලබු, අඹ සහ සියළු බෝග | සියළුම | 227,235 | 186,890 | 82 | 239,235 | සියළුම කලාප |

| 1.5 | එළවළු | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | ප්‍රධාන සංරචකය | කලාපය | 2025 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික) | ප්‍රගතිය (මෙ.ටො) | % | 2026 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික) | යෝජිත කලාප |
| i. | සියලුම එළවළු | සියළුම | 146,317 | 105,486 | 72 | 318,360 | සියළුම කලාප |

**1.1.2 පශු සම්පත් නිෂ්පාදනයේ ප්‍රගතිය (2025.12.31 දිනට)**

| 1 | මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය | | | | |
|---|---|---|---|---|---|
| | කලාපය | 2025 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික) | ප්‍රගතිය (මෙ.ටො) | % | 2026 ඉලක්කය (මෙ.ටො) (වාර්ෂික) |
| i. | බී | 5,200 | 2,169 | 41.71 | 3,300 |
| ii. | සී | 2,350 | 1,247 | 53.06 | 1,200 |
| iii. | ඩී | 1,670 | 1,573 | 94.19 | 1,200 |
| iv. | ඊ | 1,600 | 660 | 41.25 | 1,000 |
| v. | ජී | 400 | 142 | 35.50 | 500 |
| vi. | එච් | 3,400 | 2,365 | 69.56 | 3,000 |
| vii. | එල් | 430 | 323 | 75.12 | 300 |
| viii. | හුරුළු වැව | 600 | 333 | 55.50 | 700 |
| ix. | උඩවලව | 2,250 | 1,484 | 65.96 | 1,500 |
| x. | රඹකැන්ඔය | 1,600 | 411 | 25.69 | 1,300 |
| | **එකතුව** | **19,500** | **10,707** | **54.91** | **14,000** |

| 2 | කිරි නිෂ්පාදනය | | | | |
|---|---|---|---|---|---|
| | කලාපය | 2025 ඉලක්ක (ලිටර් මිලියන) (වාර්ෂික) | ප්‍රගතිය (ලිටර් මිලියන) | % | 2026 ඉලක්ක (ලිටර් මිලියන) (වාර්ෂික) |
| i. | බී | 12 | 7.95 | 66 | 12 |
| ii. | සී | 11 | 13.46 | 122 | 13 |
| iii. | ඩී | 8 | 7.11 | 89 | 8 |
| iv. | ඊ | 2 | 1.03 | 51 | 2 |
| v. | ජී | 1 | 0.66 | 66 | 1 |
| vi. | එච් | 17 | 14.78 | 87 | 18 |

| 2 | කිරි නිෂ්පාදනය | | | | |
|---|---|---|---|---|---|
| | **කලාපය** | **2025 ඉලක්ක (ලිටර් මිලියන) (වාර්ෂික)** | **ප්‍රගතිය (ලිටර් මිලියන)** | **%** | **2026 ඉලක්ක (ලිටර් මිලියන) (වාර්ෂික)** |
| vii. | එල් | 2.5 | 3.09 | 123 | 3.5 |
| viii. | හුරුළු වැව | 7.5 | 5.69 | 76 | 7.5 |
| ix. | උඩවලව | 7 | 6.96 | 99 | 7 |
| x. | රඹකැන්ඔය | 7 | 4.57 | 65 | 8 |
| | **එකතුව** | **75** | **65.29** | **87** | **80** |

| 3 | බිත්තර නිෂ්පාදනය | | | | |
|---|---|---|---|---|---|
| | **කලාපය** | **2025 ඉලක්කය (මිලියන) (වාර්ෂික)** | **ප්‍රගතිය (මිලියන)** | **%** | **2026 ඉලක්කය (මිලියන) (වාර්ෂික)** |
| i. | බී | 28.0 | 21.61 | 77 | 25 |
| ii. | සී | 17.0 | 13.81 | 81 | 11 |
| iii. | ඩී | 11.0 | 10.85 | 99 | 11 |
| iv. | ඊ | 3.0 | 1.81 | 60 | 2 |
| v. | ජී | 3.0 | 2.54 | 85 | 3 |
| vi. | එච් | 15.0 | 12.49 | 83 | 13 |
| vii. | එල් | 3.5 | 2.62 | 75 | 3 |
| viii. | හුරුළු වැව | 7.0 | 4.42 | 63 | 5 |
| ix. | උඩවලව | 13.5 | 15.26 | 113 | 15 |
| x. | රඹකැන්ඔය | 14.0 | 11.12 | 79 | 12 |
| | **එකතුව** | **115.0** | **96.54** | **84** | **100** |

| **4** | විසිතුරු මසුන් වගාව | | | | |
|---|---|---|---|---|---|
| | කලාපය | **2025 ඉලක්කය (යුගල මිලියන) (වාර්ෂික)** | ප්‍රගතිය (යුගල මිලියන) | **%** | **2026 ඉලක්කය (යුගල මිලියන) (වාර්ෂික)** |
| i. | බී | 30 | 29.12 | 97 | 29 |
| ii. | සී | 2.5 | 1.24 | 50 | 2 |
| iii. | ඩී | 1.8 | 1.79 | 100 | 1.5 |
| iv. | ඊ | 0.8 | 0.13 | 16 | 0.5 |
| v. | ජී | 0.15 | 0.39 | 261 | 0.5 |

| 4 | විසිතුරු මසුන් වගාව | | | | |
|---|---|---|---|---|---|
| | කලාපය | 2025 ඉලක්කය (යුගල මිලියන) (වාර්ෂික) | ප්‍රගතිය (යුගල මිලියන) | % | 2026 ඉලක්කය (යුගල මිලියන) (වාර්ෂික) |
| vi. | එච් | 6 | 6.50 | 108 | 6 |
| vii. | එල් | 0.05 | 0.09 | 172 | 0 |
| viii. | හුරුළු වැව | 1.5 | 0.72 | 48 | 2 |
| ix. | උඩවලව | 1.0 | 0.52 | 52 | 1 |
| x. | රඹකැන්ඔය | 0.2 | 0.02 | 10 | 1 |
| | **එකතුව** | **44.0** | **40.51** | **92** | **43.5** |

### 1.1.3 පශු සම්පත් හා ධීවර අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම් වල ප්‍රගතිය (2025.12.31 දිනට)

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඒකකය | ක්‍රියාත්මක වූ කලාප | ඉලක්කය 2025 | ප්‍රගතිය 2025 | ඉලක්කය 2026 | යෝජිත කලාප |
|---|---|---|---|---|---|---|
| **1. කුඩා පරිමාණ කිරිගොවිපල සංවර්ධනය** | | | | | | |
| පට්ටි වස්සන් හඳුන්වා දීම (උපරිම වශයෙන් මහවැලි අධිකාරියේ දායකත්වය රු. 150,000.00) | සතුන් සංඛ්‍යාව | බී/ එල්/ උඩවලව | 11 | 10 | 53 | බී/ ඩී/ එච්/ එල්/ රඹකැන්ඔය/ උඩවලව |
| කිරිදෙනුන් හා වැස්සියන් හඳුන්වා දීම (උපරිම වශයෙන් මහවැලි අධිකාරියේ දායකත්වය රු. 150,000.00) | සතුන් සංඛ්‍යාව | බී/ සී/ ජී/ එල්/ එච්/ හුරුළු වැව/ රඹකැන්ඔය/ උඩවලව | 100 | 96 | 142 | සියළුම කලාප |
| ගව නිවාස හඳුන්වා දීම | ගව නිවාස සංඛ්‍යාව | සියළුම කලාප | 159 | 154 | 136 | සියළුම කලාප |
| දිළිඳුකම තුරන්කිරීමේ වැඩසටහන යටතේ නොමිලේ කිරිගවයින් ලබාදීම | සතුන් සංඛ්‍යාව | සී/ එච්/ එල්/ හුරුළු වැව | 82 | 96 | 27 | සී/ එච්/ එල්/ හුරුළු වැව |
| **2. විසිතුරු මත්ස්‍ය වගාව** | | | | | | |
| මඩ පොකුණු | පොකුණු | බී/ සී/ ඩී/ ඊ/ ජී/ එච්/ හුරුළු වැව/ උඩවලව | 40 | 38 | 62 | බී/ සී/ ඩී/ ඊ/ ජී/ එච්/ හුරුළු වැව/ උඩවලව |
| නිරෝධායන පොකුණු | පොකුණු | බී/ සී/ ඩී/ ඊ/ ජී/ එච්/ හුරුළු වැව | 46 | 37 | 21 | බී/ සී/ ජී/ එච්/ රඹකැන්ඔය |

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඒකකය | ක්‍රියාත්මක වූ කලාප | ඉලක්කය 2025 | ප්‍රගතිය 2025 | ඉලක්කය 2026 | යෝජිත කලාප |
|---|---|---|---|---|---|---|
| අභිජනන ගොවිපල සංවර්ධනය | ගොවීන් | බී | 10 | 10 | 5 | බී/ ඩී |
| **3. කුකුළු නිෂ්පාදන ප්‍රවර්ධනය** | | | | | | |
| **සුළු පරිමාණ ගොවීන් මධ්‍ය පරිමාණයට වැඩිදියුණු කිරීම** | | | | | | |
| කුකුළු නිවාස (අවම වශයෙන් වර්ග අඩි 150) | ගොවි පවුල් | බී/ සී/ ඩී/ ඊ/ ජී/ එල්/ හුරුළු වැව / රඹකැන්ඔය | 149 | 139 | 104 | බී/ සී/ ඩී/ ඊ/ ජී/ එල්/ හුරුළු වැව/ රඹකැන්ඔය |
| කුකුළු නිවාස (අවම වශයෙන් වර්ග අඩි 250) | ගොවි පවුල් | බී/ සී/ ඩී/ ඊ/ ජී/ එල්/ හුරුළු වැව / රඹකැන්ඔය/ උඩවලව | 98 | 94 | 75 | බී/ සී/ ඩී/ ඊ/ ජී/ එල්/ හුරුළු වැව / රඹකැන්ඔය/ උඩවලව |
| කුකුළු නිවාස (අවම වශයෙන් වර්ග අඩි 625) | ගොවි පවුල් | උඩවලව | 11 | 10 | 7 | උඩවලව |
| කුකුළු නිවාස (අවම වශයෙන් වර්ග අඩි 1250) | ගොවි පවුල් | උඩවලව | 4 | 4 | 9 | උඩවලව |
| කුකුළු නිවාස (අවම වශයෙන් වර්ග අඩි 1500) | ගොවි පවුල් | බී/ සී/ ඩී/ ජී/ එල්/ හුරුළු වැව | 19 | 19 | 12 | බී/ සී/ ඩී/ හුරුළු වැව |
| **බිත්තර කිකිළි පැටවුන් පැටවුන් බෙදා දීම** | | | | | | |
| දෙමුහුම් බිත්තර කිකිළි පැටවුන් (50% මහවැලි අධිකාරියේ දායකත්වය) | ගොවි පවුල් | සියළුම කලාප | 20,257 | 18,112 | 12,630 | සියළුම කලාප |
| ගම් කුකුළු පැටවුන් (50% මහවැලි අධිකාරියේ දායකත්වය) | බිත්තර කිකිළි පැටවුන් | සියළුම කලාප | 32,765 | 32,475 | 26,850 | සියළුම කලාප |
| **4. මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රවර්ධනය** | | | | | | |
| මත්ස්‍ය ඇඟිල්ලන් තැම්පත් කිරීම | මිලියන | බී/ ඩී/ ජී/ එල්/ ඊ/ එච්/ හුරුළු වැව/ රඹකැන්ඔය | 11.32 | 10.78 | 4.53 | බී/ සී/ ඩී/ ඊ/ එල්/ හුරුළු වැව/ රඹකැන්ඔය/ උඩවලව |
| මත්ස්‍ය ඇඟිල්ලන් නිෂ්පාදනය සඳහා දැල් කූඩු තුළ මත්ස්‍ය ඇසිත්තන් ගබඩා කිරීම - 100% ක මහවැලි අධිකාරියේ දායකත්වය. | මිලියන | බී/ සී/ ඩී/ ඊ/ එච්/ හුරුළු වැව/ රඹකැන්ඔය/ උඩවලව | 21.55 | 18.57 | 25.28 | බී/ සී/ ඩී/ ඊ/ ජී/ හුරුළු වැව/ රඹකැන්ඔය/ උඩවලව |

| ප්‍රධාන ක්‍රියාකාරකම | ඒකකය | ක්‍රියාත්මක වූ කලාප | ඉලක්කය 2025 | ප්‍රගතිය 2025 | ඉලක්කය 2026 | යෝජිත කලාප |
|---|---|---|---|---|---|---|
| ඉස්සන් පසු කීටයන් ගබඩා කිරීම - 100% ක සහ 50% ක මහවැලි අධිකාරියේ දායකත්වය. | මිලියන | බී/ සී/ ඊ/ එල්/ හුරුළු වැව / රඹකැන්ඔය/ උඩවලව | 12.98 | 9.28 | 7.5 | බී/ සී/ ඊ/ එල්/ උඩවලව |
| පාවෙන දැල් කූඩු සඳහා රාමු /දැල් සැපයීම (100% මහවැලි අධිකාරියේ දායකත්වය) | දැල් කූඩු | බී/ සී/ ඩී/ ඊ/ එච්/ හුරුළු වැව/ රඹකැන්ඔය/ උඩවලව | 207 | 207 | 24 | සී/ ජී/ එච් |

## 1.2 ආයතන සංවර්ධන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ප්‍රගතිය (2025.12.31 දිනට)

| විස්තරය | මූල්‍ය ප්‍රගතිය | | | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කය (රු. මිලි.) | ප්‍රගතිය (රු. මිලි.) | % | ඉලක්කය (වැඩසටහන්) | ප්‍රගතිය (වැඩසටහන්) | % |
| "ගොවි බිමට පුනරුදය" වැඩසටහනට සමගාමීව ගොවි සංවිධාන නවීකරණය තුළින් ජාතික නිෂ්පාදනයට දායක වීම | 69.90 | 66.74 | 95% | 7,533 | 7,501 | 99% |
| "ගෞරවණීය ජීවිතයක් - සුරක්ෂිත රටක්" වැඩසටහන යටතේ මහවැලි ප්‍රජාවගේ ආර්ථික සමාජීය හා සෞඛ්‍ය සුරක්ෂිත කිරීමේ වැඩසටහන් | 152.77 | 141.76 | 93% | 598 | 608 | 100% |
| "දිළිඳුබව පිටුදැකීමේ ජාතික වැඩසටහනට සමගාමීව " රැකියා ඉලක්ක ගත පුහුණු වැඩසටහන් තුළින් මහවැලි කලාප තුළ රැකියා වියුක්තිය අවම කිරීම. | 23.88 | 22.18 | 93% | 184 | 140 | 76% |
| ගෘහ ආර්ථිකය ප්‍රවර්ධයන තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කාන්තාව දායක කරගැනීමේ වැඩසටහන් | 5.23 | 5.27 | 100% | 139 | 138 | 99% |

| විස්තරය | මූල්‍ය ප්‍රගතිය | | | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | ඉලක්කය (රු. මිලි.) | ප්‍රගතිය (රු. මිලි.) | % | ඉලක්කය (වැඩසටහන්) | ප්‍රගතිය (වැඩසටහන්) | % |
| මහවැලි කලාපවල ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙන ඒම | 62.97 | 59.29 | 94% | 315 | 317 | 100% |
| මනම්පිටිය, අරලගංවිල හා ශාලිකා ශාලා හා සංවර්ධන මධ්‍යස්ථානය නඩත්තු කටයුතු (බී හා සී කලාප) මහවැලි පුස්තකාලක සංවර්ධන කටයුතු (ඊ කලාපය) | 21.45 | 18.50 | 86% | 17 | 9 | 53% |
| **එකතුව** | **336.19** | **313.74** | **93%** | **8,777** | **8,713** | **99%** |

### 1.3 ඉඩම් ලබා දීම

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ප්‍රදාන නිකුත් කිරීමේ ප්‍රගතිය

| | කලාප | 2025 ඉලක්කය | 2025.12.31 දිනට ප්‍රගතිය | 2026 ඉලක්කය |
|---|---|---|---|---|
| i. | බී | 4,500 | 1,311 | 4,000 |
| ii. | සී | 4,500 | 3,171 | 3,000 |
| iii. | ඩී | 1,000 | 216 | 1,400 |
| iv. | ඊ | 500 | 637 | 600 |
| v. | ජී | 2,000 | 680 | 5,000 |
| vi. | එච් | 4,000 | 500 | 2,000 |
| vii. | එල් | 2,000 | 319 | 4,000 |
| viii. | හුරුළු වැව | 500 | 608 | 2,400 |
| ix. | උඩවලව | 4,500 | 4,500 | 1,600 |
| x. | රඹකැන්ඔය | 1,500 | 595 | 1,000 |
| | **එකතුව** | **25,000** | **1,311** | **25,000** |

## 1.4 පරිසර සංරක්ෂණය

පරිසර සංරක්ෂණ වැඩසටහනේ ප්‍රගතිය (2025.12.31 දිනට)

| ප්‍රධාන ක්‍රියාකාරකම | මූල්‍ය ඉලක්කය | මූල්‍ය ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| 01. වන වැස්ම වැඩි කිරීම<br>පැළ නිෂ්පාදනය | 5.12 | 4.70 | 92% | පැළ 84,200 | පැළ 74,889 | 89% |
| පැළ සිටුවීමේ වැඩසටහන | 9.58 | 8.43 | 88% | පැළ 96,000 | පැළ 62,624 | 65% |
| 02. මහවැලි පවිත්‍ර ගංගා වැඩසටහන ජල තත්ත්ව මිනුම් වැඩසටහන | 2.91 | 2.91 | 100% | ස්ථාන 25 | කොත්මලා ඔය , පොල්ගොල්ල ජලාධාර 02 හි ස්ථාන 25ක ජල තත්ත්ව මිණුම් මසකට වරක් සිදුකර ඇත. | 100% |
| කසල කළමනාකරණය සඳහා වැට ඉදිකිරීම | 29.0 | 22.29 | 77% | මීටර් 2,500 | මීටර 2,252. (කොත්මලා ඔය, කණ්ඩලම, කලාවැව, බෝවතැන්න ජලාශය) | 90% |
| ආක්‍රමණශීලි ජීවි ව්‍යාප්තිය මර්ධනය/ පාලනය | 6.50 | 4.44 | 68% | හෙක්.14<br>වැව් 42 | කොත්මලාඔය ජලාශ රක්ෂිතය - හෙක් 14 වැව් 42 (බී -37, ඩී-5, ජී-1, එල්-1) | 100% |
| 03. අලි මිනිස් ගැටුම පාලනය<br><br>විදුලි වැට ඉදි කිරීම<br><br>විදුලි වැට නඩත්තුව | 71.50 | 64.58 | 90% | කි.මී. 40.352<br>කි.මී 51 | විදුලි වැට ඉදි කිරීම - කි.මී. 37.65 (බී-19, සී -6, එච්-0.352 , එල් - 11, රඹකැන්ඔය-1.3)<br>විදුලි වැට නඩත්තුව - කි.මී 46 (සී-15, ඩී-5, ජී-5, එච්-10, හුරුළුවැව-1, රඹකැන්-10) | 93%<br><br>90% |
| 04. පරිසර අධ්‍යාපන, පුහුණු හා ප්‍රවර්ධන | 7.48 | 6.72 | 90% | වැඩසටහන් 90 | වැඩසටහන් 95 (විශේෂ පරිසර දින හා පුහුණු වැඩසටහන්) | 100% |

| ප්‍රධාන ක්‍රියාකාරකම | මූල්‍ය ඉලක්කය | මූල්‍ය ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය % | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|---|
| 05. පටකරෝපණ තාක්ෂණය මගින් පැළ නිෂ්පාදනය | 4.0 | 4.03 | 100% | පැළ 300,000 | පැළ 85,000 | 28.3% |
| 06. පාරිසරික බලපෑම් ඇගයීම් | 5.35 | 1.61 | 30 | ව්‍යාපෘති 4 | ව්‍යාපෘති 4 (කන්දකාඩුව, මුතුවැල්ල (කෘෂි) පොල්ලෙ බැද්ද (පශු සම්පත්) ට අදාල ගෙවීම් | 80% |

**1.5 ව්‍යාපාර සංවර්ධන අංශය**

| ක්‍රියාකාරකම් | වෙන්කිරීම් (රු. මිලි.) | ඒකකය | ඉලක්කය / ප්‍රගතිය | 2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය | 2025.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| දෙවන සහ තුන්වන පරම්පරාවේ ව්‍යවසායකයින්ට පහසුකම් සැලසීම | 24.56 | ව්‍යවසායකයින් | ඉලක්කය | 24.56 | 467 |
| | | | ප්‍රගතිය | 23.74 | 359 |
| ව්‍යවසායක දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම | 5.92 | වැඩසටහන | ඉලක්කය | 5.92 | 77 |
| | | | ප්‍රගතිය | 5.24 | 62 |
| අලෙවිකරණ වැඩසටහන් | 2.64 | වැඩසටහන | ඉලක්කය | 2.64 | 17 |
| | | | ප්‍රගතිය | 2.42 | 13 |
| සංචාරක කර්මාන්තය වර්ධනය කිරීමේ වැඩසටහන් | 18.44 | වැඩසටහන | ඉලක්කය | 18.44 | 105 |
| | | | ප්‍රගතිය | 16.68 | 54 |
| ආදායම් උත්පාදනය | 1.19 | වැඩසටහන | ඉලක්කය | 1.19 | 15 |
| | | | ප්‍රගතිය | 1.12 | 0 |
| කළමනාකරණ වියදම් | 1.10 | වැඩසටහන | ඉලක්කය | 1.10 | 33 |
| | | | ප්‍රගතිය | 1.11 | 30 |
| **එකතුව** | **65.85** | වැඩසටහන | **ඉලක්කය** | **65.65** | **714** |
| | | | **ප්‍රගතිය** | **57.80** | **518** |

- **2026 සඳහා ඉදිරි සැලසුම්**

**01. කිවුල් ඔය සංවර්ධන ව්‍යාපෘතිය - ප්‍රධාන ක්‍රියාකාරකම්**

| අනු අංකය | ක්‍රියාකාරකම | 2026 වෙන්කිරීම් (රු. මිලි.) |
|---|---|---|
| 01 | සමීක්ෂණ සහ සවිස්තරාත්මක ඉංජිනේරු නිර්මාණය<br>(භූ ලක්ෂණ සමීක්ෂණ සහ පාලන ලක්ෂ්‍යය ස්ථාපිත කිරීම, අවසාන DED සකස් කිරීම) | 25.00 |
| 02 | ව්‍යාපෘති කාර්ය මණ්ඩල පහසුකම් සහ උපකරණ<br>(කාර්තු, වැඩබිම් කාර්යාල, උපයෝගිතා, සනීපාරක්ෂාව සහ බල සැපයුම. පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, සන්නිවේදන පද්ධති, ඉංජිනේරු මෘදුකාංග, ගෘහ භාණ්ඩ ආදිය ප්‍රසම්පාදනය කිරීම.) | 200.00 |
| 03 | නැවත පදිංචි කිරීම සහ සමාජ ආරක්ෂණ ක්‍රම<br>(සමාජ-ආර්ථික සමීක්ෂණ, නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම (RAP) සකස් කිරීම, ඉඩම් තක්සේරු කිරීම, වන්දි තක්සේරු කිරීම, පාර්ශවකරුවන්ගේ උපදේශන, දුක්ගැනවිලි විසඳීමේ යාන්ත්‍රණය සැකසීම, ඉඩම් අත්පත් කර ගැනීම, වන්දි ගෙවීම්, නැවත පදිංචි කිරීම.) | 15.00 |
| 04 | ග්‍රාමීය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම<br>(ගොඩනැගිලි සහ මුල් ගමේ මාර්ග/ ජලපවාහන/ විදුලිය/ ජලය, වැඩිදියුණු කිරීම් සපයන සේවා.) | 100.00 |
| 05 | මාර්ග ඉදිකිරීම / ප්‍රතිසංස්කරණය<br>(ප්‍රමුඛතා මාර්ගවල තාර දැමීම සහ පාලම් සකස් කිරීම (~20 km) | 600.00 |
| 06 | වේල්ල ඉදිකිරීම - අදියර 01<br>(බැම්ම දිගේ කැලෑ එළිපෙහෙළි කිරීම, හර අගල් කැණීම) | 85.00 |
| 07 | වේල්ල ඉදිකිරීම - අදියර 02<br>(අත්තිවාරම බදාම කැවීම (Foundation Grouting) සහ කාන්දුවීම් වැළැක්වීමේ පියවර) | 675.00 |
| 08 | වේල්ල ඉදිකිරීම - අදියර 03<br>(මැටි හර අගල් ඉදිකිරීම) | 650.00 |
| 09 | වාන් ඉදිකිරීම | 50.00 |
| 10 | සොරොව්ව ඉදිකිරීම | 20.00 |
| 11 | ජෛව විවිධත්ව කළමනාකරණ සැලැස්ම සහ පාරිසරික කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම | 25.00 |
| 12 | පුරාවිද්‍යාත්මක බලපෑම් තක්සේරුව ක්‍රියාත්මක කිරීම | 25.00 |
| 13 | කසල / රොන්මඩ උගුල්<br>(ඉහළට ගලා යන ජලාශ වල settling basins ඉදිකිරීම) | 5.00 |
| 14 | පරිපාලන වියදම් | 25.00 |
| **එකතුව** | | **2,500.00** |

**02. මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය - ප්‍රධාන ක්‍රියාකාරකම්**

| අනු අංකය | ක්‍රියාකාරකම | 2026 වෙන්කිරීම් (රු. මිලි.) |
|---|---|---|
| 01 | කිලෝමීටර 0+500 සිට NDK ඇතුල්වීමේ ව්‍යුහය දක්වා ප්‍රධාන ඇළේ හානියට පත් කොටස් අලුත්වැඩියා කිරීම. | 100.00 |
| 02 | NDK පිටවන ව්‍යුහය ගේට්ටු පද්ධතිය අලුත්වැඩියා කිරීම, සැපයුම් සහ කොමිස් කිරීම ඇතුළුව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම. | 100.00 |
| 03 | කිලෝමීටර් 6+500 සිට 9+173 දක්වා ප්‍රධාන ඇළ ඉදිකිරීම | 420.00 |
| 04 | කීනානි දුම්රිය හරස් මාර්ගයේ ඇතුල්වීමේ ව්‍යුහය ඉදිකිරීම | 150.00 |
| 05 | කීනානි දුම්රිය හරස් මාර්ගයේ බැම්ම ඉදිකිරීම | 100.00 |
| 06 | කීනානි දුම්රිය හරස් මාර්ගයේ පිටාර ගැලීමේ ව්‍යුහය ඉදිකිරීම | 30.00 |
| 07 | අභ්‍යන්තර මාර්ග ජාලය සහ ජලාපවහන පද්ධතිය අලුත්වැඩියා කිරීම | 10.00 |
| 08 | ව්‍යාපෘති කාර්යාල ගොඩනැගිලි සහ නිල නිවාස අලුත්වැඩියා කිරීම | 15.00 |
| 09 | පරිපාලන පිරිවැය | 25.00 |
| **එකතුව** | | **1000.00** |

## වාරිමාර්ග කළමනාකරණ අංශය

වාරිමාර්ග කළමනාකරණ අංශය ඒකාබද්ධ වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන (INMAS) ක්‍රියාත්මක කිරීම සඳහා 1984 වර්ෂයේ දී ආරම්භ කරන ලදී. මෙම අංශය විසින් හෙක්ටයාර් 400ට වැඩි මහා වාරිමාර්ග බල ප්‍රදේශ 54ක සහභාගීත්ව කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කරගෙන යනු ලැබේ. මෙම වැඩසටහනේ අරමුණ වනුයේ ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම හා ස්වයං කළමනාකරණ ශක්තිය වර්ධනය සඳහා, ගොවීන් සංවිධානගත කොට ඔවුන්ගේ සහභාගීත්වයෙන්, කෘෂිකර්ම කටයුතු සඳහා යෙදවුම් හා සේවා සපයන රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සහභාගීත්වයෙන් හා දායකත්වයෙන් ඒකාබද්ධ හා සහභාගීත්ව ප්‍රවේශයක් තුළින් මහා වාරිමාර්ග ව්‍යාපාරවල නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායිතාව උපරිම මට්ටමකට නංවා එමගින් ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමයි. ඒ අනුව මහා වාරිමාර්ග ව්‍යාපාරවල ජල ඒකකයක හා ඉඩම් ඒකකයක නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නංවමින් ඒකාබද්ධ හා කාර්යක්ෂම ජල කළමනාකරණය තුළින් ගොවි ජනතාවගේ තිරසර ආර්ථික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂා කෙරේ.

**දැක්ම**

මහා වාරිමාර්ග ආශ්‍රිතව සෞභාග්‍යමත් ගොවි ප්‍රජාවක් බිහිකිරීම

**මෙහෙවර**

සංවිධිත ගොවි ප්‍රජාවක් තුළින් සහ යෙදවුම් හා සේවා සැපයුම් ආයතන සම්බන්ධීකරණයෙන් කෘෂිකාර්මික නිෂ්පාදනය හා වාරි ජල ඒකකයක ඵලදායීතාව ඉහළ නැංවීම

**අරමුණු**

i. වාරිමාර්ග ජල ඒකකයකින් සහ ඉඩම් ඒකකයකින් ලබන ආර්ථික වාසි උපරිම කිරීම
ii. වාරිමාර්ග ජලය සාධාරණව හා සමානාත්මව ගොවීන් අතර බෙදා ගැනීම සඳහා පහසුකරණය
iii. වාරිමාර්ග ආශ්‍රිත සම්පත් කළමනාකරණයට ගොවීන් සහභාගී කරගැනීම සඳහා අවශ්‍ය ආයතනික ව්‍යුහය සකස් කිරීම, ශක්තිමත් කිරීම සහ පවත්වාගෙන යාම
iv. වාරිමාර්ග පද්ධතිවල මෙහෙයුම් හා නඩත්තු කටයුතු ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම සඳහා පසුබිම සැකසීම හා පහසුකරණය
v. ප්‍රතිලාභීන් හා රජය මෙන්ම පෞද්ගලික ආයතන අතර මනා සම්බන්ධීකරණය තුළින් කෘෂිකාර්මික නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම
vi. ගොවි ප්‍රජාවගේ දැනුම හා කුසලතා සංවර්ධනය කිරීම තුළින් සුභවාදී ආකල්ප ඇති කිරීම
vii. කෘෂිකාර්මික සහාය සේවාවන් ශක්තිමත් කිරීම
viii. ගොවි පවුල්වල ආර්ථික හා සමාජ සංවර්ධනය

**ප්‍රධාන කාර්යයන්**

**අමාත්‍ය මණ්ඩල තීරණ 1983.06.01 (අංක 465) සහ 1995.08.23 (අංක 94/95) අනුව,**

i. මහා වාරිමාර්ග කළමනාකරණ බල ප්‍රදේශ 39 ක (වාරිමාර්ග ව්‍යාපාර 54) ඒකාබද්ධ කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
ii. රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන මගින් සපයනු ලබන යෙදවුම් හා සේවාවන් සම්බන්ධීකරණය තුළින් ඉඩම් ඒකකයක හා ජල ඒකකයක ඵලදායීතාව ඉහළ නංවා ගොවි පවුලේ ආදායම ඉහළ නැංවීම සඳහා කටයුතු කිරීම
iii. වාරිමාර්ග කළමනාකරණ කටයුතු සඳහා ගොවින්ගේ දායකත්වය ලබාගැනීම සඳහා ගොවි සංවිධාන පිහිටුවීම, ගොවි සංවිධානවල යහපාලනය තහවුරු කිරීම හා ඒවා තිරසර ලෙස පවත්වාගෙන යාම
iv. වාරිමාර්ග උප පද්ධතියේ (කෙත් ඇළ හා බෙදුම් ඇළ) මෙහෙයුම් නඩත්තු වගකීම් ගොවි සංවිධානවලට භාර දීම හා එම කටයුතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස පවත්වාගෙන යාම සඳහා ගොවි සංවිධානවලට මඟපෙන්වීම සහ පහසුකරණය

v. වාරිමාර්ග පද්ධති කළමනාකරණ වගකීම් භාරගත හැකි සහ ගොවීන්ගේ සමාජ ආර්ථික මට්ටම දියුණු කළ හැකි මට්ටමට ආයතනික හා ආර්ථික වශයෙන් ගොවි සංවිධාන ශක්තිමත් කිරීම

vi. රාජ්‍ය ආයතන, පළාත් සභා, ප්‍රාදේශීය සභා, රාජ්‍ය නොවන සංවිධාන, පෞද්ගලික ආයතන සහ ප්‍රජා සංවිධාන සම්බන්ධීකරණයෙන් ආසන්නතම ජල පෝෂක ප්‍රදේශවල (Immediate Catchment) ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීම හා තිරසර භාවිතය තහවුරු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් ගොඩ නැගීම හා පවත්වාගෙන යාම

vii. රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය හා රාජ්‍ය නොවන සංවිධානවල දායකත්වයෙන් ගොවීන්ගේ හා ජලධාරා ප්‍රදේශවල සම්පත් භාවිතා කරන කණ්ඩායම්වල ශුද්ධ ආදායම ඉහළ නැංවීමේ කටයුතු ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය තුළින් ස්වභාවික සම්පත්වල තිරසර භාවිතය තහවුරු කිරීම

viii. කෘෂි නිෂ්පාදනවලට සාධාරණ මිලක් ලබා දීම සඳහා වෙළඳපොල සම්බන්ධීකරණය

ix. වාරිමාර්ග ආඥා පනතට අදාලව පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම සහ පනතේ සෙසු කටයුතු ඉටු කිරීමට අදාල ආයතනවලට සහාය ලබා දීම.[1]

x. ජාතික ආහාර සුරක්ෂිතතා වැඩසටහන, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන, පරිසර සංරක්ෂණ වැඩසටහන, කාබනික පොහොර භාවිතය හා නිෂ්පාදනය යනාදී ජාතික වැඩසටහන් ගොවි සංවිධානවල ක්‍රියාකාරී දායකත්වය ඇතිව මහා වාරිමාර්ග බල ප්‍රදේශවල ක්‍රියාත්මක කිරීම සඳහා සම්බන්ධීකරණය හා පහසුකරණය [2]

## 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය

### 1.ගොවි සංවිධාන පිහිටුවීම, ශක්තිමත් කිරීම සහ සවිබල ගැන්වීම

මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග ව්‍යාපාර 54හි ගොවි සංවිධාන 908 ක් පිහිටුවා ඇති අතර, එම ගොවි සංවිධාන ආයතනික වශයෙන් ශක්තිමත් කර ඒවායේ යහපාලනය සහ විනිවිදභාවය තහවුරු කිරීම හා සක්‍රීය මට්ටමින් පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. ඒ අනුව ගොවි සංවිධාන වල ගිණුම් කටයුතු යථාවත් කිරීම (862), අභ්‍යන්තර ගිණුම් පරීක්ෂාව (790), අවසන් ගිණුම් සැකසීම (815), ගිණුම් බාහිර විගණනය (711), නිළවරණ පැවැත්වීම (290), මහා සභා රැස්වීම් පැවැත්වීම (1,911) (අමතරව විශේෂ මහා සභා රැස්වීම් ද ඇතුළුව) සහ මාසික කමිටු රැස්වීම් පැවැත්වීම (7,303) සිදුකර ඇත.

එසේම ගොවි සංවිධාන 175 ක සාමාජික නාම ලේඛණය යථාවත් කිරීම, ගොවි සංවිධාන 164 ක ව්‍යවස්ථාව සංශෝධනය කිරීම, සම්මත හා කාර්ය පරිපාටි හඳුන්වාදීම සහ ඒවා භාවිතය තහවුරු කිරීම මෙන්ම ගොවි සංවිධාන අරමුදල රු. මිලියන 45 දක්වා වර්ධනය කිරීම ද සිදුකරන ලදී.

1. 1856 අංක 09 දරණ වාරිමාර්ග ආඥා පනතේ, 1994 අංක 13 දරණ වාරිමාර්ග (සංශෝධන) පනතින් සංශෝධිත වාරිමාර්ග ආඥා පනතේ 453 අධිකාරිය යටතේ ප්‍රතිපාදන යොදාගෙන පෙර කන්න රැස්වීම් පැවැත්වීම, කන්න රැස්වීම් තිරණ ක්‍රියාත්මක කිරීම හා ව්‍යාපෘති කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම යන වගකීම් ක්‍රියාත්මක කිරීම

2. මෙම කාර්යන් පසු කාලීනව රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යටතේ පැවරී ඇත.

## 2. වාරිමාර්ග කළමනාකරණය

වාරිමාර්ග කළමනාකරණ කටයුතු සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ කමිටුව හා පෙර වගා (කන්න) රැස්වීම් පැවැත්වීම සහ වගා (කන්න) රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකරණය සැපයීම සිදු කරනු ලබයි. ජලය ඇතුළු කෘෂිකාර්මික යෙදවුම් හා සේවා කලට වෙලාවට සැපයීම තහවුරු කිරීම, නියමිත වේලාවට පෙර කන්න රැස්වීම් පවත්වා වගා (කන්න) රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකරණය කිරීම සහ වගා (කන්න) රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පසු විපරම් කිරීම හා වාරිමාර්ග කළමනාකරණ කටයුතු කාර්යක්ෂමව පවත්වා ගෙන යාමට අවශ්‍ය තීරණ ගැනීම සඳහා මාසිකව ව්‍යාපෘති කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සිදුකරන ලදී.

ඒ අනුව ව්‍යාපෘති කළමනාකරණ කමිටු රැස්වීම් 474 ක් ද, පෙර කන්න රැස්වීම් 195 ක් ද, කන්න රැස්වීම් 124 ක් ද පවත්වා ඇත.

## 3. සහභාගීත්ව නඩත්තුව හා ජල කළමනාකරණ වැඩසටහන

මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග බලප්‍රදේශ 54 හි වාරිමාර්ග උප පද්ධතියේ (බෙදුම් ඇළ හා කෙත් ඇළ) මෙහෙයුම් හා නඩත්තු කටයුතු නිරන්තරව ඉටු කිරීම සඳහා ගිවිසුමක් මගින් ගොවි සංවිධානවලට භාර දී ඒ මගින් ඉටු කරවා ගනු ලබයි. මෙම කාර්යය ගුණාත්මයෙන් යුක්තව ඉටු කිරීම සඳහා ගොවි සංවිධාන මෙහෙයවීම, මගපෙන්වීම, පහසුකරණය සහ ඒ සඳහා ගොවි සංවිධාන නිලධාරීන්ගේ දැනුම හා කුසලතාවය වර්ධනය කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

ඒ අනුව ගොවීන්ගේ සහ ගොවි සංවිධාන අරමුදල් යොදා ගනිමින් බෙදුම් ඇළ දිග කි.මී. 320ක සහ කෙත් ඇළ කි.මී. 168 ක රක්ෂිත මායිම් ලකුණුකර වෙන් කිරීම, රක්ෂිත මායිම් සංරක්ෂණය, බෙදුම් ඇළ දිග කි.මී.2,657 ක ඇළ සහ පාර දෙපස තණකොල මට්ටමකට කැපීම, රොන්මඩ ඉවත් කිරීම, කෙත් ඇළ දිග කි.මී. 5,630ක ඇළ සහ පාර දෙපස තණකොල මට්ටමකට කැපීම, රොන්මඩ ඉවත් කිරීම, කෘෂි මංමාවත් දිග කි.මී. 1215 ක් නඩත්තු කිරීම සහ දියබස්නා ඇළවල් කි.මී.703ක් නඩත්තු කිරීම සඳහා දායකත්වය ලබා දී ඇත. එසේම වාරිමාර්ග නිර්මිත හා උපාංග නඩත්තු කටයුතු සඳහා දායකත්වය ලබා දී ඇති අතර ශ්‍රමදායකත්වය ද ඇතුළුව ගොවි සංවිධාන විසින් ලබා දී ඇති දායකත්වයේ මූල්‍ය වටිනාකම රු. මිලියන 616 ක් පමණ වේ. විශේෂයෙන්ම 2025 වර්ෂයේ දිට්වා සුළි කුණාටුව නිසා වාරිමාර්ග උප පද්ධතිය විශාල වශයෙන් හානි වූ අතර, ඒවා පිළිසකර කිරීම සඳහා ගොවි සංවිධාන අරමුදල් සහ ගොවීන්ගේ ශ්‍රමදායකත්වය ලබා දී ඇත.

එයට අමතරව සහභාගීත්ව නඩත්තු හා ජල කළමනාකරණ වැඩසටහන ප්‍රවර්ධනය සඳහා ගොවි සංවිධාන මට්ටමින් නිරන්තර නඩත්තු සැලසුම් 176 ක් සැකසීම සහ සැලසුම් 474 ක් යථාවත් කිරීම , රක්ෂිත මායිම් සංරක්ෂණය සඳහා බෙදුම් ඇළ සහ කෙත් ඇළ රක්ෂිත මායිම් වල ගල්කණු 2,994ක්ද, පරිසර හිතකාමී වන පැළ 8,216 ක් ද සිටුවීම සිදු කරන ලදි.

වාරි සංස්කෘතිකාංග ආරක්ෂා කිරීම සඳහා ජලය ආශ්‍රිත පූජා කර්ම / චාරිත්‍ර වාරිත්‍ර ප්‍රවර්ධනය සඳහා ගොවි සංවිධාන මට්ටමින් වැඩසටහන් 616 ක් පවත්වා ඇත. එසේම කන්න රැස්වීම් තීරණ මත පදනම්ව, වාරිමාර්ග උප පද්ධතියේ නඩත්තු කටයුතු සඳහා ගොවීන් විසින් ගොවි සංවිධාන වල අරමුදල් වර්ධනය සඳහා ලබා දී ඇති මුදල රුපියල් මිලියන 139 ක් වේ.

## 4. කෘෂි නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නැංවීම

මෙම අංශයේ සම්බන්ධීකරණය, මෙහෙයවීම හා පහසුකරණය යටතේ ඒකාබද්ධ මහා වාරිමාර්ග කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන ලද මහා වාරිමාර්ග ව්‍යාපාර 54හි කෘෂිකාර්මික නිෂ්පාදනය හා නිෂ්පාදන ඵලදායීතාවය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| විශේෂිත දර්ශක | 2024/25<br>මහ සහ 2025 යල ප්‍රගතිය | | |
|---|---|---|---|
| | මිනුම් ඒකකය | 2025 යල | 2025/26 මහ |
| වී වගා කළ බිම් ප්‍රමාණය | හෙක්. | 138,547 | 150,916 |
| වෙනත් ආහාර බෝග වගාව හා එළවළු වගාව | හෙක් | 16,423 | 5,910 |
| බහු වාර්ෂික බෝග වගාව | හෙක් | 6,127 | 5208.5 |
| වගා කළ මුළු බිම් ප්‍රමාණය | හෙක් | 161,097 | 162,034 |
| වගා තිව්‍රතාවය% | % | 94 | 95 |

## 5. රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්

2025 වර්ෂය සඳහා 118-2-34-0-2509 වැය විෂය යටතේ මෙම අංශයට රුපියල් මිලියන 28 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එම රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන යොදවා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් වල ප්‍රගතිය පහත දැක්වේ.

i. පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
   - ගොවීන් සහ ගොවි සංවිධාන නිළධාරීන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
   - ආරක්ෂිත ගෘහ තුළ වගාවන් ස්ථාපිත කිරීම පිළිබඳ පුහුණුව
   - Clean Sri Lanka වැඩසටහන පිළිබඳ නේවාසික ව්‍යාපෘති කළමනාකරුවන් දැනුවත් කිරීම
   - තෝරාගත් මහා වාරිමාර්ග ව්‍යාපාරවල ගොවි සමාගම් පිහිටුවීම පිළිබඳ මූලික දැනුවත් කිරීම
   - ගල්ඔය වම් ඉවුර ව්‍යාපාරයේ ගුණාත්මක බිත්තර වී නිෂ්පාදනය සඳහා ගොවි සංවිධාන සාමාජිකයින් පුහුණු කිරීම සඳහා වැඩසටහන් 24 ක් පැවැත්වීම

- කෘෂි යන්ත්‍රෝපකරණ නඩත්තුව සම්බන්ධව ගොවීන් 51 දෙනෙකු සඳහා දින 03 ක පුහුණුව ලබා දීම
- ගොවීන් 33 ක් සඳහා ගොවිපල් යන්ත්‍ර අළුත්වැඩියාව පිළිබඳ දින 05 ක පුහුණුව ලබා දීම

ii. ලෝක ජල දිනය පිළිබඳ වැඩසටහන් පැවැත්වීම

iii. ගොවි සංවිධාන සුදුසු ව්‍යාපාර සඳහා පරිවර්තනය සඳහා ඇති අභියෝග හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ පැවැත්වීම.

iv. කුඹුරු ඉඩම් ඒකාබද්ධ කිරීම සහ මට්ටම් කිරීම - හුරුළුවැව ව්‍යාපාරය සහ දේවහුව ව්‍යාපාරය

v. හුරුළු වැව ව්‍යාපාරයේ ක්ෂුද්‍ර වාරිමාර්ග පද්ධති හඳුන්වා දීම හා ජල භාවිත කාර්යක්ෂමතාව වැඩිකිරීමේ වැඩසටහන

vi. 2025/26 මහ කන්නයේ දී බීජ වී නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කිරීම (ගල්ඔය ව.ඉ., පදවිය ව්‍යාපාරය ගොවි සංවිධාන 25 ක තෝරාගත් අක්කර 94 / තිසාවැව ව්‍යාපාරය ගොවීන් 15, කුඹුරු අක්කර 37.5 / මී ඔය ව්‍යාපාරය ගොවීන් 63 අක්කර 97.25)

vii. වර්ග අඩි 2000 ආරක්ෂිත ගෘහ සඳහා pH/EC/TDS/උෂ්ණත්ව මීටර 38 ක් ලබා දීම

viii. 50% සහනාධාර යටතේ වර්ග අඩි 2000 ආරක්ෂිත ගෘහ 11 ක් ලබා දීම

ix. ක්ෂේත්‍ර අත්දැකීම් සඳහා ගොවීන් යොමු කිරීම

x. 50% දායකත්වය යටතේ රිදීබැඳි ඇළ ව්‍යාපාරයේ කටගමුව, හල්මිල්ලැව, දිවුල්ලැව සහ දණ්ඩුවාව ගොවි සංවිධානවල කමත් ඉදි කිරීම

xi. 50% දායකත්වය යටතේ උමා ඔය ව්‍යාපාරය සඳහා බඩඉරිගු බීජ ලබාදීම

xii. පැරෂුට් තැටි ලබා දීම

xiii. 50% දායකත්වය යටතේ කුරුඳු වගාව සඳහා පැළ ලබා දීම

## 6. දිට්වා සුළි කුණාටුව හා ගංවතුර නිසා ඇති වූ ඇළමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ගොවි සංවිධාන දායකත්වය

2025 වර්ෂය තුළ දිට්වා සුළි කුණාටුව හා ගංවතුර නිසා වාරිමාර්ග උප පද්ධතියට වූ හානි ප්‍රතිසංස්කරණය සඳහා ගොවි සංවිධාන අරමුදල් සහ ගොවීන්ගේ ශ්‍රමදායකත්වය ලබාගත් අතර ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත දැක්වේ.

i. දිට්වා සුළි කුණාටුව හා ගංවතුර නිසා විනාශ වූ රාජාංගනය ව්‍යාපාරයේ,
   - දකුණු ඉවුර ප්‍රධාන ඇළේ පළමු කිලෝමීටරය ප්‍රතිසංස්කරණය ගොවීන් 3300 කගේ ශ්‍රමදායකත්වය සහ ගොවි සංවිධාන අරමුදල් යොදවා සිදුකිරීම යටතේ 2025/26 මහ කන්නයේ ගොවීන් 5000 කට පමණ නැවත වගාව ස්ථාපිත කිරීමට හැකි විය - රු.මිලි. 9.00
   - ගොවි සංවිධාන 18ක කෙත් ඇළවල් 45ක ප්‍රතිසංස්කරණ කටයුතු ගොවීන් 288 ක ගේ ශ්‍රමදායකත්වය සහ ගොවි සංවිධාන අරමුදල් යොදවා සිදු කිරීම - රු.මිලි. 2.00
   - රාජාංගනය ව්‍යාපාරයේ අතු ඇළ අංක 03 කි.මී. 1.5 ක් ජලය බැසයාමට පාර හරහා කපා නැවත සකස් කිරීම සඳහා ගොවීන් 50 ක ගේ ශ්‍රමදායකත්වය ලබා දීම - රු.මිලි. 0.25

ii. දිට්වා සුළි කුණාටුව හා ගංවතුර නිසා විනාශ වූ නුවරවැව,
- සාලිය ගොවි සංවිධානයේ අබලන්ව තිබූ බිංදුව බෙදුම් ඇළේ FC 14 අසල පැති බැම්ම මීටර් 6.5ක් අළුතින් ඉදිකිරිම - රු.මි.ලි. 0.44
- සාලිය බෙදුම් ඇළ ගොවි සංවිධානයේ බිංදුව ඇළ FC – 9 කෘෂි මාර්ගය සකස් කිරීම - රු.මි.ලි. 0.06

iii. තිසා වැව, හාල්පානු ඇළ සමගි ගොවි සංවිධානයේ කෘෂි පාර කිලෝ මීටර් 3ක් ප්‍රතිසංස්කරණය කිරීම (ප්‍රාදේශීය සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කර ගැනීමේ එකඟතාවය මත) - රු.මි.ලි. 0.7

iv. දිට්වා සුළි කුණාටුවෙන් හක්වටුනාඔය ඇනිකට් ඇළ අමුණේ සිරවී තිබූ ගස් ශ්‍රමදායකත්වය ද ඇතුව ඉවත් කිරීම - රු.මි.ලි. 0.01

v. දිට්වා සුළි කුණාටුව හා ගංවතුර නිසා විනාශ වූ බදුළු ඔය/ බත්මැඩිල්ල ව්‍යාපාරයේ ඇළවල් ජලය බැසයාමට හැකිවන පරිදි පාරවල් හරහා කපා නැවත සකස් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගොවීන් සහ සියළු පාර්ශව ඒකාබද්ධව 7800 ක ගේ ශ්‍රමදායකත්වය ලබා දීම - රු.මි.ලි.1.37

**7. ගොවි සංවිධානවල දායකත්වය ඇතුව සිදුකරනු ලැබූ වෙනත් විශේෂ වැඩසටහන්**

- Clean Sri Lanka වැඩසටහනට සමගාමීව මුරුතවෙල යාය 02 ඩී 09 මිණිමුතු ගොවි සංවිධානයේ FC125 සිට කෙත් ඇළ 10 ක භවිතා කර ඉවතලන ලද වස බෝතල්, ටින් ප්ලාස්ටික්,පොලිතීන් වැනි කසළ පරිසරයට මුදාහැරිම වලකාලීම සඳහා කසල බඳුන් 10ක් ස්ථාපිත කිරීම
- රිදීබැදි ඇළ ව්‍යාපාරයේ ගොවි සංවිධාන 14 හා ඒකාබද්ධ ගොවි සංවිධානය ඒකාබද්ධව කෘෂි අලෙවිසැලක් ස්ථාපිත කිරීම, කෘෂි සහන අලෙවි සැල ආරම්භ කිරීම සහ එමගින් ආපන ශාලාව ආරම්භ කිරීම
- රිදීබැදි ඇළ ව්‍යාපාරයේ ජලජ ශාක වර්ග සහ විසිතුරු මල් වර්ග අලෙවිය
- 2025 යල කන්නයේ කැබැල්ලෑව, දිවුල්ලෑව ගොවි සංවිධානවල අක්කර 34ක ගොවීන් 25 දෙනෙකු බිත්තර වී නිෂ්පාදනය හා කෘෂි සහන අලෙවි සැල මඟින් බිත්තර වී අලෙවිය සඳහා සකස් කිරීම සහ අලෙවි කිරීම
- ධීවර වැඩසටහන යටතේ දණ්ඩුවාව පහළ ගලපිටියාගම සහ තරණගොල්ල වැව්වලට මත්ස්‍ය පැටවුන් මුදාහැරීම
- පරාක්‍රම සමුද්‍රය ව්‍යාපාරයේ Clean Sri Lanka වැඩසටහනට සමගාමීව පරාක්‍රම සමුද්‍රයේ ජලජ ශාඛ ඉවත් කිරීම
- පරාක්‍රම සමුද්‍රය ව්‍යාපාරයේ දිට්වා සුළි කුණාටුවෙන් විනාශ වූ ඇළ පද්ධතිය ප්‍රති සංස්කරණය කිරීම

- රිදියගම ව්‍යාපාරයේ බැරගම්විල උස්සාන වාරි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික ක්ෂේත්‍ර නිරීක්ෂණ හා සමීක්ෂණ පවත්වා ව්‍යාපෘති වාර්තාව සකස් කර ඉදිරිපත් කිරීම - ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.
- මී ඔය ව්‍යාපාරය තුළ සමූපකාර සමිතියක් ලෙස ලියාපදිංචි කිරීමට අපේක්ෂිතව බිම්මල් නිෂ්පාදකයින් 83 දෙනෙකුගෙන් සමන්විත බිම්මල් නිෂ්පාදන සමිතියක් පිහිටුවීම. බිම්මල් මගින් අගය එකතු කළ නිෂ්පාදන සඳහා සාමාජිකයින් 09 ක්ද බිම්මල් බීජ නිෂ්පාදනයට සාමාජිකයින් 07 ක් ද යොමු කර ඇත.
- නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාල මට්ටමින් ලැබුණු මහජන දුක්ගැනවිලි 51,087ක් සඳහා විසඳුම් ලබා දීම
- ගොවි සංවිධාන අරමුදල් වලින් ප්‍රතිලාභීන් 6,725 දෙනෙකුට රුපියල් මිලියන 201 ක වගා ණය ලබා දීම සහ ප්‍රතිලාභින් 48 දෙනෙකුට රු. මිලියන 10 ක් ව්‍යාපෘති ණය ලබා දීම (රිදිබැදි ඇළ, හක්වටුනා ඔය, මීඔය, උස්ගල, තබ්බෝව, රාජාංගනය, පදවිය, යාන්ඔය ව.ඉ., මහකනදරාව, නාච්චාදූව, නුවරවැව, වාහල්කඩ, කවුඩුළුව වැව, ගිරිතලේ, දේවහූව, දඹරාව, මුතුකණ්ඩිය, කිරිදි ඔය සහ දමන ව්‍යාපාර)

**වැය ශීර්ෂය 118-2-34-0-2509**

| | | |
|---|---|---|
| • අනුමත වූ ප්‍රතිපාදන | - | රු. මිලි. 28.00 |
| • 2025.12.31 දක්වා වියදම | - | රු. මිලි. 26.06 |

## 2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන්වල ඉලක්ක

- **ගොවි සංවිධාන පිහිටුවීම, ශක්තිමත් කිරීම, යහපාලනය තහවුරු කිරීම හා සක්‍රිය මට්ටමින් පවත්වාගෙන යාම**

  මෙම අංශය මගින් කළමනාකරණය කරනු ලබන මහා වාරිමාර්ග ව්‍යාපාර 54 හි බෙදුම් ඇළ ගොවි සංවිධාන 908 ක් පිහිටුවා ඇති අතර, එම ගොවි සංවිධාන ආයතනික වශයෙන් ශක්තිමත් කර ඒවායේ යහපාලනය සහ විනිවිදභාවය තහවුරු කිරීම හා සක්‍රීය මට්ටමින් පවත්වාගෙන යාමට පහසුකරණය හා මග පෙන්වීම් කිරීම.

- **වාරිමාර්ග කළමනාකරණය**

  වාරිමාර්ග කළමනාකරණ කටයුතු සඳහා තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ කමිටුව හා පෙර වගා (කන්න) රැස්වීම් පැවැත්වීම සහ වගා (කන්න) රැස්වීම් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකරණය සැපයීම. ජලය ඇතුළු කෘෂිකාර්මික යෙදවුම් හා සේවා කලට වෙලාවට සැපයීම තහවුරු කිරීම, කෘෂිකාර්මික යෙදවුම් හා සේවා සපයන රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන හා ගොවි සංවිධාන වල සහභාගීත්වය ඇතිව වාරි පද්ධතියේ

කළමනාකරණය පිළිබඳ තීරණ ගැනීම සඳහා සෑම මසකම ව්‍යාපෘති කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සැලසුම් කර ඇත.

- **සහභාගීත්ව නඩත්තු හා ජල කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම**

  මෙම අංශයේ මෙහෙයවීම මගපෙන්වීම හා පහසුකරණය යටතේ වාරිමාර්ග උප පද්ධතියේ (බෙදුම් ඇළ හා කෙත් ඇළ) නඩත්තු කටයුතු වෙනුවෙන් කන්න දෙක සඳහා ගොවීන් සහ ගොවි සංවිධානවල දායකත්වය ලබා ගැනීමට සැලසුම් කර ඇත.

  වාරිමාර්ග උප පද්ධතියේ සහභාගිත්ව නඩත්තු හා ජල කළමනාකරණ වැඩසටහන් ප්‍රවර්ධනය සඳහා වැඩසටහන් සැලසුම් කර ඇත.

- ජල භාවිත කාර්යක්ෂමතාවය ප්‍රශස්ථ කිරීම හා අස්වැන්න ඉහළ නැංවිම
- 50% රජයේ සම දායකත්වය යටතේ කුඹුරු ඉඩම් ලියදි විශාල කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- වෙළඳපොල කේන්ද්‍ර කරගත් නිෂ්පාදන වැඩිදියුණු කිරීම සහ ආර්ථික ස්වයංපෝෂිතභාවය වැඩිදියුණු කිරීම යටතේ ගොවි සමාගම් ආරම්භ කිරීම සහ විවිධාංගීකරණය, ගොවි සංවිධාන විසින් විවිධාංගීකරණය වූ ව්‍යාපාර ක්‍රියාකාරකම් ආරම්භ කිරීම.
- ගොවි සංවිධාන මට්ටමින් සෑම ගොවියෙකු සඳහාම සවිස්තරාත්මක පුද්ගලික ලිපිගොනු ක්‍රමානුකූලව නඩත්තු කිරිම
- ගොවීන්ගේ සහ ගොවි සංවිධාන නිලධාරීන්ගේ හැකියා වර්ධනය සඳහා පුහුණු හා දැනුවත් කිරිමේ වැඩසටහන් පැවැත්වීම

## ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB)

| | | |
|---|---|---|
| **පිහිටුවන ලද වර්ෂය** | - | 1973 |
| **මූලික ව්‍යාපාර** | - | ඉංජිනේරු සහ වාස්තු විද්‍යාත්මක උපදේශන සේවා |

**දැක්ම**

ලෝක තත්ත්වයේ ඉංජිනේරු ආයතනයක් වීම.

**මෙහෙවර**

බහු විෂයමය ඉංජිනේරු ක්ෂේත්‍රයේ, ඒ හා සම්බන්ධ විෂයයන් හා ව්‍යාපාරික ක්‍රියාවලීන්හි විශිෂ්ටත්වය ලබා ගැනීම සඳහා නවීන තාක්ෂණ, නවෝත්පාදන සහ සම්පත් ප්‍රතිශෝධනය යොදා ගනිමින්, තිරසාර සංවර්ධනයක් ප්‍රවර්ධනය කරමින් උතුම් අනාගතයක් උදෙසා කටයුතු කිරීම

**අරමුණු**

i. ප්‍රමුඛ ඉංජිනේරු උපදේශන සංවිධානය ලෙස ජාතික පිළිගැනීම තහවුරු කිරීම.

ii. උපාය මාර්ගික වත්කමක් ලෙස මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම.

iii. ආයතනික තිරසාරභාවය සඳහා ව්‍යාපාර සේවා කළඹ වැඩිදියුණු කිරීම.

iv. අද්විතීය ආයතනික සංස්කෘතියක් වර්ධනය කිරීම.

v. සමාජීය සහ පාරිසරික තිරසරභාවය ශක්තිමත් කිරීම.

**ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ ප්‍රධාන අංශ**




**ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) හි මූලික ව්‍යාපාර හා ඉංජිනේරු සේවා අංශ**

- ජල විදුලිය සහ බලශක්තිය
- බලශක්ති සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම
- වාරිමාර්ග හා ජල සම්පත් සංවර්ධනය
- ගොඩනැගිලි සහ නාගරික යටිතල පහසුකම්
- මහාමාර්ග, දුම්රිය මාර්ග සහ පාලම්
- ගුවන් තොටුපළ සංවර්ධනය
- වරාය/ වෙරළ සහ සමුද්‍ර කටයුතු
- විදුලි හා යාන්ත්‍රික වැඩ
- ජල සම්පාදන, මලාපවහන සහ ජලාපවහන
- තොරතුරු තාක්ෂණය (IT)
- ශක්‍යතා සහ පාරිසරික අධ්‍යයනය සහ ආපදා අවදානම් කළමනාකරණය
- තාක්ෂණික විගණනය / බලශක්ති විගණනය / වෙළි ආරක්ෂාව
- භූ-තාක්ෂණික විමර්ශනය, සමීක්ෂණය හා රසායනාගාර සේවා

## ප්‍රගතිය 2025

දැනට ක්‍රියාත්මක වන ප්‍රධාන ව්‍යාපෘති

| | උපදේශන සේවා ව්‍යාපෘති - 2025 | ඇස්තමේන්තුගත මුදල රු. මිලියන | 2025.12.31 දිනට සේවා සැපයීමේ ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 1 | කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය - යටිතල පහසුකම් සහ භූමි අලංකරණ කටයුතු | 223,870.00 | 99.6% |
| 2 | බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි ව්‍යාපෘතිය | 10,660.00 | 99% |
| 3 | ගන්දර ධීවර වරාය ව්‍යාපෘතිය | 2,000.00 | 79% |
| 4 | ත්‍රිකුණාමලය නාවික තටාකාංගනයේ තොටුපළ සැලසුම් කිරීම සහ නැවත ඉදිකිරීම | 6,184.00 | 68% |
| 5 | මාහෝ සිට ඕමන්තෙයි දක්වා දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීම | 15,628.00 | 97% |
| 6 | හෘද හා දැඩි සත්කාර සංකීර්ණය ඉදිකිරීම, රිජ්වේ ආර්යා රෝහල, බොරැල්ල | 2,631.00 | 97% |
| 7 | ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල ශ්‍රවණාගාරයේ ඉතිරි ඉදිකිරීම් කටයුතු සැලසුම් කිරීම, උපදේශනය සහ අධීක්ෂණය. | 800.00 | 82% |
| 8 | කොළඹ 12 මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණයේ ඉදිකිරීම් සහ දෝෂ නිවැරදි කිරීම | 6,023.00 | 73 % |
| 9 | ගාල්ල අධිකරණ සංකීර්ණය ඉදිකිරීම (අදියර II) | 900.00 | 91% |
| 10 | දඹුල්ලේ ඉක්මණින් නරක් වන (දිගු කාලයක් ගබඩා කළ නොහැකි) භාණ්ඩ සඳහා මෙට්‍රික් ටොන් 5000 ක ශීත ගබඩා පහසුකම සැපයීම (අදියර 1). | 300.00 | 92 % |
| 11 | රයිගම කළුතර කාර්මික කලාපය පිහිටුවීම | 224.33 | 80 % |
| 12 | මොරටුවේ නිවාස 575 ක සහ කොට්ටාවේ නිවාස100 ක මහල් නිවාස සංකීර්ණය ඉදිකිරීම් අධීක්ෂණය | 7,800.00 | 20% |
| 13 | සැලසුම් සමාලෝචනය සහ අනුමත කිරීම සඳහා උපදේශන සේවා සහ අධීක්ෂණය අරුවක්කාලු හි මෙට්‍රෝ කොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | 15,640.00 | 98% |
| 14 | ඉන්දියානු ප්‍රදානයක් යටතේ කරෙයිනගර් බෝට්ටු අංගනය ප්‍රතිසංස්කරණය කිරීම | 350.00 | 30% |
| 15 | යෝජිත හෘද රෝග ඒකකය ඉදිකිරීම - දිස්ත්‍රික් මහ රෝහල - මොණරාගල | 227.32 | 20% |

| | ඉදිකිරීම් අංශයේ ව්‍යාපෘති - 2025 | ඇස්තමේන්තුගත මුදල රු. මිලියන | **2025.12.31** දිනට සේවා සැපයීමේ ප්‍රගතිය % |
|---|---|---|---|
| 1 | තාක්ෂණ විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ සහ ගුරු පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම – KOICA ව්‍යාපෘතිය, නාරංගල්ල, කුලියාපිටිය | 2,885.82 | 97% |
| 2 | ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම, කොළඹ 12 | 1,144.77 | 81.41% |
| 3 | කොළඹ 12 මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණයේ සැලසුම් කිරීම, ඉදිකිරීම සහ දෝෂ නිවැරදි කිරීම | 8,124.87 | 75% |
| 4 | ජාතික ලේඛණාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ මධ්‍යම වායු සිසිලනය, ගිනි ආරක්ෂණ සහ උසස් ආරක්ෂක පද්ධති ස්ථාපනය කිරීම (අදියර II) | 1,308.08 | 13.73% |
| 5 | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම, සෞඛ්‍යය අමාත්‍යාංශය | 11.551.00 | 45.79% |
| 6 | වෛද්‍ය වාට්ටු සංකීර්ණය දෙවන අදියර, මහ රෝහල, කළුතර | 2,450.00 | 20.70% |
| 7 | බදුල්ල පළාත් මහ රෝහල සඳහා දස මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 2,764.88 | 45% |
| 8 | රුහුණු විශ්ව විද්‍යාලය, කරාපිටිය වෛද්‍ය පීඨය සඳහා මහල් දොළහකින් යුත් ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම, නිම කිරීම සහ නඩත්තු කිරීම | 1,091.57 | 70.09% |
| 9 | අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු සහ හදිසි සත්කාර ඒකකය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 759.25 | 67% |
| 10 | ශල්‍ය වාට්ටු සහ ශල්‍යාගාර සංකීර්ණය ඉදිකිරීම , මොණරාගල දිස්ත්‍රික් මහ රෝහල | 734.25 | 50% |
| 11 | හෘද සත්කාර සංකීර්ණය ඉදිකිරීම, රත්නපුර ශික්ෂණ රෝහල | 1,334.75 | 23 |
| 12 | පොළොන්නරුව නව නගරයේ යෝජිත පරිපාලන සංකීර්ණය සැලසුම් කිරීම සහ ඉදිකිරීම | 1,303.86 | 82% |
| 13 | යෝජිත පිළිකා ප්‍රතිකාර ඒකකය (අදියර 11) - මහනුවර මහ රෝහල | 3,273.00 | 58% |

**2026 වර්ෂය සඳහා වූ වැඩසටහන**

- ඉහත ලැයිස්තුගත කර ඇති 2025 වසර අවසානයේ අඛණ්ඩව ක්‍රියාත්මක වූ ව්‍යාපෘති 2026 වසර තුළත් සාර්ථකව ඉදිරියට පවත්වාගෙන යාම.
- ජාත්‍යන්තර ව්‍යාපෘති ලබා ගැනීම සඳහා වූ ක්‍රියාවලියක යෙදී සිටීම.
- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන මහා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති වල නිරත වීම.
- අන්තර්ජාතික වෙළඳපොළට ප්‍රවේශ වීම හරහා ඉදිකිරීම් සඳහා වූ වෙළඳපල සංවර්ධනය.
- සැලසුම් ඉදිරිපත් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයන්හි කාර්යක්ෂමතාව, ගුණාත්මකභාවය සහ ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම.
- ආයතනික දැනුම/ බුද්ධිමය ප්‍රාග්ධන කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.
- ඩිජිටල්කරණය හරහා ඵලදායිතාව වැඩි දියුණු කිරීම.
- සෞඛ්‍යය අධීක්ෂණ අංශය ගොඩනැගිලි වල තාක්ෂණික හා ව්‍යුහාත්මක තත්ත්වයන් අධ්‍යයනය කිරීමේ හැකියාවන් වැඩි දියුණු කිරීම.
- නව ව්‍යාපාරවල ආයෝජනය සඳහා අවස්ථා ලබාගැනීම හා සම්බන්ධ වීම.
- පිළිගත් සහ සහතික කළ සේවා පහසුකම් සමග අති නවීන ඉංජිනේරු තාක්ෂණික රසායනාගාරයක් ලෙස CECB රසායනාගාරය උත්ශ්‍රේණිගත කිරීම.
- ඉංජිනේරු ප්‍රමිතීන් සහ මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම සඳහා සේවක සහභාගීත්වය වැඩි දියුණු කිරීම.
- අභ්‍යන්තර සේවකයින්ගේ අධ්‍යයන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමට කටයුතු සැලසීම.

# මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම (CESL)

මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශයේ (CECB) පූර්ණ හිමිකාරිත්වය දරණ සමාගමක් වන අතර, 1982 දෙසැම්බර් 17 වන දින සමාගම් පනත යටතේ සීමිත වගකීම් සමාගමක් ලෙස සංස්ථාගත කර 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ 2009 නොවැම්බර් මාසයේ දී නැවත ලියාපදිංචි කර ඇත.

මෙම කාලසීමාව තුළ ඉදිකිරීම් සේවා සඳහා ඇති වූ ඉහළ ඉල්ලුම නිසා ඇති වූ අවස්ථාව ප්‍රයෝජනයට ගැනීම සඳහා 2011 වර්ෂය ආරම්භයේ දී මෙම ආයතනය සක්‍රිය ලෙස මෙහෙයුම් ආරම්භ කරන ලදී. ගොඩනැගිලි, මාර්ග, පාලම්, වාරිමාර්ග ව්‍යුහයන් සහ වෙනත් විශේෂ ව්‍යාපෘති ඉදිකිරීම මත මූලික ව්‍යාපාරය කේන්ද්‍රගත වී ඇත. සිය ව්‍යාපෘති සඳහා කොන්ක්‍රීට් හා ඇස්ෆාල්ට් නිෂ්පාදනය කිරීමෙහි ද සමාගම නිරතව සිටී.

මේ මඟින් රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ සේවාදායකයන්ට සේවා ලබාදෙයි.

**දැක්ම**

පාරිසරික තිරසාරබව කෙරෙහි ප්‍රමුඛත්වය ලබාදෙමින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා විශේෂිත පුරෝගාමියා වීම

**මෙහෙවර**

නව තාක්ෂණයන් සහ නවෝත්පාදන ක්‍රියාවලිය තුළින් ඉදිකිරීම් කර්මාන්තයේ විශිෂ්ටත්වය ළඟා කරගැනීම - ඉහළ අභිප්‍රේරණයකින් යුත් පුහුණු කාර්ය මණ්ඩලයකින් සමන්විත සේවකයින්ගේ දායකත්වය ප්‍රමාණවත් ලෙස පිළිගැනීම.

**අරමුණු**

i. ආයතනය තුළ නවීන, ඵලදායී සහ කාර්යක්ෂම කළමනාකරණ සංස්කෘතියක් ගොඩනැගීම තුළින් ගෝලීයකරණය වූ ඉදිකිරීම් කර්මාන්තයට සාර්ථකව මුහුණදීම.

ii. ක්ෂේත්‍රයේ තරඟකාරී ආයතනයක් වීම සඳහා සිය ක්‍රියාවලීන්හි ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණුකිරීම.

iii. දේශීය හා විදේශීය ඉදිකිරීම් වෙළඳපොළ තුළ මධ්‍යම ඉංජිනේරු සේවා (පෞද්) සමාගමෙහි වෙළඳපොළ කොටස වර්ධනය කරගැනීම.

iv. ව්‍යාපාර නවෝත්පාදනය සහ ව්‍යාපාර විවිධාංගීකරණය තුළින් සමාගමේ ස්ථාවරත්වය සංවර්ධනය කිරීම.

v. කාර්ය මණ්ඩලයේ තෘප්තිමත්භාවය, කණ්ඩායම් හැඟීම සහ ශාරීරික හා මානසික සෞඛ්‍යය ඉහළ නැංවීම.

vi. තිරසාර ඉදිකිරීම් භාවිතයෙහි ප්‍රමුඛයෙකු වීම සහ සමාගමේ සන්නාම ප්‍රතිරූපය වැඩිදියුණු කිරීම.

## ප්‍රගතිය 2025

**2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන් (රු. මිලි.750ට වැඩි)**

| අංක | ව්‍යාපෘති නාමය | සංශෝධිත කොන්ත්‍රාත් මුදල (රු. මිලියන) + වැට් බද්ද | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 1 | නාරංගල්ලේ තාක්ෂණික විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාලය සහ ගුරු පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම - අධ්‍යාපන අමාත්‍යාංශය කාර්ය පරාසය | 895.00 | 100 |
| 2 | වයඹ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය | 1986.32 | 100 |
| 3 | යෝජිත පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදිකිරීම - අදියර II, මහ රෝහල (ශික්ෂණ) - මහනුවර | 3068.23 | 43 |
| 4 | මහනුවර ශික්ෂණ රෝහලේ ඇටමිදුළු බද්ධ කිරීමේ මධ්‍යස්ථානය ඉදිකිරීම | 2858.71 | 35 |
| 5 | අනුරාධපුර හෙද පුහුණු පාසලේ අධ්‍යයන හා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම (මහල් 6) | 789.42 | 43 |
| 6 | යාපනයේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය (අදියර II) ශික්ෂණ ඒකකය ඉදිකිරීම | 2234.99 | 55 |
| 7 | යාපනයේ යෝජිත නගර ශාලාව ඉදිකිරීම | 2142.48 | 86 |
| 8 | ගාල්ල කරාපිටිය රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා දොළොස් මහල් ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම, නිම කිරීම සහ නඩත්තු කිරීම | 2626.76 | 39 |
| 9 | කරාපිටිය ශික්ෂණ රෝහලේ විශේෂ ළමා රෝග ඒකකයක් ඉදිකිරීම | 2915.76 | 20 |
| 10 | ගාල්ල කරාපිටිය රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලේ නව දස මහල් මහාචාර්ය වාට්ටු සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම, නිම කිරීම සහ නඩත්තු කිරීම | 2367.92 | 76 |
| 11 | කරාපිටිය ශික්ෂණ රෝහලේ මුඛ සෞඛ්‍යය ඒකකයක් ඉදිකිරීම - අදියර 1 | 1862.78 | 29 |

| අංක | ව්‍යාපෘති නාමය | සංශෝධිත කොන්ත්‍රාත් මුදල (රු. මිලියන) + වැට් බද්ද | ප්‍රගතිය (%) |
|---|---|---|---|
| 12 | නාරංගොල්ලේ තාක්ෂණික විෂය ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාලය සහ ගුරු පුහුණු මධ්‍යස්ථානය - KOICA කාර්ය පරාසය (බත්තරමුල්ල) | 1415.30 | 100 |
| 13 | කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ යෝජිත නීති පීඨ (FOL) ගොඩනැගිල්ලේ සැලසුම් සහ ඉදිකිරීම් කටයුතු | 786.81 | 100 |
| 14 | කොළඹ 12 හි අධිකරණ අමාත්‍යාංශ සංකීර්ණය ඉදිකිරීම | 8,580.68 | 2 |
| 15 | කොළඹ 12 මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණයේ සැලසුම්, ඉදිකිරීම් සහ අළුත්වැඩියා කටයුතු | 7,508.80 | 59 |
| 16 | කොළඹ 12 උපරිමාධිකරණ සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම | 2,026.91 | 41 |
| 17 | සෞඛ්‍යය අමාත්‍යාංශය සඳහා ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 10,995.81 | 53 |
| 18 | ලුනාව ප්‍රාදේශීය රෝහලෙහි යෝජිත පවුල් වෛද්‍ය සහ අතරමැදි ප්‍රතිකාර ඒකකය | 794.08 | 29 |
| 19 | රත්මලාන කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලයෙ - යෝජිත කළමනාකරණ, සමාජ විද්‍යා සහ මානව ශාස්ත්‍ර පීඨය සැලසුම් කිරීම සහ ඉදිකිරීම් කටයුතු | 820.41 | 100 |
| 20 | කළුතර මහ රෝහලේ වෛද්‍ය වාට්ටු සංකීර්ණය ඉදිකිරීම - අදියර II | 1926.29 | 28 |
| 21 | ජාතික ලේඛණාරාක්ෂක දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම සහ මධ්‍යම වායු සිසිලනය, ගිනි ආරක්ෂණය වැඩි දියුණු කරනලද වායු සිසිලනය සහ ආරක්ෂක පද්ධති ස්ථාපනය කිරීම - අදියර II | 1,308.07 | 20 |
| 22 | යෝජිත හෘද රෝග සත්කාර සංකීර්ණය ඉදිකිරීම - ශික්ෂණ රෝහල, රත්නපුර | 1254.00 | 24 |
| 23 | අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 1324.49 | 56 |
| 24 | බදුල්ල පළාත් මහ රෝහලේ දස මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 5955.09 | 19 |

2026 සඳහා යෝජිත / සැලසුම් කළ වැඩ

| අංක | ව්‍යාපෘති නාමය | සංශෝධිත කොන්ත්‍රාත් මුදල (රු. මිලියන) + වැට් බද්ද |
|---|---|---|
| 1 | අනුරාධපුර හෙද පුහුණු පාසලේ අධ්‍යයන හා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම (මහල් 6) | 789.42 |
| 2 | යාපනයේ යෝජිත නගර ශාලාව ඉදිකිරීම | 2142.48 |
| 3 | ගාල්ල කරාපිටිය රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා දොළොස් මහල් ගොඩනැගිලි සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම, නිම කිරීම සහ නඩත්තු කිරීම | 2626.76 |
| 4 | කරාපිටිය ශික්ෂණ රෝහලේ විශේෂ ළමා රෝග ඒකකයක් ඉදිකිරීම | 2915.76 |
| 5 | ගාල්ල කරාපිටිය රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා කරාපිටිය ශික්ෂණ රෝහලේ නව දස මහල් මහාචාර්ය වාට්ටු සංකීර්ණය සැලසුම් කිරීම, ඉදිකිරීම, අධීක්ෂණය, ක්‍රියාත්මක කිරීම, නිම කිරීම සහ නඩත්තු කිරීම | 2367.92 |
| 6 | කරාපිටිය ශික්ෂණ රෝහලේ මුඛ සෞඛ්‍ය ඒකකයක් ඉදිකිරීම - අදියර 1 | 1862.78 |
| 7 | කොළඹ 12 මහේස්ත්‍රාත් අධිකරණ සංකීර්ණයේ සැලසුම්, ඉදිකිරීම් සහ අළුත්වැඩියා කටයුතු | 7508.80 |
| 8 | අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 1324.49 |
| 9 | මොණරාගල දිස්ත්‍රික් මහ රෝහලේ ශල්‍ය වාට්ටු සහ ශල්‍යාගාර සංකීර්ණය ඉදිකිරීම | 2247.97 |
| 10 | බදුල්ල පළාත් මහ රෝහලේ දස මහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 5955.09 |
| 11 | යාපනයේ හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය (අදියර II) ශික්ෂණ ඒකකය ඉදිකිරීම | 2234.99 |

# වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය කොත්මලේ (KITI)

කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන ආයතනයකි. මෙම ආයතනය 2012 වර්ෂයේදී වාරිමාර්ග ක්ෂේත්‍රයට අවශ්‍ය ඉංජිනේරු සහකාරවරුන් සහ මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරින් පුහුණු කිරිම සඳහා ආරම්භ කරන ලදී.

වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනය යනු තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) ලියාපදිංචි ආයතනයක් වන අතර, පූර්ණකාලීන ඩිප්ලෝමා වැඩසටහන් මඟින් ජාතික වෘත්තීය සුදුසුකම් 6වන මට්ටමේ (NVQ 6) සුදුසුකම් ලබා දෙයි. මෙම ආයතනය රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා සේවාස්ථ පුහුණු ලබා දෙමින්, ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිතින්ට අනුකූලව ජල අංශයේ අධ්‍යාපනය සහ කුසලතා සංවර්ධනය සඳහා ප්‍රමුඛ මධ්‍යස්ථානයක් විමට උත්සහකරනු ලබයි.

**දැක්ම**

හෙට දවස උදෙසා විශිෂ්ට වාරි තාක්ෂණවේදින්

**මෙහෙවර**

දැනුමෙන් පමණක් නොව ආචාරවත් හැසිරීම් හා සාරධර්ම රකින නිපුණ වාරිමාර්ග ක්ෂේත්‍රයේ වෘත්තිකයන් බිහිකිරිම

**අරමුණු**

- වෙනස්වන තාක්ෂණික අධ්‍යාපනයට අවශ්‍ය වෘත්තීය හා දිගුකාලීන අධ්‍යාපනය ලබා දෙන ආයතනයක් ලෙස ක්‍රියාකාරීව දායක වීම.
- දියුණුව, නවෝත්පාදනය, නිර්මාණශීලිත්වය වැඩිදියුණු කිරිම සහ පරිසර හිතකාමී පරිසරයක් පවත්වා ගැනිම සඳහා අවස්ථා ලබාදීම.
- වෘත්තීය අවස්ථා සඳහා කර්මාන්ත, ව්‍යාපාර සහ ප්‍රජාව සමඟ ක්‍රියාකාරි සහයෝගීතාවයක් සකස් කිරිම මඟින් තරුණ තරුණියන් සඳහා සමාජ - ආර්ථික මාර්ග සහ අවස්ථා වැඩිදියුණු කිරිම.

**ප්‍රධාන කාර්යයන්**

i. අධ්‍යයන හා කර්මාන්ත ප්‍රමිතීන් සපුරාලීම සඳහා වාරිමාර්ග හා ඉදිකිරීම් තාක්ෂණයේ උසස් ජාතික ඩිප්ලෝමා වැඩසටහන් පැවැත්වීම.

ii. අදාළ තාක්ෂණික ක්ෂේත්‍රවල වෘත්තිකයන් සඳහා සේවාස්ථ සහ කෙටි කාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම.

iii. අඛණ්ඩ වැඩිදියුණු කිරීම සඳහා ISO 21001: 2018 තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම.

iv. ආයතනික පහසුකම් සහ පුහුණු සම්පත් ඵලදායි ලෙස කළමනාකරණය කිරීම සහ වැඩිදියුණු කිරීම.

## 2025 වසර තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන්

### 01. සේවාස්ථ පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය

| අනු අංකය | වැඩ සටහනේ නම (සේවාලාභී ආයතනය) | පාඨමාලා කාල සීමාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආදායම රු. (මිලි.) | රජයේ ආදායම මුදල රු. (මිලි.) |
|---|---|---|---|---|---|
| 1 | SEI විශ්ව විද්‍යාලය | 2025.01.10 සිට 2025.01.13 | 48 | 0.493 | 0.240 |
| 2 | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය | 2025.01.18 සිට 2025.01.26 | 44 | 1.167 | 0.559 |
| 3 | යාපනය විශ්ව විද්‍යාලය | 2025.02.22 සිට 2025.02.23 | 57 | 0.035 | 0.035 |
| 4 | නියෝජ්‍ය වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලය - ත්‍රිකුණාමලය | 2025.02.20 සිට 2025.02.22 | 30 | 0.485 | 0.213 |
| 5 | රුහුණ විශ්ව විද්‍යාලය | 2025.03.18 සිට 2025.03.20 | 56 | 0.056 | 0.056 |
| 6 | වාරිමාර්ග කළමනාකරණ අංශය | 2025.04.02 සිට 2025.04.04 | 60 | 0.370 | 0.183 |
| 7 | උසස් තාක්ෂණ ආයතනය - යාපනය | 2025.05.26 සිට 2025.05.30 | 51 | 1.257 | 0.504 |
| 8 | දෙහිවල මධ්‍ය මහා විද්‍යාලය | 2025.05.30 | 33 | 0.040 | 0.023 |
| 9 | මොරටුව විශ්ව විද්‍යාලය | 2025.06.26 සිට 2025.07.01 | 147 | 2.441 | 0.834 |
| 10 | SEI විශ්ව විද්‍යාලය | 2025.07.10 සිට 2025.07.13 | 24 | 0.252 | 0.125 |
| 11 | කොළඹ විශ්ව විද්‍යාලය - ශ්‍රීපාලි මණ්ඩපය | 2025.08.02 සිට 2025.08.03 | 12 | 0.036 | 0.017 |
| 12 | වාරිමාර්ග කළමනාකරණ අංශය | 2025.08.13 සිට 2025.08.14 | 23 | 0.122 | 0.002 |
| 13 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | 2025.08.18 සිට 2025.08.29 | 154 | 2.355 | 0.969 |

| අනු අංකය | වැඩ සටහනේ නම (සේවාලාභී ආයතනය) | පාඨමාලා කාල සීමාව | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | ආදායම රු. (මිලි.) | රජයේ ආදායම මුදල රු. (මිලි.) |
|---|---|---|---|---|---|
| 14 | ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය | 2025.09.01 සිට 2025.09.12 | 89 | 1.130 | 0.839 |
| 15 | වාරිමාර්ග කළමනාකරණ අංශය | 2025.10.13 සිට 2025.10.15 | 41 | 0.269 | 0.141 |
| 16 | පරිවාස හා ළමා ආරක්ෂණ දෙපාර්තමේන්තුව | 2025.10.24 සිට 2025.10.25 | 52 | 0.292 | 0.141 |
| 17 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2025.10.31 සිට 2025.11.01 | 35 | 0.018 | 0.064 |
| 18 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව පළාත | 2025.11.05 සිට 2025.11.06 | 57 | 0.172 | 0.093 |
| 19 | අධ්‍යාපන දෙපාර්තමේන්තුව - මධ්‍යම පළාත | 2025.11.19 සිට 2025.11.20 | 70 | හිඟ ගෙවීම් | |
| 20 | ලලිත් ඇතුලත්මුදලි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය | 2025.11.21 සිට 2025.11.23 | 64 | 0.418 | 0.188 |
| 21 | වාරිමාර්ග කළමනාකරණ අංශය (ව්‍යාපෘති කළමනාකරණ) | 2025.11.25 සිට 2025.11.27 | 50 | 0.459 | 0.214 |
| 22 | වාරිමාර්ග කළමනාකරණ අංශය - රියදුරු | 2025.11.25 සිට 2025.10.28 | 40 | 0.342 | 0.146 |
| 23 | ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2025.12.11 සිට 2025.12.13 | 25 | 0.089 | 0.042 |
| 24 | හුරුළු වැව ව්‍යාපෘතිය | 2025.07.11 සිට 2025.07.15 | 47 | 0.273 | 0.086 |
| **එකතුව** | | | | **12.57** | **5.715** |

**02. කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්වල ප්‍රගතිය**

| | සංරචක / ක්‍රියාකාරකම් / පාඨමාලාව | කාල සීමාව | ප්‍රතිපාදන (රු.මිලි.) | මූල්‍ය ප්‍රගතිය | පුහුණුලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | | | | | ඉලක්කය | සහභාගිත්වය |
| 1. | උසස් ජාතික ඩිප්ලෝමාව - වාරි තාක්ෂණය (6 වන කණ්ඩායම) | වසර 03 | 7.00 | 5.97 | 50 | 36 |
| 2. | උසස් ජාතික ඩිප්ලෝමාව - වාරි තාක්ෂණය (7 වන කණ්ඩායම) | වසර 03 | 7.00 | 6.08 | 50 | 20 |

| | සංරචක / ක්‍රියාකාරකම් / පාඨමාලාව | කාල සීමාව | ප්‍රතිපාදන (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය | පුහුණුලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | | | | | ඉලක්කය | සහභාගිත්වය |
| 3. | උසස් ජාතික ඩිප්ලෝමාව - වාරි තාක්ෂණය (8 වන කණ්ඩායම) | වසර 03 | 4.00 | 2.23 | 50 | 19 |
| 4. | QMS පුහුණුව | | 1.65 | 0.05 | 25 | 25 |
| 5. | කාර්ය මණ්ඩල පුහුණුව | | 0.25 | | | |
| | 5.1 මහජන ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සහ භාවිතය | දින 10 | | 0.119 | 05 | 05 |
| | 5.2 සාමාන්‍ය හැසිරීම සහ විනය | දින 01 | | 0.032 | 30 | 28 |
| | 5.3 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ | දින 01 | | 0.048 | 30 | 30 |
| එකතුව | | | **19.90** | **14.529** | **240** | **163** |

## 2026 සඳහා යෝජිත / සැලසුම් කළ වැඩ

### 01. යෝජිත සේවාස්ථ පුහුණු වැඩසටහන්

| | සංරචක/ ක්‍රියාකාරකම්/ පාඨමාලාව | පාඨමාලා කාලය | සහභාගිත්වය - ඉලක්කය |
|---|---|---|---|
| 01 | SEI විශ්ව විද්‍යාලය | දින 03 | 50 |
| 02 | ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය | දින 10 | 60 |
| 03 | උසස් තාක්ෂණ ආයතනය - ATI | දින 05 | 60 |
| 04 | යාපනය විශ්ව විද්‍යාලය | දින 02 | 30 |
| 05 | රුහුණ විශ්ව විද්‍යාලය | දින 02 | 50 |
| 06 | උසස් තාක්ෂණ ආයතනය - යාපනය | දින 05 | 50 |
| 07 | මොරටුව විශ්ව විද්‍යාලය | දින 08 | 60 |
| 08 | පේරාදෙණිය විශ්ව විද්‍යාලය | දින 10 | 100 |
| 09 | විවෘත විශ්ව විද්‍යාලය | දින 10 | 80 |
| 10 | වාරිමාර්ග කළමනාකරණ අංශය | දින 03 | 50 |
| 11 | ශ්‍රීලංකා මහවැලි අධිකාරිය | දින 02 | 45 |

**02. යෝජිත කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන්**

| | සංරචක/ ක්‍රියාකාරකම්/ පාඨමාලාව | වෙන් කිරීම් (රු. මිලි) | අභ්‍යාසලාභීන් සංඛ්‍යාව - ඉලක්කය |
|---|---|---|---|
| 1 | උසස් ජාතික ඩිප්ලෝමාව - වාරි තාක්ෂණය (6 වන කණ්ඩායම) | 9.31 | 36 |
| 2 | උසස් ජාතික ඩිප්ලෝමාව - වාරි තාක්ෂණය (7 වන කණ්ඩායම) | 10.654 | 20 |
| 3 | උසස් ජාතික ඩිප්ලෝමාව - වාරි තාක්ෂණය (8 වන කණ්ඩායම) | 9.04 | 19 |
| 4 | උසස් ජාතික ඩිප්ලෝමාව - වාරි තාක්ෂණය (9 වන කණ්ඩායම) | 2.54 | 50 |
| 5 | QMS පුහුණුව | 2.95 | 30 |
| 6 | කාර්ය මණ්ඩල පුහුණුව | 0.934 | 30 |
| **එකතුව** | | **35.428** | **185** |

# මහවැලි උපදේශක කාර්යාංශය (MCB)

**දැක්ම**

දුප්පත්භාවයෙන් නිදහස් වූ ශ්‍රී ලංකාවක් දර්ශනය කරමින්, තිරසාර පෘථිවියක් මත ප්‍රමුඛ හරිත ජාතියක් ලෙස උද්ගත වීමත්, දකුණු ආසියානු කලාපය තුළ හරිත ප්‍රවේශයන්ගේ තිරසාරත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා සක්‍රීයව දායක වීමත් අපගේ දැක්ම වේ.

**මෙහෙවර**

ජීවයට හිතකර පෘථිවියක් සුරක්ෂිත කරමින්, ශ්‍රී ලංකාව තුළ පවතින අන්ත දිළිඳුකම තුරන් කිරීම සහ පොදු සෞභාග්‍යය ප්‍රවර්ධනය කිරීමට සීමිත කාලයක් තුළ ප්‍රබල සංවර්ධනයක් කරා ගමන් කිරීම සඳහා නව උපායමාර්ගික ප්‍රවේශයක් සකස් කිරීම.

**අරමුණු**

- ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම (Building Resilience) : සියලුම ව්‍යාපෘති මගින් ශ්‍රී ලංකාවට තිරසාර සහ සෞභාග්‍යමත් අනාගතයක් සහතික කිරීම
- තිරසාර සංවර්ධනය (Sustainable Development) : මහවැලි උපදේශක කාර්යාංශයේ උපදේශන සේවාවන්හි සෑම අංශයකටම අති නවීන තාක්ෂණික නවෝත්පාදනයන් ඒකාබද්ධ කරමින්, තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.

- නවෝත්පාදනය (Innovation) : නව්‍ය, තිරසාර සහ ප්‍රබල ප්‍රතිඵල ලබා දීම සඳහා පෙරළිකාර අදහස් සහ දියුණු තාක්ෂණික විසඳුම් මගින් ප්‍රගතිය කරා මෙහෙයවීම.
- විශිෂ්ටත්වය (Excellence) : ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ඉහළ ගුණාත්මකභාවයෙන් යුත් ප්‍රතිඵල ලබා දීම සඳහා උසස් මට්ටමේ උපදේශක මණ්ඩලයක ගුණාත්මකභාවය අඛණ්ඩව පවත්වා ගැනීම
- සහයෝගීතාව (Collaboration) : සමූහික සාර්ථකත්වය සහ තිරසාර වර්ධනයක් කරා මෙහෙයවීම සඳහා රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය සහ ජාත්‍යන්තර විශේෂඥයන් සමඟ හවුල්කාරිත්වයෙන් කටයුතු කරමින් සහයෝගී ප්‍රයත්නයන් (Synergy) වර්ධනය කිරීම.

## ප්‍රධාන කාර්යයන්/ ක්ෂේත්‍ර

i. පාරිසරික ඇගයීම්
ii. උපාය මාර්ගික පාරිසරික ඇගයීම් (SEA)
iii. සමාජ බලපෑම් ඇගයීම් (SIAs)
iv. නැවත පදිංචි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් (RAPs)
v. ඩිජිටල් කෘෂිකර්මය
vi. වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති සඳහා මිනිස්බල සැපයුම සඳහා බඳවා ගැනීම
vii. කෘෂිකර්මය, ආහාර, සොබාදහම සහ ග්‍රාමීය සංවර්ධනය
viii. දේශගුණික විපර්යාස, ඔරොත්තු දීමේ හැකියාව සහ පරිසරය
ix. බලශක්තිය
x. රාජ්‍ය අංශයේ කළමනාකරණය සහ පාලනය
xi. රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය
xii. මානව හා සමාජ සංවර්ධනය
xiii. තිරසාර සංවර්ධන ඉලක්ක
xiv. ජලය සහ නාගරික සංවර්ධනය
xv. පාරිසරික උපදේශනය
xvi. දැනුම කළමනාකරණය සහ ධාරිතා ගොඩනැගීම
xvii. ජල ඉංජිනේරු විද්‍යාව සහ උපදේශනය
xviii. අපනයන කෘෂිකර්මය සහ අගය දාම වැඩිදියුණු කිරීම

## 2025 තුළ ක්‍රියාත්මක කළ වැඩසටහන

| # | සපයන ලද සේවා | ඉටු කරන ලද ක්‍රියාකාරකම් | සේවා සපයන ආයතනය | වෙන් කළ ප්‍රතිපාදන (රු. මිලි) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික (%) | මූල්‍යමය (රු. මිලි) |
| 1 | බලපෑම් ඇගයීම | පූර්ව පාරිසරික පරීක්ෂණය (IEE): අම්පාර දිස්ත්‍රික්කයේ යෝජිත ගල්ගේකන්ඩිය ජලාශ ව්‍යාපෘතිය | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 3.63 | 85 | 3.09 |
| | | පාරිසරික බලපෑම් ඇගයීම (EIA): යෝජිත ගිං-නිල්වලා හැරවුම් ව්‍යාපෘතිය | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - වාරිමාර්ග අංශය | 38.85 | 90 | 15.54 |
| | | පාරිසරික බලපෑම් ඇගයීම (EIA): මා ඔය ද්‍රෝණියේ යෝජිත යටිමහන ජලාශ ව්‍යාපෘතිය | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 5.81 | 90 | 5.24 |
| 2 | ශක්‍යතා අධ්‍යයනයන් | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහනේ (MWSIP) දෙවන අදියර යටතේ වාණිජ කෘෂිකාර්මික සංවර්ධනය (CAD) සඳහා වූ පූර්ව ශක්‍යතා අධ්‍යයනය | කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය - වාරිමාර්ග අංශය | 8.52 | 100 | 5.95 |
| මහවැලි උපදේශක සේවා කාර්යාංශය විසින් සපයනු ලබන විශේෂ සේවාවන් | | | | | | |
| 1 | සම්මත මෙහෙයුම් පටිපාටි (SOP) සකස් කිරීම | මල්වතු ඔය, යාන් ඔය සහ මී ඔය ගංගා ද්‍රෝණි සඳහා ගංවතුර කළමනාකරණ සම්මත මෙහෙයුම් පටිපාටි (SOPs) සකස් කිරීමේ සහායක සේවා | වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය | 16.92 | 100 | 13.28 |
| 2 | මැනුම් කටයුතු සහ සීමා නිර්ණය කිරීම | අනුරාධපුරය, වවුනියාව, කුරුණෑගල, පුත්තලම, මන්නාරම, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල තෝරාගත් එල්ලංගාවල (Cascades) ගම්මාන වාරි පද්ධතිවලට අයත් රක්ෂිත ප්‍රදේශ මැනීම සහ සීමා නිර්ණය කිරීමේ සේවාවන් | වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය | 283.45 | 88% | 250 |

| # | සපයන ලද සේවා | ඉටු කරන ලද ක්‍රියාකාරකම් | සේවා සපයන ආයතනය | වෙන් කළ ප්‍රතිපාදන (රු. මිලි) | ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | භෞතික (%) | මූල්‍යමය (රු. මිලි) |
| 3 | ඩිජිටල් පද්ධති ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම | වියළි කලාපීය ගොවීන් සඳහා කාලගුණ උපදේශන පද්ධතියක් ස්ථාපිත කිරීමේ කාර්යයට සහාය වීම පිණිස ඩිජිටල් පද්ධතිය ශක්තිමත් කිරීමේ සහායක සේවා | වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය | 75.85 | 90 | 53.10 |

- මෙම ව්‍යාපෘතිවල ඉතිරි වැඩකටයුතු 2026 වර්ෂය තුළදී ද අඛණ්ඩව ක්‍රියාත්මක වේ.

**2026 වසර සඳහා යෝජිත වැඩසටහන**

මහවැලි උපදේශක කාර්යාංශය (MCB), 2026 වසරේදී තම ආයතනික මෙහෙයුම්, ව්‍යාපාර සංවර්ධන කටයුතු සහ අභ්‍යන්තර ශක්තිමත් කිරීමේ මුලපිරීම්, ප්‍රධාන 'මූලෝපායික වැඩසටහන්' (Strategic Programmes) හයක් (06) පදනම් කරගනිමින් ව්‍යුහගත කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. මෙය ආයතනයේ මූලික ක්‍රියාත්මක කිරීමේ රාමුව (Implementation Framework) ලෙස නිල වශයෙන් හඳුනාගෙන තිබේ. මෙම මූලෝපායික වැඩසටහන් සමූහය, වසර පුරා මහවැලි උපදේශක කාර්යාංශයේ සේවා සැපයීම, ආදායම් උත්පාදනය, නවෝත්පාදන, පාලන පද්ධති නංවාලීම සහ සමාජීය මැදිහත්වීම් සඳහා මගපෙන්වනු ඇත. එමගින් ජාතික සංවර්ධන ප්‍රමුඛතා සහ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශයේ විෂය පථය (Mandate) සමඟ සමපාත වීම සහතික කෙරේ. මෙම මූලෝපායික වැඩසටහන් සැලසුම් කර ඇත්තේ ඒකාබද්ධ වැඩසටහන්මය ආධාරක (Integrated Programmatic Pillars) ලෙස ක්‍රියා කිරීමට වන අතර, ඒ සෑම එකක් සඳහාම නිශ්චිත අරමුණු, නායකත්ව වගකීම්, ඉලක්ක සැකසීමේ යාන්ත්‍රණයන් සහ කාර්ය සාධන අධීක්ෂණ විධිවිධාන ඇතුළත් වේ. මෙම ව්‍යුහගත ප්‍රවේශය හරහා 2026 වසර තුළ සියලුම ක්‍රියාකාරී අංශයන්හි ක්‍රමානුකූල ක්‍රියාත්මක කිරීම, වගවීම සහ මැනිය හැකි ප්‍රතිඵල සහතික කිරීම මහවැලි උපදේශක කාර්යාංශය අපේක්ෂා කරයි.

1. **ලංසු තැබීමේ වැඩසටහන හරහා ව්‍යාපාරික අවස්ථා ගවේෂණය කිරීම (**Business Opportunity Exploration through Bidding Programme)
    - ජාතික සහ ජාත්‍යන්තර ලංසු තැබීමේ ක්‍රියාවලීන් හරහා තරඟකාරී උපදේශන අවස්ථාවන් හඳුනා ගැනීමට සහ ඒවා දිනා ගැනීමට ඇති මැදිහත්වීම තීව්‍ර කිරීමට සැලසුම් කර ඇත.
    - මහවැලි උපදේශක කාර්යාංශයෙහි වෙළඳපොළ පැවැත්ම ශක්තිමත් කිරීම, උපදේශන සේවා පුළුල් කිරීම සහ තරඟකාරී කොන්ත්‍රාත්තු අත්පත් කර ගැනීම හරහා ආයතනික ආදායම් උත්පාදනය ඉහළ නැංවීම මෙමගින් අපේක්ෂා කෙරේ.

**2. දායකත්ව ආයතන (Donors) හරහා අරමුදල් රැස්කිරීමේ යෝජනාවලි සංවර්ධන වැඩසටහන** (Fundraising Proposal Development Programme through Donors)

- ද්විපාර්ශ්වික (Bilateral), බහුපාර්ශ්වික (Multilateral) සහ සංවර්ධන හවුල්කරුවන්ගේ අරමුදල් අවස්ථාවන් ඉලක්ක කරගත් ව්‍යුහගත යෝජනාවලි සංවර්ධන වැඩසටහනක් හරහා තම දායකත්ව මැදිහත්වීම සහ අරමුදල් රැස්කිරීමේ ධාරිතාව ශක්තිමත් කිරීම.
- සැලසුම්ගත ක්‍රියාකාරකම් අතරට දායකත්ව ආයතනවල ප්‍රමුඛතාවන් හඳුනා ගැනීම, සංකල්ප සටහන් (Concept Notes) සහ පූර්ණ ව්‍යාපෘති යෝජනාවලි සකස් කිරීම සහ බාහිර මූල්‍ය සම්පත් ලබා ගැනීම සඳහා අරමුදල් සපයන ආයතන සමඟ සම්බන්ධ වීම ඇතුළත් වේ.
- ජාතික ප්‍රමුඛතාවන්ට අනුකූල සංවර්ධන මූලපිරීම් ක්‍රියාත්මක කිරීමට සහාය වීම මෙන්ම මහවැලි උපදේශක සේවා කාර්යංශයෙහි අරමුදල් පදනම විවිධාංගීකරණය කරමින් දිගුකාලීන මූල්‍ය තිරසාරභාවය සහතික කිරීම ද මෙමගින් අපේක්ෂා කෙරේ.

3. **ව්‍යවසායකත්ව හවුල්-සංවර්ධන වැඩසටහන** (Entrepreneurship Co-Development Programme)

- නවෝත්පාදනය පදනම් කරගත් ව්‍යාපාරික ආකෘති සහ සහයෝගීතා ව්‍යාපාර (Collaborative Ventures) ප්‍රවර්ධනය කිරීම සඳහා ව්‍යවසායකත්ව හවුල්-සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම.
- තාක්ෂණික මගපෙන්වීම්, උපදේශනය, ශක්‍යතා අධ්‍යයනයන් සහ හවුල්කාරිත්වයන් සඳහා පහසුකම් සැලසීම හරහා සාර්ථක ව්‍යාපාරික අදහස් හඳුනා ගැනීමට සහ ඒවා හවුලේ සංවර්ධනය කිරීමට සහායවේ.
- තිරසාර ව්‍යාපාර බිහි කිරීමට දායක වීම, මහවැලි උපදේශක කාර්යාංශයෙහි මෙහෙයුම් ක්ෂේත්‍රයන් තුළ නවෝත්පාදන දිරිමත් කිරීම සහ පුළුල් ආර්ථික සංවර්ධන අරමුණු සඳහා සහාය වීම මෙහි අරමුණයි

4. **පාලන පද්ධති වැඩිදියුණු කිරීම සහ ආයතනික ප්‍රතිරූපය සංවර්ධනය කිරීමේ වැඩසටහන** (Governance Improvement and Profile Development Programme)

- ඉලක්කගත පාලන පද්ධති වැඩිදියුණු කිරීම සහ ප්‍රතිරූපය සංවර්ධනය කිරීමේ මැදිහත්වීම් හරහා ආයතනය ශක්තිමත් කිරීම.
- සැලසුම් කර ඇති කාර්යයන් අතරට කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගවීම ඉහළ නැංවීම සඳහා අභ්‍යන්තර පද්ධති, මාර්ගෝපදේශ, අත්පොත් සහ මෙහෙයුම් යාන්ත්‍රණයන් සංවර්ධනය කිරීම සහ පිරිපහදු කිරීම ඇතුළත් වේ.
- පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වීම, දෘශ්‍යමාන වීමේ මූලපිරීම් සහ ආයතනික ජයග්‍රහණ ව්‍යුහගත ලෙස සන්නිවේදනය කිරීම මගින් මහවැලි උපදේශක සේවා කාර්යාංශයෙහි

ආයතනික ප්‍රතිරූපය නැංවීම කෙරෙහි අවධානය යොමු කරන අතර, එමගින් සේවාදායකයින් සහ හවුල්කරුවන් අතර විශ්වාසය සහ විශ්වසනීයත්වය ශක්තිමත් කරනු ඇත.

5. **නව්‍ය ව්‍යාපාරික සංකල්ප සංවර්ධන වැඩසටහන** (Innovative Business Concepts Development Programme)

- 'නව්‍ය ව්‍යාපාරික සංකල්ප සංවර්ධන වැඩසටහන' හරහා අභ්‍යන්තර නවෝත්පාදන මධ්‍යස්ථානයක් (Internal Innovation Hub) ලෙස ක්‍රියා කිරීමට මහවැලි උපදේශක සේවා කාර්යාංශය සැලසුම් කරයි.
- නැගී එන ක්ෂේත්‍රීය අවශ්‍යතා සහ වෙළඳපොළ ප්‍රවණතාවන්ට ගැළපෙන නව ව්‍යාපාරික සංකල්ප උත්පාදනය කිරීම, ඒවා පිරික්සීම සහ නියමු ව්‍යාපෘති ලෙස ක්‍රියාත්මක කිරීම කෙරෙහි මෙම වැඩසටහන අවධානය යොමු කරයි.
- තෝරාගත් මුලපිරීම් අනාගත ව්‍යාපාරික සැලසුම් සමඟ ඒකාබද්ධ කිරීම සඳහා හෝ මහා පරිමාණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම් කිරීමේ අරමුණින්, ව්‍යුහගත අදහස් ජනනය කිරීම, මූලික ශක්‍යතා විශ්ලේෂණය සහ සංකල්ප වලංගුකරණය වැනි ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත.
- මහවැලි උපදේශක සේවා කාර්යාංශයෙහි දිගුකාලීන අනුවර්තනය වීමේ හැකියාව සහ තරඟකාරිත්වය ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

**6. ආයතනික සමාජ වගකීම්** (CSR and Business Development Programme)

- ආයතනික සමාජ වගකීම් (CSR) සහ ව්‍යාපාර සංවර්ධන අරමුණු එකිනෙක ඒකාබද්ධ කිරීමට අදහස් කරයි.
- ප්‍රමුඛ පෙළේ සමාජීය සහ පාරිසරික අවශ්‍යතා සඳහා විසඳුම් ලබා දෙන අතරම, පාර්ශවකරුවන් අතර සබඳතා, ආයතනික දෘශ්‍යමානභාවය සහ මහජන විශ්වාසය ශක්තිමත් කරනු ඇත.
- තිරසාර සංවර්ධන ප්‍රතිඵල සඳහා අර්ථවත් දායකත්වයක් ලබා දෙන අතරම, මහවැලි උපදේශක සේවා කාර්යාංශයෙහි පුළුල් මූලෝපායික ස්ථාවරත්වය (Strategic Positioning) තහවුරු කිරීම ද සහතික කෙරේ

## 2.1.3. ඉදිරි ඉලක්ක

| | වැඩසටහන / ව්‍යාපෘතිය | 2026 ප්‍රතිපාදන වෙන්කිරිම (රු.මි.) | 2025 වර්ෂයේ සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 ඉලක්ක |
|---|---|---|---|---|---|
| 01. | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන (MWSIP) - අදියර I සහ II | 29,000.00<br>අදියර II | 35.5 % | 36.3% | • UECP-ICB-2A පැකේජයේ ඉතිරිව ඇති වැඩ නිම කිරීම, ආසන්න වශයෙන් කිලෝමීටර 2.5 ක උමං කැණීම් සහ උමං කැණීමේ යන්ත්‍ර (TBM - Tunnel Boring Machine) දෙක විසුරුවා හැරීම ඇතුළුව.<br>• මිනිපේ - 6 පැකේජය සම්පූර්ණ කර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත භාරදීම.<br>• PMSC, උතුරු මැද පළාත් මහ ඇළ NCPCP-3 සහ NCPCP-4 පැකේජ සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම සහ කොන්ත්‍රාත්කරුවන්ට 20% ක අත්තිකාරමක් ගෙවීම. |
| 02 | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | 1,270.00 | 99.98% | 100% | • ව්‍යාපෘති කටයුතු සඳහා තාවකාලිකව ආනයනය කරන ලද භාණ්ඩ** ප්‍රතිඅපනයනය කිරීම (re-export)<br>• ඉතිරි සුළු වැඩ කොටස් නිම කිරීම |
| 03. | මොරගහකන්ද සහ කළුගඟ ජලාශ | 80.00 | 99.93% | 100% | • ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන්ව ව්‍යාපෘති කාර්යාලය වසා ඇත.<br>• ලග්ගල, ඇළහැර, නාඋල, මැදිරිගිරිය සහ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආශ්‍රිතව අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමේ කටයුතු සිදුකරනු ලබයි |
| 04. | දේශගුණික බලපෑම් අවම කිරීමේ බහුඅදියර වැඩසටහන (CResMPA) | 9,150.00 | 70% | 85% | • පහත අංශ වැඩිදියුණු කිරීම<br>- ඉහළ බලපෑම් ඇති කාලගුණික හා ජලවිද්‍යාත්මක අනතුරු පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් පද්ධති<br>- දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සඳහා කැළණි ද්‍රෝණියේ බහුකාර්ය ජල යටිතල පහසුකම් |

| | වැඩසටහන / ව්‍යාපෘතිය | 2026 ප්‍රතිපාදන වෙන්කිරිම (රු.මි.) | 2025 වර්ෂයේ සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 ඉලක්ක |
|---|---|---|---|---|---|
| | | | | | • දිස්ත්‍රික්ක 25 ක ක්‍රියාත්මක කර ඇති සියලුම වාරිමාර්ග පුනරුත්ථාපන කටයුතු සම්පූර්ණ කිරීම<br>• දිට්වා සුළි කුණාටුවෙන් හානි වූ වත්කම් සම්බන්ධයෙන් හදිසි අවස්ථා ප්‍රතිචාර සංරචකය (CERC – Contingency Emergency Response Component) යටතේ හඳුනාගත් සම්පූර්ණ පුනරුත්ථාපන පැකේජය |
| 05 | ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP) | 5,100.00 | 81.87 % | 91.76 % | • ක්ෂුද්‍ර ජල පෝෂක සැලසුම් 218 ක් නුවර, නුවරඑළිය සහ බදුල්ල යන දිස්ත්‍රික්ක සඳහා සැදීම.<br>• පාතහේවාහැට, දෙල්තොට, හගුරන්කෙත හා මතුරට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි හඳුනාගත් ක්‍රියාකාරකම්, ඉහළ මහවැලි ජලපෝශක ප්‍රදේශය ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කිරිම.<br>• භූගත ජල කළමනාකරණ සැලසුම් 04 ක් හඳුනාගත් ගංගා ද්‍රෝණි සඳහා සැකසීම.<br>• ජල කළමනාකරණ කාර්යාංශය සඳහා VISTA මොඩියුලය තොග වශයෙන් ජලය බෙදා වෙන් කිරීම.<br>• ජල සම්පත් ප්‍රතිපත්තිය සාදා නිම කිරිම.<br>• වාරිමාර්ග දෙපාර්තමේන්තුව - වැඩ කොන්ත්‍රාත් 11 ක් ක්‍රියාවේ නැංවීම.<br>• ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය - වැඩ කොන්ත්‍රාත් 16 ක් ක්‍රියාවේ නැංවීම.<br>• උතුරු පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව - වැඩ කොන්ත්‍රාත් 07ක් ක්‍රියාවට නැංවීම.<br>• නැගෙනහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව - වැඩ කොන්ත්‍රාත් 10ක් ක්‍රියාවට නැංවීම. |

| | වැඩසටහන / ව්‍යාපෘතිය | 2026 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.) | 2025 වර්ෂයේ සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 ඉලක්ක |
|---|---|---|---|---|---|
| | | | | | • කුඩා හා මධ්‍ය පරිමාණ වාරිමාර්ග යටිතල පහසුකම් පුනරුත්ථාපන කටයුතු ප්‍රතිඅරමුණුගත කිරීමේ ක්‍රියාකාරකම් (ඇ.ඩො. මිලි. 10) යටතේ වැඩ කොන්ත්‍රාත්තු ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් කළමනාකරණය (වැඩ පැකේජ 760ක පමණ කටයුතු අවසන් කර ඇත).<br>• හදිසි අවස්ථා ප්‍රතිචාර සංරචකය (CERC) යටතේ රු. මිලි.1,730ක වටිනාකමින් යුත් වැඩ පැකේජ 18ක් සහ රු. මිලි. 70.5 වටිනාකමින් යුත් උපදේශන සේවා පැකේජ 4 ක් ද 2026 වර්ෂය තුළ ක්‍රියාත්මකවේ. |
| 06. | නකල්ස් කඳුවැටියේ අවදානමට ලක්ව ඇති ගංගා ද්‍රෝණි, දිය ඇළි ආශ්‍රිත ප්‍රදේශ සහ පහළ ජල පෝෂක ප්‍රදේශයේ වාසය කරන ගොවීන් සහ වැවිලි ප්‍රජාවගේ දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ ශක්තිය වැඩි දියුණු කිරීම (හරිත දේශගුණික අරමුදල) GCF Knuckles | 3,250.00 | 19.35% | 47% | 2026 වසර සඳහා යෝජිත ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත්තේ පරිසර පද්ධති ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම, කෘෂිකාර්මික ඵලදායිතාව වැඩිදියුණු කිරීම සහ ව්‍යාපෘති ප්‍රදේශය තුළ ප්‍රජා අනුවර්තන හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා ය. ක්‍රියාකාරකම් පහත පරිදි ප්‍රධාන තේමාත්මක සංරචක යටතේ සඳහන් කර ඇත.<br>**1. පරිසර පද්ධති සහ ජල පෝෂක ප්‍රතිස්ථාපනය**<br>• ජෛවමය සහ ව්‍යුහාත්මක ක්‍රියාමාර්ග හරහා හෙක්ටයාර 2,000ක ඇළ දොළ, ගංගා ඉවුරු සංරක්ෂණය කිරීම.<br>• ඉහළ අවදානම් ප්‍රදේශවල මාර්ග දෙපස කිලෝමීටර 5ක ජලාපවහන පද්ධති සංවර්ධනය කිරීම.<br>• සහභාගීත්ව ප්‍රවේශයක් හරහා වාරිමාර්ග ජාල 10ක්, ග්‍රාමීය වැව් 20ක්, පොකුණු 15ක් සහ කුඩා වේලි (Check Dams) පුනරුත්ථාපනය කිරීම. |

| | වැඩසටහන / ව්‍යාපෘතිය | 2026 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.) | 2025 වර්ෂයේ සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 ඉලක්ක |
|---|---|---|---|---|---|
| | | | | | • හුදකලා කුඩා වනාන්තර කොටස් අතර හිඩැස් සිටුවීමෙන් හෙක්ටයාර 100 ක් සම්බන්ධ කිරීම සහ හායනය වූ ඉඩම් ප්‍රතිසංස්කරණය සිදුකිරීම.<br>• භූ දර්ශන සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම සඳහා කිලෝමීටර 10ක පාරිසරික තීරු සලකුණු කර ස්ථාපිත කිරීම.<br>• වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හරහා ආක්‍රමණශීලී ආගන්තුක ශාක විශේෂ ඉවත්කිරීම සහ තෘණ බිම් ප්‍රතිෂ්ඨාපනය කිරීම හරහා හෙක්ටයාර 200ක වනාන්තර ඉඩම් ප්‍රතිෂ්ඨාපනය කිරීම.<br>• හෙක්ටයාර 20ක කුඩා ජල මාර්ග, කුඩා ජල පෝෂක ප්‍රදේශ සහ වනජීවී වාසස්ථාන වැඩිදියුණු කිරීම හා සංරක්ෂණය සිදු කිරීම.<br>• වනාන්තර සහ තෘණ බිම් ප්‍රදේශවල හෙක්ටයාර 50ක නව ගිනි පටි ස්ථාපිත කිරීම සහ පවතින ගිනි පටි හෙක්ටයාර 50ක් නඩත්තු කිරීම.<br>• පරිසර හිතකාමී පිළිවෙත් භාවිතා කරමින් හෙක්ටයාර 300ක වනවගා පුනරුත්ථාපනය කිරීම.<br>• පැල 25,000ක් සහිත තවාන් නඩත්තු කිරීම සහ පාරිසරික වශයෙන් සංවේදී ප්‍රදේශවල නාම පුවරු ස්ථාපිත කිරීම.<br>**2. දේශගුණයට ඔරොත්තු දෙන කෘෂිකර්මාන්තය සහ පාංශු සෞඛ්‍ය වැඩිදියුණු කිරීම**<br>• ගොවි පවුල් 3,000ක් සහ හෙක්ටයාර 3,000ක් සඳහා දේශගුණ වෙනස්කම්වලට ඔරොත්තු දෙන වී සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග |

| | වැඩසටහන / ව්‍යාපෘතිය | 2026 ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.) | 2025 වර්ෂයේ සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 ඉලක්ක |
|---|---|---|---|---|---|
| | | | | | ප්‍රභේද තෝරා ගැනීම, හඳුන්වා දීම සහ ප්‍රවර්ධනය කිරීම.<br>• තිරසාර පාංශු කළමනාකරණ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම සඳහා ගොවි පවුල් 3,000ක් සහ හෙක්ටයාර 3,000ක් යොමු කිරීම තුළින් පාංශු සෞඛ්‍යය වැඩිදියුණු කිරීම.<br>• වී වගාවේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා වී වැපිරීම වෙනුවට පැළ සිටුවීම ගොවීන් 600ක් අතර ප්‍රවර්ධනය කිරීම.<br>• මිශ්‍ර, අනුපිළිවෙල (Relay) සහ පෙළ (Alley) බෝග වගාවන් හරහා බෝග තීව්‍රතාවය වැඩි කිරීම සඳහා සුදුසු වී සහ අනෙකුත් ක්ෂේත්‍ර බෝග (OFC) ප්‍රභේදවල බීජ සහ රෝපණ ද්‍රව්‍ය සැපයීම (ගොවීන් 3,000ක් සඳහා)<br>• කුඹුරු හෙක්ටයාර 300ක ලියදි ඒකාබද්ධ කිරීම.<br>• දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය සහ වැඩිදියුණු කළ කළමනාකරණ ක්‍රම පිළිබඳව නිලධාරීන් 100ක් සහ ගොවීන් 3,000ක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>• පාඩු අවම කිරීම සහ අගය එකතු කිරීම වැඩිදියුණු කිරීම සඳහා පසු අස්වනු කළමනාකරණ පිළිවෙත් හඳුන්වා දීම.<br>• ස්වභාවික ජලමාර්ග සහ වනාන්තර මායිම් වල හෙක්ටයාර 300 ක ඛාදනය වූ වතු ඉඩම් ප්‍රතිෂ්ඨාපනය කර ඵලදායී වනාන්තර බවට පත් කිරීම.<br>• තීව්‍ර වගාව සහ පෝෂණ ගුණයෙන් පොහොසත් යැපුම් නිෂ්පාදනය සඳහා ඉඩම් වෙන් කිරීමට මග පෙන්වීම සඳහා වතු 10ක් සඳහා භූ දර්ශන මට්ටමේ සැලසුම් සකස්කිරීම. |

| | වැඩසටහන / ව්‍යාපෘතිය | 2026 ප්‍රතිපාදන වෙන්කිරිම (රු.මි.) | 2025 වර්ෂයේ සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 ඉලක්ක |
|---|---|---|---|---|---|
| | | | | | • හෙක්ටයාර 500ක් සඳහා පස සහ ජල සංරක්ෂණය සහ දේශගුණික විපර්යාස වල බලපෑම අවම කිරීමේ පිළිවෙත් ක්‍රියාත්මක කිරීම.<br>**3. තිරසාර වැවිලි සහ කෘෂි වන වගා සංවර්ධනය**<br>• තේ ඉඩම් හෙක්ටයාර 100ක් වැඩිදියුණු කිරීම, හායනය වූ තේ ඉඩම් හෙක්ටයාර 20ක් ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ක්‍රමවේද අනුව හෙක්ටයාර 30ක් වැඩිදියුණු කිරීම.<br>• අපනයන කෘෂි බෝග සහ පලතුරු බෝග සමඟ අතුරු බෝග වගාව ප්‍රවර්ධනය කිරීම.<br>• ඌන ලෙස උපයෝජිත ඉඩම්වල හිස් ඉඩ පුරවා වගා කිරීම සඳහා දේශීය වන ශාක විශේෂ, තේ සහ දර සඳහා ගන්නා ශාක සඳහා වතු ප්‍රදේශවල පැල තවාන් 4ක් ස්ථාපිත කිරීම.<br>**4. හරිත වටිනාකම් දාම සංවර්ධනය සහ වෙළඳපල ප්‍රවේශය**<br>• මිල ව්‍යුහයන් සහ අගය දාම වැඩිදියුණු කිරීමේ විභවය (සහතික කිරීම්, තත්ත්ව සහතික කිරීම, නිෂ්පාදන අගය එකතු කිරීම ආදිය) සලකා ජාතික මට්ටමින් හරිත වෙළඳපොළ ඇගයීම.<br>• ඉහළ ජලාධාර ප්‍රදේශයේ අගය දාම හඳුනාගැනීමට සහ හරිත වෙළඳපොළ ඇගයීම සමීක්ෂණ පැවැත්වීමට ක්‍රියාත්මක කිරීමේ ධාරිතාව ගොඩනැගීම.<br>• සුළු පරිමාණ සහ යැපුම් ගොවීන් සම්බන්ධ අගය දාම වැඩිදියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ සකස්කිරීම. |

| | වැඩසටහන / ව්‍යාපෘතිය | 2026 ප්‍රතිපාදන වෙන්කිරිම (රු.මි.) | 2025 වර්ෂයේ සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 වර්ෂයේ අපේක්ෂිත සමස්ථ භෞතික ප්‍රගතිය | 2026 ඉලක්ක |
|---|---|---|---|---|---|
| | | | | | • සුළු/ කුඩා පරිමාණ ව්‍යාපාර ආයතන ලෙස ක්‍රියාත්මක වීම හරහා හරිත වර්ධන අවස්ථා වලින් ප්‍රතිලාභ ලබාගැනීමට ගොවි සංවිධාන ශක්තිමත් කිරීම.<br>• පුහුණු සහ පාර්ශවකරුවන්ගේ සහයෝගය මගින් අගය දාම ව්‍යවසායන් සහ සහය සපයන ආයතන අතර දැනුවත්භාවය සහ සහයෝගීතාවය වැඩි දියුණු කිරීම හරහා එම ආයතනවල තිරසරභාවය නැංවීම.<br>**5. පරිසර පද්ධති සේවා (PES) සඳහා ගෙවීම් කිරීමේ යාන්ත්‍රණය**<br>• උප ද්‍රෝණි තුනක් සඳහා පරිසර පද්ධති සේවා සඳහා ගෙවීම් පිලිබඳ අතරමැදි ආයතනයක් ස්ථාපිත කිරීම.<br>• අවම වශයෙන් පරිසර පද්ධති සේවා සඳහා ගෙවීම් කිරීමේ යාන්ත්‍රණ දෙකක් සඳහා සූදානම් කිරීමේ කටයුතු සම්පූර්ණ කර ක්‍රියාත්මක කිරීමේ කටයුතු ආරම්භ කිරීම.<br>• **6. පුළුල් ජලවිද්‍යාත්මක අධ්‍යයනය සහ ජලවිද්‍යාත්මක ආකෘතිකරණය අඛණ්ඩව සිදු කරගෙන යනු ලැබේ.** |

**2026 වර්ෂයේ දී වාරිමාර්ග අංශය විසින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති**

- දේශගුණික බලපෑම්වලට ඔරොත්තුදෙන හා නවීකරණය කරන ලද වාරි කෘෂිකර්මාන්තය මගින් ආහාර සුරක්ෂිතතාවය වර්ධනය කිරීම අරමුණු කරගත් නියමු ආදර්ශ ආකෘති ක්‍රියාත්මක කිරීම 2027 වර්ෂයේ දී ආරම්භ කිරීමට අනුමත වී ඇති අතර එහි මූලික කටයුතු 2026 වසරේ දී ආරම්භ කිරීමට නියමිතය
- මෙය වාරිමාර්ග ක්ෂේත්‍රය සඳහා නළ ඔස්සේ ජලය බෙදාහැරීමේ පද්ධතියක් හඳුන්වා දීමේ නියමු ව්‍යාපෘතියකි. මෙමගින් වර්තමාන ජල පරිභෝජනයේ දී සිදුවන හානිය 35% කින් අවම කිරීමට අපේක්ෂා කරයි. මේ සඳහා ආසියා සහ පැසිෆික් කලාපයේ සමෘද්ධිය සහ ඔරොත්තු දීමේ හැකියාව සඳහා ජපන් අරමුදල, ආසියානු සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා ජනරජය විසින් ඇ. ඩො. මිලි. 4.98ක් අයෝජනය කරනු ලබයි.

- තාවකාලිකව අත්හිටුවන ලද කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය සහ මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපාතිය ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ 2026 වසරේ සිට ක්‍රියාක්මක කිරීමට සැලසුම් කර ඇත. ඒ අනුව කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා රු.මිලි. 2,500 ක් ද මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපාතිය සඳහා රු. මිලි. 1,000 ක් ද 2026 වසර තුළ ආයෝජනය කිරීමට අපේක්ෂිතය

..........................................

අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
සැලසුම් හා මෙහෙයුම් අංශය
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍යාංශය - වාරිමාර්ග අංශය

ඩී. ඒ. පී. ජී. අබේසේකර
නියෝජ්‍ය අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
වාරිමාර්ග අමාත්‍යාංශය
අංක. 11, ජාවත්ත පාර,
කොළඹ 05.

..........................................

ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍යාංශය

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

# 03. පරිච්ඡේදය - 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

## 3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

2025.12.31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය (2025) | | සටහන | තතය 2025 | 2024 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | ACA-1 |
| | ආදායම් බදු | 1 | - | - | ACA-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවාමත බදු | 2 | - | - | ACA-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මතබදු | 3 | - | - | ACA-1 |
| 1,443,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 1,939,987,603 | 86,430,015 | ACA-1 |
| 1,443,000,000 | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **1,939,987,603** | **86,430,015** | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 36,319,927,056 | 22,762,348,930 | ACA-3 |
| - | තැන්පතු | | 1,560,218,838 | 96,911,906 | ACA-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 199,548,906 | 108,271,180 | ACA-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම්(ආ)** | | **38,079,694,800** | **22,967,532,016** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | 40,019,682,403 | 23,053,962,031 | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 2,566,748,234 | 159,254,397 | |
| - | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) - (ඈ)** | | **37,452,934,169** | **22,894,707,634** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | **-** | **-** | ACA-2(ii) |
| 3,250,950,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 3,223,052,555 | 2,540,698,945 | ACA-2(ii) |
| 696,800,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 508,428,281 | 656,110,596 | ACA-2(ii) |
| 49,523,900,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 48,853,904,632 | 48,459,517,438 | ACA-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ACA-2(ii) |
| 1,350,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 426,458 | 183,374 | ACA-2(ii) |
| 53,473,000,000 | | | **52,585,811,926** | **51,656,510,353** | ACA-2(ii) |
| | **මූලධන වියදම්** | | | | ACA-2(ii) |
| 6,701,600,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 2,898,750,681 | 56,441,952 | ACA-2(ii) |
| 53,642,213,093 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 32,015,726,471 | 4,112,529,144 | ACA-2(ii) |
| 25,011,850,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 17,781,152,264 | 8,811,486,846 | ACA-2(ii) |
| 1,730,000,000 | මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම | 13 | 1,463,676,399 | 1,947,579,800 | ACA-2(ii) |
| 37,500,000 | හැකියා වර්ධනය | 14 | 25,490,468 | 5,034,812 | ACA-2(ii) |
| 15,754,150,000 | වෙනත් මූලධන වියදම් | 15 | 11,734,321,850 | 10,212,201,739 | ACA-2(ii) |
| 102,877,313,093 | **මුළු මූලධන වියදම් (උ)** | | **65,919,118,133** | **25,145,274,293** | |
| | **තැන්පතු ගෙවීම්** | | 591,718,713 | 89,778,157 | ACA-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 252,911,897 | 219,295,950 | ACA-5 |
| | **වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්** | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **844,630,610** | **309,074,107** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **119,349,560,668** | **77,110,858,753** | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)** | | **(81,896,626,499)** | **(54,216,151,119)** | |
| | **අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය** | | **(81,896,626,499)** | **(54,218,905,365)** | ACA-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | - | **2,754,245** | ACA-3 |
| | | | - | - | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2025.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ඒසීඒ - පී

| | සටහන | තතතත 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 129,158,836,914 | 4,111,761,351 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම | ඒසීඒ-5/5(ඒ) | 390,829,393 | 337,466,402 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 2,754,245 |
| **මුළු වත්කම්** | | **129,549,666,307** | **4,451,981,998** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (837,117,180) | 206,093,422 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 129,158,836,914 | 4,111,761,351 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | 63,000,000 | 63,000,000 |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම | ඒසීඒ-4 | 1,164,946,573 | 68,372,979 |
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම්

(අ) ඒසීඒ-1 ආකෘතියට සහ CIGAS පරිගණක පද්ධතියට අනුව සමාලෝචිත වර්ෂය තුළ 2003.07.00 දරන ආදායම් සංකේතය යටතේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළව රැස්කරගෙන ඇති ආදායම රු.68,273,002 ක් ලෙසද, ඒසීඒ-1(i) ආකෘතියට අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළව තවදුරටත් අයකර ගතයුතු හිඟ ආදායම රු.648,779,153ක් ලෙසද ගිණුම්ගතකර තිබුණු අතර ගිණුම් අංශයේ ලිපිගොනු වලට අනුව සමාලෝචිත වර්ෂය තුළ උක්ත වැඩසටහනට අදාළව රැස්කරගෙන ඇති ආදායම රු.61,894,276 ක් ද, තවදුරටත් අයකර ගතයුතු හිඟ ආදායම රු.655,157,879 ක් ද විය. ඒ අනුව වර්ෂයේ රැස්කරන ලද අදායම හා වර්ෂය අවසාන දිනට හිඟ ආදායමෙහි රු.6,378,726 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ඒසීඒ-1(i) ආකෘතියට අනුව 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙලකර ඇති හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයෙහි වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදල් සහ වර්ෂය අවසාන ශේෂය ගිණුම්ගතකර නොතිබුණි. ඒ අනුව 2025 දෙසැම්බර් 31 දිනට 2003.07.00 දරන ආදායම් සංකේතයේ හිඟ ආදායමේ සම්පූර්ණ වටිනාකම හඳුනාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) ගිණුම් අංශයේ ලිපිගොනු වලට අනුව සමාලෝචිත වර්ෂය අවසාන දිනට 2003.07.00 දරන ආදායම් සංකේතය යටතේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළව අම්පාර, ත්‍රිකුණාමලය, මඩකලපුව, පොළොන්නරුව හා පුත්තලම යන දිස්ත්‍රික්ක වලින් තවදුරටත් අයකර ගතයුතු හිඟ ආදායම රු.579,246,258 ක් වන අතර ලංකා සතොස ආයතනය මගින් ලබාදුන් තොරතුරු වලට අනුව තවදුරටත් එම දිස්ත්‍රික්ක වලින් අයවිය යුතු හිඟ ආදායම රු.24,780,679 ක් වේ. ඒ අනුව රු.544,465,579 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) මූල්‍ය ප්‍රකාශන වල ඒසීඒ - 1(iii) ආකෘතිය ප්‍රකාරව වාරිමාර්ග අංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන මොරගහකන්ද ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය මගින් 2025 වර්ෂය සඳහා ජලවිදුලිය විකිණීම වෙනුවෙන් ලද තත්‍ය ආදායම රු.1,436,959,970 ක් ලෙස සඳහන් කර තිබුණද අදායම් ප්‍රකාශය අනුව (ඒසීඒ-1) 2025 වර්ෂය සඳහා ලැබී තිබුණු තත්‍ය ආදායම රු.1,871,366,009 ක් වූයෙන් ඒ අතර රු.434,406,039 ක වෙනසක් විය. එසේම එම බලාගාර ව්‍යාපෘති ආදායම ලෙස ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද ආදායම රු.1,871,714,601 ක් වුවද සිගැස් පරිගණක යෙදවුමෙන් යාවත්කාලීන වූ ආදායම රු.1,872,063,193 ක් වූයෙන් ඒ අතර රු.348,592 ක වෙනසක්ද විය.

(ඉ) මොරගහකන්ද ජල විදුලි බලාගාර ව්‍යාපෘතියේ අදායම් ලැබීම් විස්තරවලට අනුව ජල විදුලිය විකිණීම වෙනුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට හිග ආදායම් නොමැති වුවද මූල්‍ය ප්‍රකාශයෙහි හිඟ ආදායම් ප්‍රකාශයේ (ACA-1(i)) 2023 වර්ෂයට අදාළව රු.11,224,726 ක් හිඟ හිටි ලෙස දක්වා තිබුණි.

### 1.6.2 මූලධන වියදම්

කෘෂිකර්ම අංශයේ සංවර්ධන වැඩසටහන් යටතේ වූ 2103 වැය විෂයය සඳහා 240 ශීර්ෂය මඟින් රු.73,489,136 ක ප්‍රතිපාදනයන් යටතේ කෘෂි උපකරණ 05ක් සහ අනෙකුත් උපකරණ කට්ටලයක් විදේශ ප්‍රදාන ලෙස ලැබී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට භාර දී තිබුණද, අදාළ ප්‍රදානයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 625(1) ප්‍රකාරව ගිණුම් කටයුතු සිදුකර නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් මූලධන වියදම් අවතක්සේරු වී තිබුණි. තවද ප්‍රදානයන් ලෙස ලැබී තිබුණු මෙම උපකරණ මු.රෙ.625 (ආ) සහ (ඉ) පරිදි ඉන්වෙන්ට්‍රි ලේඛනයක ඇතුළත්කර නොතිබුණි.

### 1.6.3 මූල්‍ය නොවන වත්කම්

(අ) අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි (ACA-06/SA 82 ආකෘතියෙහි) මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම්වල එකතුව රු.129,158,836,914 ක් වන අතර අමාත්‍යාංශයෙහි එක් එක් අංශය විසින් පිළියෙළකර තිබූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයන්හි එකතුව රු.4,391,348,967 ක් විය. ඒ අනුව රු.124,767,487,947 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි 2025 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය තුළ අනෙකුත් ආයතන වලින් මාරුකරගෙන ඇති මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම රු.22,500,000ක් වුවද අමාත්‍යාංශයෙහි එක් එක් අංශ විසින් ලබාදුන් තොරතුරු වලට අනුව මාරුකරගෙන ඇති වත්කම්හි වටිනාකම රු.4,500,000 ක් විය. ඒ අනුව රු.18,000,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි 2025 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය තුළ එක් එක් අංශය විසින් මිලදී ගෙන ඇති මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම රු.42,964,030,801 ක් වුවද අමාත්‍යාංශයෙහි එක් එක් අංශ විසින් ලබාදුන් තොරතුරු වලට අනුව වර්ෂය තුළ මිලදීගෙන ඇති වත්කම්හි වටිනාකම රු.9,549,976,058 ක් විය. ඒ අනුව රු.33,414,054,743 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි 2025 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය තුළ එක් එක් අංශය විසින් අපහරණය කරන ලද මූල්‍ය නොවන වත්කම්හි වටිනාකම රු.137,120,134,690 ක් වුවද අමාත්‍යාංශයෙහි එක් එක් අංශ විසින් ලබාදුන් තොරතුරු වලට අනුව වර්ෂය තුළ අපහරණය කරන ලද වත්කම්හි වටිනාකම රු.29,744,688,323 ක් විය. ඒ අනුව රු.107,375,446,368 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) ජනාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අංක 2412/08 හා 2024 නොවැම්බර් 25 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පැවති ග්‍රාමීය ආර්ථික අංශය වෙළඳ, වාණිජ,ආහාර සුරක්ෂිතතා, සමූපකාර සංවර්ධන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරා තිබුණද 2017 දෙසැම්බර් 21 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2017 ප්‍රකාරව ග්‍රාමීය ආර්ථික අංශය සතු වටිනාකම රු.109,748,677 ක් වූ මූල්‍ය නොවන වත්කම් නව අමාත්‍යාංශය වෙත මාරු කිරීමකින් තොරව තවදුරටත් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අධිගණනයවී තිබුණි.

(ඊ) අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය හා පශු සම්පත් අංශය විසින් පරිහරණය කරනු ලබන වාහන සම්බන්ධයෙන් 2025 දෙසැම්බර් 31 දිනට සිදුකල ලේඛන හා CIGAS පරිගණක පද්ධතිය පරීක්ෂාවේදී පහත කරුණු විගණනයට නිරීක්ෂණය විය.

(i) අමාත්‍යාංශයට අයිතිය නොමැති සහ භාවිතයේ නොපවතින වටිනාකම රු.88,692,820ක් වූ වාහන 07ක් CIGAS පරිගණක පද්ධතියේ සහ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්කර තිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අධිතක්සේරුවී ඇති බව නිරීක්ෂණය විය.

(ii) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත, තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු වුවත් වෙනත් ආයතනයන් වෙත නීත්‍යානුකූල හිමිකාරීත්වය පවතින කෘෂිකර්ම අමාත්‍යාංශයේ භාවිතයේ ඇති වටිනාකම රු.7,600,000 ක් වූ වාහන 03 ක් CIGAS පරිගණක පද්ධතියේ ඇතුළත්කර ඇති බව නිරීක්ෂණය විය.

(iii) අමාත්‍යාංශය භාවිතා කරන ලියාපදිංචි අයිතිය අමාත්‍යාංශය සතු එකතුව රු.303,980,000 ක් වටිනා වාහන 24ක් හා වටිනාකම සඳහන් නොකළ වාහන 01 ක් CIGAS පරිගණක පද්ධතියේ සහ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී තිබුණි.

(iv) කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිය පවතින වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් භාවිතා කරන වටිනාකම රු.138,700,000 ක් වූ වාහන 13 ක් සහ වටිනාකම සඳහන් නොකරන ලද වාහන 10ක් පැවරුම්ලාභී අමාත්‍යාංශය නමින් ලියාපදිංචිය සිදු නොකර තවදුරටත් පවත්වාගෙන යන බව නිරීක්ෂණය වූ අතර මෙම වාහනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත නොකිරීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අවතක්සේරු වී ඇති බව නිරීක්ෂණය විය.

(උ) භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දින දක්වා රු.මිලියන 13,770.22 ක පිරිවැයක් දරන ලද එහෙත් 2025 දෙසැම්බර් 31 දින දක්වා නිමවී නොමැති වාරිමාර්ග අංශය යටතේ ක්‍රියාත්මකවන දේශීය අරමුදල් ව්‍යාපෘති 06 ක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ (SA 82) ගිණුම් ගත කර නොතිබුණි. තවද මෙම එක් එක් ව්‍යාපෘති වෙනුවෙන් කෙරීගෙන යන වැඩ වාර්තා හෝ විස්තරාත්මක වියදම් විස්තරද සකස් කර නොතිබුණි.

(ඌ) වාරිමාර්ග අංශය විසින් 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් යටතේ වාහන 118 ක වටිනාකම රු.1,120,129,125 ක් ලෙස දක්වා තිබුණද යාන්ත්‍රික අංශය විසින් ලබාදුන් තොරතුරු අනුව අමාත්‍යාංශ ලේකම් නමින් ලියාපදිංචි අමාත්‍යාංශය සතු කැබ් රථ, කාර් රථ, මෝටර් රථ ඇතුළුව වාහන 178 ක් ගිණුම් ගත කර නොතිබුණි. තවද මෙම අංශයට අයත් යන්ත්‍රෝපකරණ 48 ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර එහි වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) එවකට පැවති වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති 5 ක ඉදිකිරීම් පවත්වාගෙන ගොස් තිබුණු අතර එම ව්‍යාපෘති සඳහා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දිනට සිදුකර ඇති මුළු වියදම රු.9,679,003,446 ක් විය. එහෙත් එම දිනෙන් පසු මෙම ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා කිසිදු මුදලක් වියදම් කිරීමකින් තොරව අත්හැර දමා ඇතත් ඒ සඳහා දැරූ වියදම් සඳහා විස්තරාත්මක වියදම් විස්තරයක් සකස් කර නොතිබුණි. එහෙත් විධිමත් අනුමැතියකින් තොරව ව්‍යාපෘති ගණකාධිකාරීගේ 2025 දෙසැම්බර් 11 දිනැති අංක MI/F/15/Project Gen/2025 දරන ලිපිය මගින් මෙම ව්‍යාපෘති වියදම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට පවරන ලද බවට සඳහන් කර පොත්වලින් ඉවත් කර තිබුණත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් එම වියදම් හෝ වත්කම් භාරගෙන මූල්‍ය ප්‍රකාශනවලට ගෙන ඇති බවට අමාත්‍යාංශයට දැනුම් දීමක් සිදුකර නොමැති අතර ඉහත ලිපිය ප්‍රකාර එම වියදම් මහවැලි අධිකාරියේ පොත් වලට ගැනීමක්ද සිදුකර නොමැති බව අනාවරණය විය.

### 1.6.4 මූල්‍ය වත්කම්

(අ) අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ සේවය හැරගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.511,340 ක් වූ අතර එම ණය ශේෂ වර්ෂ 1-3 ත් අතර කාලපරිච්ඡේදයට අයත් ඒවා විය.

(ආ) ග්‍රාමීය ආර්ථික අංශයේ වැඩ තහනම් කළ නිලධාරියෙකු ගෙන් අයවිය යුතු වර්ෂ 5-10 ත් අතර කාලපරිච්ඡේදයකට අදාළ රු.175,714 ක ණය ශේෂයක් වූ අතර සේවය හැරගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 5-10ත් අතර කාලපරිච්ඡේදයට අයත් ණය ශේෂය රු.249,535 ක් විය.

(ඇ) පශු සම්පත් අංශයේ සේවය හැරගිය නිලධාරීන් තිදෙනෙකු ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.338,927 ක් වූ අතර ඉන් එකතුව රු.286,408 ක් වූ දෙදෙනෙකුගේ ශේෂ වර්ෂ 1-3 ත් අතර කාලපරිච්ඡේයට අයත් වූ ශේෂයක් වූ අතර රු.62,519 ක ශේෂය වර්ෂ 10 -20 ත් අතර කාලපරිච්ඡේදයට අයත් විය.

(ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති ප්‍රකාරව ඉඩම් අංශයේ සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයකරගත යුතු වර්ෂ 01 – 03 ත් අතර කාලපරිච්ඡේදයකට අදාළ රු.226,024 ක අයකර නොගත් පැරණි ණය ශේෂයක් පැවතුණි.

(ඉ) 2017 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 262/2017 අනුව අයකරගත යුතු 2025 දෙසැම්බර් 31 දින වන විට මියගොස් ඇති ඉඩම් අංශයේ නිලධාරිනියකගෙන් අයවීමට තිබෙන වසර 1–3 ත් අතර කාලපරිච්ඡේදයකට අදාළ රු.236,802ක ණය ශේෂයක් පවතින බව නිරීක්ෂණය විය.

(ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.4 සහ 4.5 වගන්තිය ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. ඒ අනුව 2025 වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වාරිමාර්ග අංශයෙහි මියගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.222,545 ක් විශ්‍රාම ගිය නිලධාරීන් සිව් දෙනෙකුගෙන් අයවිය යුතු රු.359,364 ක් සේවය අත හැර ගිය නිලධාරීන් සිව්දෙනෙකුගෙන් අයවිය යුතු රු.801,408 ක්, වෙනත් ආයතන වෙත ස්ථාන මාරු වී ගිය සේවකයින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.80,511 ක් හා හඳුනා නොගත් ණය ශේෂය රු.431,666 ක් වශයෙන් එකතුව රු.1,895,494 ක ණය ශේෂයක් අයකර ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන වල පැවතුණි. මෙම ශේෂ තුළ වර්ෂ 1ට අඩු රු.1,015,749 ක ශේෂයක් ද වර්ෂ 1ත් 3ත් අතර රු.359,122 ක්ද වර්ෂ 10ත් 20ත් අතර රු.520,623 ක් ද විය.

### 1.6.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශයෙහි කෘෂිකර්ම අංශය විසින් පහත ලේඛන විධිමත්ව හා යාවත්කාලීනකර පවත්වාගෙන ගොස් නොතිබුණි.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | හානි හා පාඩු ලේඛනය | මු.රෙ. 104 | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ආ) | වැය ලෙජරයන් | මු.රෙ. 447 | යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |
| (ඇ) | විදේශ ප්‍රදාන උපකරණ සඳහා වූ ඉන්වෙන්ට්‍රි ලේඛනය | මු.රෙ. 625 (ආ) සහ (ඉ) | පවත්වා නොතිබුණි. |

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| | ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| | කෘෂිකර්ම අංශය | | |
| (අ) | 4.9 | විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීමට කටයුතු කළ යුතුය. | 4.6 |
| (ආ) | 1.6.2.2 (ඉ) | අළුත්වැඩියා සිදුකර වාහනය භාවිතයට ගතයුතුය. | 4.7(ආ) |
| (ඇ) | 4.10 | තැන්පතු මුදල අයකර ගත යුතුය. | 4.7(අ) |
| | වාරිමාර්ග අංශය | | |
| (ඇ) | 1.6.1 (ආ) I | 2024 හා 2025 යන වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමකින් තොරව ඉදිකිරීම් නවතා දමා ඇති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මකව පැවැති ව්‍යාපෘති වියදම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයේ (SA 82) ගිණුම් ගත කල යුතුය. | 1.6.3 (උ) |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 අග්‍රිම කළමනාකරණය

පෙර පැවති රජයේ පොහොර සමාගම් වන සී/ස ලංකා පොහොර සමාගම හා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් 2018,2019,2020 හා 2021 වර්ෂයන්හිදී ආනයනය කරන ලද පොහොර සඳහා වූ ණයවර ලිපි කල්පිරෙන අවස්ථාවේදී අදාළ සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමට අවශ්‍ය මුදල් එම අවස්ථාවේදී භාණ්ඩාගාරයෙන් නොලැබීම මත රාජ්‍ය බැංකුවකින් ලබාගෙන තිබුණු කාලීන ණය මුදල වන රු.47,465,632,771 කට අදාළව 2025 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් රු.8,784,284,850 ක ප්‍රාග්ධන වටිනාකමක් ගෙවා තිබුණු අතර රු.1,443,211,932 ක පොලී වියදමක් දරා තිබුණි. ඒ අනුව තවදුරටත් ගෙවීමට ඇති ණය ශේෂ වටිනාකම රු.8,993,745,673ක් බව නිරීක්ෂණය විය.

### 3.2 ආදායම් කළමනාකරණය

(අ) මු.රෙ.128(2)(ඇ), මු.රෙ.176(1), අංක 01/2015 හා 2015 ජූලි 20 දිනැති රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 08 ඡේදය ප්‍රකාරව අංක 2003.07.00 දරන ආදායම් සංකේතය යටතේ කෘෂිකර්ම අංශයේ අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තා එකී කාල සීමාව අවසන්වී මසක් ඇතුළත රාජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂවරයාට පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවද, 2025 මූල්‍ය වර්ෂයට අදාළව එකී වාර්තා කිසිවක් අදාළ කාල සීමාව අවසන්වී මසක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.

(ආ) ඒසීඒ-1(iii) ආකෘතියෙහි රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළ සංශෝධිත ආදායම් ඇස්මේන්තුව හා සත්‍ය ආදායම අතර විචලතාවය සියයට 38 ක් ලෙස දක්වා විචලතාවයට හේතු වශයෙන් අපේක්ෂිත ආදායම රැස්කර ගැනීමට නොහැකි වූ බව දක්වා තිබුණද, එසේ වීමට අදාළ නිශ්චිත හේතු දක්වා නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළව 2025 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයකරගතයුතු හිඟ ආදායම රු.648,779,153ක් වන අතර එය සමස්ථ හිඟ ආදායමෙන් සියයට 90ක් ගෙන තිබූ අතර වර්ෂ 03කට වඩා පැරණි ණය ශේෂයක් විය. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් ආදායම් රැස් කිරීම හා හිඟ ආදායම් අයකර ගැනීම පිළිබඳව අමාත්‍යාංශයේ අධීක්ෂණය ඉතා දුර්වල මට්ටමක පැවතිණි.

(ඈ) වාරිමාර්ග අංශයට අයත් කොත්මලේ වාරිමාර්ග සහ ජල කළමණාකරනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයෙහි කෙටි කාලීන පුහුණු වැඩසටහන් සඳහා සපයනු ලබන නේවාසික පහසුකම් සඳහා ආයතනය විසින් අයකරනු ලබන ගාස්තු හා ආයතනය විසින් සපයනු ලබන අනෙකුත් පහසුකම් වෙනුවෙන් අයකරනු ලබන ගාස්තු තීරණය කිරීමට අදාල නිර්ණායකයන් නිශ්චය කර ඒ සඳහා අමාත්‍යාංශ අනුමැතියක් ලබා ගෙන නොතිබූ අතර එම පුහුණු ආයතනය 2024 වර්ෂය තුළදී කෙටි කාලීන පුහුණු වැඩසටහන් 18ක් පවත්වා එමගින් ආයතනයට රු.4,435,871 ක ආදායමක් ලබාගෙන තිබුණු අතර එයින් වියදම් අඩුකල පසු රු.2,222,241 ක අතිරික්ත මුදලක් පැවැතියද රු.1,573,127 ක් මුදලක් පමණක් රාජ්‍ය ආදායමට බැර කර තිබුණි. ඒ අනුව රු.649,114 ක මුදලක් රාජ්‍ය ආදායමට බැර කර නොතිබුණි.

### 3.3 වියදම් කළමනාකරණය

(අ) කෘෂිකර්ම අංශයේ මෙහෙයුම් හා සංවර්ධන වැඩසටහන් යටතේ වන පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් වෙනුවෙන් 2025 අංක 03 දරන විසර්ජන පනතේ 6 වන වගන්තිය ප්‍රකාරව වැය ශීර්ෂ අංක 240 මගින් වෙන්කර ගන්නා ලද ප්‍රතිපාදනයන්ගෙන් වැය විෂයයන් 03 කට අදාළව සියයට 16 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිව පැවතුණි. එමගින් අමාත්‍යාංශයේ වාර්ෂික වියදම් ඇස්තමේන්තු සකස් කිරීමේ ඌනතාවයන් මෙන්ම සැලසුම්ගත ප්‍රාග්ධන ව්‍යාපෘතීන් නිසි පරිදි ක්‍රියාත්මක නොවීම සහ අවශ්‍යතාවය ඉක්මවා ප්‍රතිපාදන වෙන්කර ගැනීම කර තිබූ බව නිරීක්ෂණය විය.

(ආ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව මූලධන වැය විෂයයන් යටතේ කෘෂි අංශයේ සංවර්ධන වැඩසටහන් යටතේ වූ ව්‍යාපෘති අංක 80, 93 හා 94 ට අදාළව මූලධන වැය විෂයය අංක 2506 හා 2509 වෙත ලබාගෙන තිබුණු ප්‍රතිපාදනයන්ගෙන් සියයට 22 සිට සියයට 83 දක්වා පරාසයකද, කෘෂි අංශයේ මෙහෙයුම් වැඩසටහන් යටතේ වූ මූලධන වැය විෂයය අංක 2003 සඳහා ලබාගෙන තිබුණු ප්‍රතිපාදනයන්ගෙන් සියයට 15 ක ප්‍රතිපාදනද ඉතිරි වී තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව වෙනත් වැය විෂයයන් සඳහා අතිරික්ත ප්‍රතිපාදන මාරුකර යැවීමෙන් පසුවද, කෘෂි අංශයේ සංවර්ධන වැඩසටහන් යටතේ වූ ව්‍යාපෘති අංක 47, 66, 80 සහ 95 ට අදාළව මූලධන වැය විෂයයන් යටතේ වූ අයවැය ප්‍රතිපාදන සියයට 25 සිට සියයට 77 දක්වාද, කෘෂි අංශයේ මෙහෙයුම් වැඩසටහන් යටතේ වූ පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා වෙන්කර තිබුණු අයවැය ප්‍රතිපාදනයන්ගෙන් එම වැය විෂයයන් තුළ සියයට 16 සිට සියයට 95 දක්වාද, කෘෂි අංශයේ සංවර්ධන වැඩසටහන් යටතේ වූ ව්‍යාපෘති අංක 73 හා 91 ට අදාළ පුනරාවර්තන වැය විෂයයන් 02 ක් සඳහා වෙන් වී තිබුණු අයවැය ප්‍රතිපාදනයන්ගෙන් පිළිවෙලින් සියයට 14 ක හා සියයට 31 ක ප්‍රතිපාදනද ඉතිරි වී තිබුණි.

(ඈ) විසර්ජන පනත මගින් කෘෂි අංශයේ මෙහෙයුම් වැඩසටහන් යටතේ පුනරාවර්තන වැය විෂයය අංක 1101,1102 හා 1201 වෙනුවෙන් වෙන් වී තිබුණු අයවැය ප්‍රතිපාදනයන්ගෙන් සියයට 23 සිට සියයට 45 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඉ) කෘෂි අංශයේ මෙහෙයුම් වැඩසටහන් යටතේ වූ මූලධන වැය විෂයය අංක 2001,2002, 2103 හා සංවර්ධන වැඩසටහන් යටතේ වූ මූලධන වැය විෂයය අංක 2002 සඳහා වෙන් වී තිබුණු රු.310,500,000 ක අයවැය ප්‍රතිපාදනද, සංවර්ධන වැඩසටහන් යටතේ වූ ව්‍යාපෘති අංක 64 ට අදාළව පුනරාවර්තන වැය විෂයය අංක 1509 ට වෙන් වී තිබුණු රු.39,000,000 න් මු.රෙ.66 යටතේ වෙනත් වැය විෂයයකට රු.16,668,000 ක ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසු ඉතිරි ප්‍රතිපාදනද, කෘෂි අංශයේ මෙහෙයුම් වැඩසටහන් යටතේ වූ පුනරාවර්තන වැය විෂයය අංක 1405 සඳහා වෙන් වූ ප්‍රතිපාදනයෙන් මු.රෙ.66 යටතේ වෙනත් වැය විෂයයකට රු.500,000ක ප්‍රතිපාදන මාරු කිරීමෙන් පසු ඉතිරි ප්‍රතිපාදනද සියයට 100 ක් ඉතිරි වී තිබුණි.

(ඊ) මුදල් රෙගුලාසි 622 ප්‍රකාරව කෙටුම්පත් ඇස්තමේන්තු පිළියෙල කරන අවස්ථාවේ අපේක්ෂා නොකළ විදේශ ප්‍රදාන/ත්‍යාග සඳහා වීරමොං ක්‍රියාපටිපාටිය හෝ පරිපූරක හරහා ප්‍රතිපාදන ලබාගතයුතු වුවද, කෘෂිකර්ම අංශයේ සංවර්ධන වැඩසටහන් යටතේ වූ 2103 වැය විෂයයට අදාළව 240 ශීර්ෂය මගින් රු.73,489,136 ක ප්‍රතිපාදන ලබාගෙන තිබුණද එම ලැබී ඇති විදේශ ප්‍රදානය හදිසි ප්‍රදානයක් නොව 2025 වර්ෂයට පෙර සිට අපේක්ෂාකර ඇති විදේශ ප්‍රදානයක් බව ලිපිගොනු පරීක්ෂාවේදී විගණනයට නිරීක්ෂණය විය.

(ඍ) මූල්‍ය ප්‍රකාශන තුළ ඒසීඒ 2(ii) ආකෘතිය යටතේ දක්වා ඇති සංවර්ධන වියදම් යටතේ වන වැය විෂයය අංක 2103 හි ප්‍රතිපාදන ඉතිරිය සියයට 79 ක් වී තිබුණු අතර ඉතිරියට හේතුව ලෙස ලැප්ටොප් සහ ස්කැනර් යන්ත්‍ර මිලදී ගැනීම ප්‍රතික්ෂේප වීම දක්වා තිබුණද, මෙම ප්‍රතිපාදන ඉතිරියෙන් සියයට 94 ක් ම විදේශ ප්‍රදාන ලෙස ලැබෙන කෘෂි උපකරණ වෙනුවෙන් ශීර්ෂ 240 මඟින් වෙන්කරවාගත් ප්‍රතිපාදන බව නිරීක්ෂණය විය.

(ඎ) ඇස්තමේන්තු සකස් කිරීමේදී මුදල් රෙගුලාසි 50 ප්‍රකාර හා අවශ්‍යතා හඳුනාගැනීමකින් තොරව මුදල් වෙන්කර ගැනීම හා සැලසුම් කළ පරිදි වැඩ කටයුතු නොකිරීම නිසා 2025 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වාරිමාර්ග අංශය යටතේ මූලධන වියදම් වැය විෂය 04 ක් සඳහා වෙන් කරන ලද සහ පුනරාවර්තන වියදම් වැය විෂය 02 ක් සඳහා වෙන්කරන ලද රු.15,500,000 න් රු.200,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි. තවද වැය විෂයන් 26 ක් සඳහා වෙන්කර තිබුණු එකතුව රු.51,247,720,000 ක ශුද්ධ ප්‍රතිපාදයෙන් එකතුව රු.23,180,545,846 ක් ඉතිරිවී තිබුණ අතර එම ඉතිරිය සියයට 30 ත් සියයට 93ත් අතර පරාසයක් ගෙන තිබුණි.

(එ) 2025 වර්ෂයේ දී අමාත්‍යාංශයේ ඉඩම් අංශයෙහි වැඩසටහන් 01 හි වැය විෂයයන් 03 ක් සඳහා රු.11,900,360 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද එම ප්‍රතිපාදන වලින් රු.7,529,617 ක් එනම් සියයට 60 ත් සියයට 100 ත් අතර ප්‍රමාණයකින් ඉතිරිවී තිබුණි. තවද තවත් වැය විෂයන් 07 කට වෙන් කරන ලද රු.31,130,339 ක ප්‍රතිපාදනයෙන් රු.11,000,869 ක මුදලක් එනම් සියයට 25 ත් සියයට 50 ත් අතර ප්‍රමාණයක් ඉතිරිවී තිබුණි.

(ඒ) අමාත්‍යාංශයේ වැඩසටහන් 02 හි වැය විෂයන් අංක 2105 හා 2509 යටතේ ඉඩම් අංශයේ ප්‍රතිපාදන වෙන් කිරීමේදී අදාළ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ හැකිද යන්න විධිමත් අධ්‍යයනයකින් තොරව වෙන්කළ මුල් ප්‍රතිපාදනය වූ රු.5,000,000,000 න් රු.1,282,297,793 ක ප්‍රතිපාදන නැවත වෙනත් වැය විෂයයන් වෙත මු.රෙ 66 යටතේ මාරු කර තිබුණු අතර අනතුරුව රු.1,258,279,779 ක් එනම් සියයට 34 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(ඔ) මුදල් රෙගුලාසි 50 අනුව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙළ කිරීමේ වගකීම, තම දෙපාර්තමේන්තුවට අදාළ කෙටුම්පත් ඇස්තමේන්තු රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කරන බවට වග බලාගැනීම හා ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙල කිරීම ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. එසේ වුවද ඉඩම් අංශයෙහි වැය විෂයයන් 09 ක් වෙනුවෙන් සිදු කරනු ලැබූ මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනය වූ රු.4,054,000,000 ක් පසුකාලීනව සියයට 30 ක ප්‍රමාණයකින් එනම් එකතුව රු.1,220,265,000 කින් අඩුවී තිබුණු බව නිරීක්ෂණය වේ.

### 3.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට රු.4,272,613 ක් වූ බැඳීම් හා බැරකම් කෘෂිකර්ම හා පශු සම්පත් අංශය විසින් බැඳීම් හා බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොතිබිණි.

(ආ) අමාත්‍යාංශයේ කෘෂිකර්ම හා පශු සම්පත් අංශයට අයත් රු.17,127,988ක බැරකම් මූල්‍ය ප්‍රකාශන වල බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයේ ඇමුණුම අංක iii යටතේ ඇතුළත් කර නොතිබුණි.

## 3.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.11 ඡේදය ප්‍රකාරව අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය වෙත නිකුත් කරන ලද විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

## 3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| භාණ්ඩාගාර ලේකම්ගේ 2024 දෙසැම්බර් 18 දිනැති අංක 05/2024 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | අපහරණය කිරීමට යෝජිත අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය සතු වාහන 41 ක් සහ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ 2024 මැයි 20 දිනැති අංක CGO/NFAMS/01/03 දරන ලිපිය ප්‍රකාරව එහි සඳහන්කර ඇති වාහන 05ක්ද සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් අපහරණය කිරීමට කටයුතුකර නොමැතිබව නිරීක්ෂණය විය. |

## 3.7 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ PF-8350 දරන රථයේ රියදුරු මහතෙකු 2025 ජූලි මස අග සිට සැප්තැම්බර් මස අග දක්වා පෞද්ගලික හේතූන් මත නිවාඩු ලබාගෙන සේවයට වාර්තා නොකළද එම මාස සඳහාවූ මාසික වැටුප ලෙස රු.110,955 ක මුදලක් ඔහුගේ බැංකු ගිණුමට බැරකර තිබුණි. ඒ අනුව සේවයේ නොයෙදුණු කාලයකට ගෙවීම් කිරීම සම්බන්ධයෙන් හා මූලාශ්‍ර ලේඛන නොමැති ගෙවීමක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 136, 137, 138 හා 139 ප්‍රකාරව බලය දීම, අනුමත කිරීම, සහතික කිරීම හා ගෙවීම සිදුකළ ආකාරය සම්බන්ධයෙන් විගණනයට ගැටලුකාරී විය.

## 3.8 බැංකු ගිණුම් මෙහෙයවීම

අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ බලතල යටතේ මෙහෙයවීම සිදුවන බත්තරමුල්ල ලංකා බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය හා සභාපති, ගොවීන්ගේ භාරකාර අරමුදල නමින් වූ නිල බැංකු ගිණුම් දෙකක් පිළිබඳ තොරතුරු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ඇමුණුම (viii) මඟින් ඉදිරිපත්කර නොතිබුණි.

### 3.9 තැන්පතු

2025 දෙසැම්බර් 31 දිනට වසර 02 ක් ඉක්ම වූ ඉඩම් අංශයට අදාළ රු.426,593 ක ඉකුත් තැන්පතු ශේෂය රාජ්‍ය ආදායමට බැර නොකර එම ගිණුමේ රඳවා තබාගෙන ඇති බව නිරීක්ෂණය විය.

### 3.10 අවිධිමත් ගනුදෙනු

2024 වර්ෂයේ පැවැත් වූ ලෝක ඉඩම් සමුළුව සඳහා ඉඩම් අමාත්‍යාංශයේ එවකට සිටි ලේකම්වරයා හා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ඉඩම් ප්‍රතිපත්ති) යන නිලධාරීන් දෙදෙනා සඳහා නවාතැන් පහසුකම් හා ආහාර පාන ලබාදෙන බවට ලෝක බැංකුවේ ශ්‍රී ලංකා හා මාලදිවයින් කළමනාකරුගේ 2024 මාර්තු 13 දිනැති ලිපියෙහි සඳහන් වී තිබියදීත් ඔවුන්ට සංයුක්ත දීමනාව ලෙස රු.714,980 ක් ගෙවා ඇති අතර 2026 මාර්තු 27 දිනට උක්ත නිලධාරීන් දෙදෙනාගෙන් තවදුරටත් අයවිය යුතු මුදල රු.640,419 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) ඉඩම් අංශය විසින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත 2018 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා රු.1,656,654,840 ක මුදලක් ගෙවීම් කර මනින ලද ඉඩම් කැබලි සංඛ්‍යාව 2,134,429ක් වූ අතර ඉන් ලබා දී තිබූ හිමිකම් සහතික ප්‍රමාණය 482,139 ක් පමණක් බව නිරීක්ෂණය විය.

(ආ) අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ බිම්සවිය වැඩසටහන සඳහා 2018 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළදී රු.276,510,197 ක ප්‍රතිපාදන රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබුණි. මෙම වැඩසටහන ආරම්භ වූ 1998 වර්ෂයේ සිට රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත හිමිකම් සහතික පත්‍ර පිළියෙළ කිරීම සඳහා උපලේඛන යවන ලද බිම් කැබලි සංඛ්‍යාව 864,960 ක් ලෙසත්, එම ප්‍රමාණයෙන් ලියාපදිංචි වී ඇති හිමිකම් සහතික ප්‍රමාණය 474,518 හෝ සියයට 54 ක් බව නිරීක්ෂණය විය.

#### 4.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) පසු අස්වනු බෝග හානි අවම කිරීම හා ගබඩා පහසුකම් වැඩි දියුණු කිරීම වෙනුවෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීමකින් තොරව 2023, 2024 හා 2025 වර්ෂවලදී රු.47,289,222 ක් වැයකර හම්බන්තොට දිස්ත්‍රික්කයේ කච්චිගල්ආර ග්‍රාම නිලධාරී වසමේ වී අළෙවි මණ්ඩලයට අයත් ගබඩා පරිශ්‍රයක අපනයනය සඳහා වූ ඇඹුල් කෙසෙල් සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකර තිබුණු අතර ඉදිකිරීමේ කටයුතු අවසන්වූ පසු ගොඩනැගිල්ල සහ සවිකිරීම් පවරාදීම පිළිබඳ නිශ්චිත තීරණයක් ගෙන නොතිබුණි. පසුව ගොවි සමාගමක් පිහිටුවා මධ්‍යස්ථානයේ භාරකාරීත්වය එම සමාගමට භාරදීමට යෝජනා වී ගොවි සමාගම ලියාපදිංචි කිරීමට අදාල නෛතික කටයුතු සිදුකිරීම සඳහා තෝරාගත් සේවා සැපයුම්කරු සමඟ රු.500,000 ක ලංසු වටිනාකමක් යටතේ ගිවිසුම්ගත වී තිබුණද, ගොවි සමාගම පිහිටුවීමේ කටයුතු මෙම වාර්තාවේ දිනවන විටද සිදු වී නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් ලබා ගැනීමට අපේක්ෂිත නිමවුම

අපනයනය කිරීම සඳහා කිසිදු අපනයනකරුවෙකු හඳුනාගෙන නොතිබුණු අතර අක්‍රීයව පවතින මෙම ව්‍යාපෘතිය සඳහා සිදු කරන ලද වියදම නිෂ්කාර්ය වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) පොහොර අවශ්‍යතාවය හා පොහොර සඳහා වන ඉල්ලුම පිළිබඳ ප්‍රාථමික දත්ත නොමැති වීම හේතුවෙන් සිදුවන අපහසුතාවය මගහරවා ගැනීම තුළින් නිවැරදි හා යාවත්කාලීන ඇස්තමේන්තු සකස් කරමින් පොහොර භාවිතය විධිමත් කිරීමේ කාර්යය සිදු කිරීමේ අරමුණින් ජාතික පොහොර ලේකම් කාර්යාලයට තුළ සංවර්ධනය කරන ලද මෘදුකාංග පද්ධතිය ගිවිසුමේ ඇමුණුම C මඟින් දක්වා ඇති මොඩියුල 04 ක් යටතේ (පොහොර ඉල්ලුම ඇස්තමේන්තු කිරීම, බෙදා හැරීම සැලසුම් කිරීම, නිෂ්පාදනය/ මිශ්‍ර කිරීම/ ආනයනය නියාමනය කිරීම හා ගුණාත්මක පාලනය සහ අනෙකුත් ක්‍රියාකාරකම්) සංවර්ධනය කිරීමට එකඟ වී තිබුණු නමුත්, පොහොර නිෂ්පාදනය/ මිශ්‍ර කිරීම/ ආනයනය නියාමනය කිරීම හා ගුණාත්මක පාලනය යන කාර්යය පමණක් මෙම පද්ධතිය හරහා සිදුකරමින් පවතින බව 2024 දෙසැම්බර් 13 හා 2026 පෙබරවාරි 02 වන දිනයන්හිදී සිදුකළ පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද, මෙම පද්ධතිය මඟින් සිදු කර ගැනීමට අපේක්ෂා කර තිබුණු අනෙකුත් කාර්යයන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෑතකාලීනව සංවර්ධනය කරන ලද මෘදුකාංග පද්ධති (Agrarian.lk, GeoGoviya සහ FarmerNet.lk) හරහාද සිදු කරමින් පවතින බැවින් තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවන් ද්විකරණය වීම හේතුවෙන් අනාර්ථික වියදම් වැඩසටහන් ජාතික අයවැය තුළට එකතු වීම හා ඒවා බොහොමයක් විදේශ අරමුදල් මඟින් මූල්‍යනය කිරීමට සිදුවීම වළක්වා ගැනීමේ ජාතික අරමුණ ව්‍යර්ථ වී ඇති බව නිරීක්ෂණය විය.

### 4.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

වාර්ෂික ප්‍රතිපාදන නොලැබීම හෝ වෙනත් කරුණු මත අතරමග නවතා දමන ලද හෝ ඉදිකිරීම් සිදු නොකල වාරිමාර්ග අංශය යටතේ ඇති ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු එනම්, වාරිමාර්ග අංශය යටතේ ඉදිකිරීම් සිදුකරගෙන ගොස් තිබුණු මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, රිදීමාලියද්ද ව්‍යාපෘතිය, වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය, කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය හා ගිංනිල්වලා ව්‍යාපෘතිය යන නිමනොවූ ව්‍යාපෘති විස්තර කිසිවක් 2024 හා 2025 කාර්යසාධන වාර්තාවල දක්වා නොතිබුණි.

## 4.2 විදේශ ආධාර ව්‍යාපෘති

### 4.2.1 විදේශාධාර ව්‍යාපෘතිවල කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ දියර කිරි කර්මාන්තය නඟා සිටුවීමේ අරමුණින් පශු සම්පත් අංශය යටතේ ක්‍රියාත්මක යුරෝ මිලියන 13.9 ක ප්‍රංශ ජනරජයේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගීතාවයෙන් කුඩා පරිමාණ කිරි නිපැයුම් මධ්‍යස්ථාන 06ක් හා කිරි එකතුකිරීමේ මධ්‍යස්ථාන 30ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 වෙත රු.500,000,000 බැගින් වූ යන්ත්‍රෝපකරණ ලබා දී එම යන්ත්‍රෝපකරණ ස්ථාපිත කර වසර 02 ක් හෝ 03ක් ඉක්මවුවද හෝමෝජිනයිසර් යන්ත්‍රය මිල දී ගැනීම සඳහා මූල්‍යමය හැකියාවක් නොමැතිවීම හේතුවෙන් අත්තනගල්ල, බණ්ඩාරගම, පොළොන්නරුව, වෙන්නප්පුව හා නාවලපිටිය කිරි සැකසුම් මධ්‍යස්ථාන 05 තුළ නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, එම යන්ත්‍රය නොමැති වීම හේතුවෙන් වෙළඳපොලට නිකුත් කරන ලද දියර කිරි නිෂ්පාදන නරක්වීම හේතුවෙන්, ඉවත් කිරීම සඳහා මිලි ලීටර් 250 කිරි බෝතල් 1940 ක් පමණ නාවලපිටිය කිරි සැකසුම් මධ්‍යස්ථානයේ ගබඩා කර ඇති ආකාරය 2026.03.06 දින සිදු කරන ලද විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. එසේම දෛනිකව එකතු කරගන්නා දියර කිරිවල තත්ත්ව

පරීක්ෂා කිරිම සඳහා කිරි සැකසුම් මධ්‍යස්ථාන සඳහා ලබා දී ඇති රු.1,429,698 ක වටිනාකමින් යුත් (යුරෝ 4,084.85) නවීන විද්‍යාගාර උපකරණ කට්ටලය භාවිතා නොකරන අතර සාම්ප්‍රදායික ක්‍රම මගින් කිරි සාම්පලවල තත්ත්ව පරීක්ෂා කටයුතු සිදුකර තිබුණි.

### 4.2.2 ව්‍යාපෘතියේ වත්කම් ඌණ උපයෝජනය/ නිෂ්ක්‍රීයව පැවැතීම

118-2-3-056-2506/12 වැය විෂයය යටතේ වන ඉහත 4.2.1 හි සඳහන් කුඩා පරිමාණ කිරි නිෂ්පාදන සමූපාකාර සමිති සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති යෝජනාව යටතේ කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 කට අනුබද්ධව පවතින කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන 5 බැගින් 30ක් දිරිගැන්වීමේ අරමුණින් කිරි සැකසුම් මධ්‍යස්ථාන 06 ට රු.13,366,593 ක් (යූරෝ 38,190.28) වටිනා කිරි ශීත කිරීමේ ටැංකි සහ ඊට අදාළ සෙසු උපකරණ කට්ටල 05 බැගින් ලබා දී තිබුණු නමුත් එම උපකරණ කට්ටල අදාළ කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙත ලබාදී නොතිබූ අතර එම කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙතින් කිරි සැකසුම් මධ්‍යස්ථාන වෙත කිරි ප්‍රවාහනය කිරීමේ අරමුණින් පිළිවෙළින් රු.9,131,594 ක (යූරෝ 26,090.27) හා රු.6,048,262 ක (යූරෝ 17,280.75) ක වටිනාකමින් යුතු ට්‍රක් රථ හා කිරි ලබාගැනීමේ ඒකකයන් ලබා දී තිබුණද කිරි සැපයුම්කරුවන් විසින් දෛනිකව කිරි සැකසුම් මධ්‍යස්ථානය වෙත පැමිණ කිරි සැපයීම සිදුකරන බැවින් අදාළ යන්ත්‍රෝපකරණ නිෂ්කාර්යව පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

## 4.3 ප්‍රසම්පාදනයන්

(අ) වාරිමාර්ග අමාත්‍යාංශය විසින් Ameropa Asia Pte Ltd සමාගම සමඟ ගිවිසුම්ගතව මෙරටට ගෙන්වන ලද පොහොර මෙට්‍රික් ටොන් 41,876 ක් 2022 දෙසැම්බර් 02 දින වරාය පරිශ්‍රයට ලැබී වාරිමාර්ග අමාත්‍යාංශ ලේකම්ගේ 2022 දෙසැම්බර් 05 දිනැති ලිපිය මඟින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත භාර දී තිබුණු අතර මෙම පොහොර තොගයට අදාළ නෞභාර පත්‍රය, වාණිජ ඉන්වොයිස් පත්‍රය, රේගු සටහන්කරය (CusDec) හා පොහොර ගොඩබෑම සම්බන්ධ Daily Cargo Discharge Statement (F7) සහතිකය යන සියලු ලියවිලි මඟින් එම පොහොර තොග ප්‍රමාණයක් සැපයූ බවට තහවුරු වූවද අදාළ පොහොර සමාගම් වෙත ලැබුණු පොහොර ප්‍රමාණය මෙට්‍රික් ටොන් 41,714.5 වූ බවත්, පොහොර මෙට්‍රික් ටොන් 161.5 ක ඌනතාවයක් පවතින බවත් සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ සභාපති විසින් 2023.01.20 දිනැති CCFL/PS/MOP/MI/02/2023 දරන ලිපිය මඟින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්ට හා ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මෙහෙයුම් කළමණාකරුටද පිටපතක් සහිතව වාරිමාර්ග අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී තිබුණි මෙම ඌනතාවය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් නිශ්චිතව හඳුනාගෙන රජයට සිදුව ඇති රු.55,769,987 ක පාඩුව පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) කොත්මලේ වාරිමාර්ග හා ජල කලමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ ඉදිකිරීම් හා නඩත්තු කටයුතු සම්බන්ධයෙන් වූ ලංසු ලේඛන ප්‍රකාර පසුගිය වර්ෂ 5 තුළ මේ හා සමාන වටිනාකමට හා සංකීර්ණතාවය සහිත අවම වශයෙන් ව්‍යාපෘති 02ක් සාර්ථකව නිම කරන ලද බවට වලංගු සාක්ෂි කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කලයුතු විය. ඒ අනුව ආයතනයේ ඉදිකිරීම් කොන්ත්‍රාත් 06ක් සම්බන්ධව ඉදිරිපත් වූ ලංසු ලේඛනයන්හි ඉහත තොරතුරු සඳහා වලංගු සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම තුල 2024 සැප්තැම්බර් 20 දිනැති තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව ප්‍රකාරව ප්‍රතිචාර නොදක්වන ලංසුකරුවන්සේ සලකා නැවත මිල කැඳවීම් සිදුකරන ලෙසට නිර්දේශ කර තිබුණද එයට පටහැනිව

ඇස්තමේන්තුගත වටිනාකම රු.21,199,239 වූ එම කොන්ත්‍රාත් 06 ම එක් කොන්ත්‍රාත්කරුවෙකු වෙත මසක් තුල ඉදිකිරීම් නිම කිරීම සඳහා ප්‍රදානය කිරීමට 2024 ඔක්තෝබර් 01 දින ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

මෙහිදී 2024 වර්ෂයට අදාළ ප්‍රතිපාදන 2024 දෙසැම්බර් 31 දිනට අවසන් වන බැවින් හා මෙම ප්‍රසම්පාදනයට අදාළ බිල්පත් පියවීම 2024 දෙසැම්බර් 31 දිනට පෙර සිදු කල යුතු බැවින්ද, මෙම කොන්ත්‍රාත්කරුගේ CIDA ආයතයේ ලියාපදිංචිය පලපුරුද්දක් ලෙසට පිළිගෙන උක්ත තීරණය ප්‍රසම්පාදන කමිටුව විසින් ගෙන තිබුණි.

## 4.4 වත්කම් කළමනාකරණය

(අ) කෘෂිකර්ම අංශය සතු JK-0194 හා JK-0188 දරන බස් රථ දෙක වර්ෂ ගණනාවක සිට අමාත්‍යාංශයේ පාලනයෙන් පරිබාහිරව කිසිඳු වගකිව යුතු නිලධාරියෙකුගේ මැදිහත් වීමකින් තොරව කාර්යාල ප්‍රවාහනය සිදු කරනු ලබයි. එහි ගමන් ගන්නා නිලධාරීන්ගෙන් වර්ෂ ගණනාවක සිට ප්‍රවාහන ගාස්තු එකතු කර එම මුදල් වලින් අදාළ බස් රථවල ඉන්ධන වියදම් පියවා ගැනීමෙන් අනතුරුව 2025 ජුනි 30 දින පිළිවෙලින් රු.205,840 ක් හා රු.257,111 ක මුදලක් එම නිලධාරීන් අත ඉතිරිව පැවතුණි. කෙසේ වෙතත් මෙම බස් රථයන්ට අදාළ සියලු අලුත්වැඩියා සහ නඩත්තු වියදම් අමාත්‍යාංශය විසින් දරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී, ආදායම් ගණන් දීමේ නිලධාරීගේ හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකුගේ පාලනයෙන් පරිබාහිරව රාජ්‍ය දේපලක් උපයෝජනය කිරීම මඟින් උපයා ගනු ලබන මුදල් අවභාවිතා වන බව විගණනයට නිරීක්ෂණය විය.

(ආ) අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය විසින් 2025 අගෝස්තු 20 වන දින කෘෂිකර්ම අංශයට අයත් PF-8350 දරන කැබ් රථයට අදාළව ටයර් 05 ක් සහ ටියුබ්ලස් වැල්ව් 05 ක් මිලට ගෙන තිබුණු අතර ඉන් රු.127,776 ක වටිනාකමින් යුත් ටයර් 04 අමාත්‍යාංශයේ පහත මාලයේ අබලි ද්‍රව්‍ය හා ටයර් ගබඩා කර ඇති දැල් කාමරයේ රඳවා තිබියදී අස්ථානගත වී තිබුණි. මේ පිළිබඳව ඉහළ කළමණාකාරීත්වය අවස්ථා ගණනාවකදීම දැනුවත්කර තිබුණද, ඊට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) වාරිමාර්ග අංශය විසින් භාවිතා කරනු ලබන වාහන අතුරින් වාහන 14ක් අලුත්වැඩියා කල යුතු වාහන ලෙස 2026 මාර්තු 04 දින හඳුනාගෙන තිබුණද 2025 දෙසැම්බර් මස 31 දින වන විටත් ඒවායේ අලුත්වැඩියා සිදු කර නොතිබුණි.

(ඈ) වාරිමාර්ග අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වාහන 169 ක් වෙනත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු, මණ්ඩල හා පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් විසින් පරිහරණය කරනු ලබන අතර වාරිමාර්ග අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘතීන් විසින් වෙනත් ආයතන සතු වාහන 67 ක් පරිහරණය කරනු ලබයි. රජයට අයත් වාහන වල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම මැයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2017 දෙසැම්බර් 21 දිනැති අංක MF/CG/02 (cir) දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඉ) වාරිමාර්ග අංශයට අයත් එන්ජින් ධාරිතාවය 1800 ට වඩා වැඩි පෙට්‍රල් වාහන 04 ක් හා එන්ජින් ධාරිතාවය 2300ට වඩා වැඩි ඩීසල් වාහන 11ක් ඇතුලුව වාහන 21ක් භාවිතයෙන් තොරව අමාත්‍යාංශ භූමිය තුල විවෘත පරිසරයට නිරාවරණය වන ලෙස සැලකිය යුතු කාලයක සිට ගාල් කර තිබෙන අයුරු 2026 මාර්තු 26 දින සිදුකල භෞතික පරික්ෂාවේදී නිරීක්ෂණය විය. මෙම වාහන නැවත භාවිතා කිරීමට හෝ වෙනත් සුදුසු විකල්ප පියවරක් ගැනීම සිදුකර නොතිබුණි.

(ඊ) උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියේ සඳහා සඳහා රු.76,876,755,039 ක් වියදමක් දරා 2024 අප්‍රේල් 03 දින ඉදිකිරීම් නිමකර ව්‍යාපෘතිය භාර දී භාරදීමේ සහතිකය ලබාගෙන තිබුණද මෙහි දෝෂ වගකීම් කාලය වූ 2025 මාර්තු 31 දින වන විට සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම තුළ එම කාලය පිළිවෙලින් 2025 සැප්තැම්බර් 30 හා 2026 මාර්තු 31 දක්වා දීර්ඝකර තිබුණි. මීට අමතරව 2025 දෙසැම්බර් 15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ව්‍යාපෘතියේ ගිණුම් පියවා අවසන් කිරීමේ සහතිකය නිකුත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකයද 2026 මාර්තු 31 දක්වා නැවත පත් කර තිබුණි. එහෙත් එම කාලයද මේ වන විට ඉක්මවා ගොස් තිබුණු අතර ව්‍යාපෘති අවසන් ගිණුම් සකස් කර ගිණුම් පියවා ව්‍යාපෘති කටයුතු අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. 2024 අප්රේල් 03 දින සිට විදුලිබලය නිපදවන විදුලිබලාගාරය, ජලාශ ඇතුළු අනෙකුත් ව්‍යාපෘති වත්කම් විදුලිබල මණ්ඩලය හා මහවැලි අධිකාරිය විසින් භාවිතා කළද ඒවායේ වියදම හඳුනාගෙන විධිමත් පරිදි අදාළ ආයතන වෙත භාරදීමට කටයුතු කර නොතිබුණි.

(උ) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් කාබනික පොහොර ව්‍යාපෘතියෙහි සිදුවී ඇති අක්‍රමිකතාවයන් සෙවීම සඳහා විශේෂ විමර්ශන කමිටුවක් පත්කර ඇතත්, එම කමිටු වාර්තාව මේ දක්වා නිමකර නොතිබුණි. එම කාබනික පොහොර ව්‍යාපෘතිය යටතේ රු.31,027,575ක වත්කම් අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ගිණුමට ඇතුළත් කර තිබුණු අතර එම වත්කම්වල භෞතික සත්‍යාපනයකින් තොරව, හා වත්කම් පැවරීමේ නිසි ක්‍රමවේදයෙන් පරිබාහිරව 2024 වර්ෂයේ දී පොත්වලින් ඉවත් කර තිබුණි.

(ඌ) 2025 දෙසැම්බර් 31 දින ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තාව අනුව 2023 වර්ෂයේ සිට ඉඩම් අංශයට අදාළ පනත් හා නීතීන් 12 ක් සංශෝධනය කිරීමට සැලසුම් කලද 2025 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් පනත් 6 කට අදාළ කාර්යයන් අවසන් කර නොමැති අතර ඉඩම් අමාත්‍යාංශයේ 2023 හා 2024 වර්ෂයන්හි ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවෙහි 1979 අංක 43 දරන රාජ්‍ය ඉඩම් ප්‍රදාන (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කරන බවට සඳහන් කර තිබූ අතර 2025 වර්ෂයේදී ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත මෙම පනත සංශෝධනය කිරීමේ වගකීම පවරා දුන් නමුත් 2026.03.31 දින වන විටත් පනත සංශෝධනය කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

## 4.5 පාඩු හා හානි

(අ) කෘෂිකර්ම අංශයට අදාළ අලාභ හානි සිදු වී වර්ෂ 02ත් 11ත් අතර කාලයක් ගත වී ඉදිරියට ගෙන එන ලද සිද්ධීන් 44කට අදාළ රු.29,579,093 ක අලාභ සඳහා රක්ෂණ වන්දි මගින් හා වගකිවයුතු නිලධාරීන්ගෙන් අදාළ අලාභ වටිනාකම අයකරගෙන තිබුණද, ඒ සම්බන්ධව මුදල් රෙගුලාසි 104 (4) හා මුදල් රෙගුලාසි 109(1) ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර සිද්ධීන් 11කට අදාළ රු.1,788,138ක අලාභ වටිනාකම කපාහැරීම සඳහා මුදල් රෙගුලාසි 104 (4) අවසන් වාර්තාව මගින් අනුමැතිය ලබා දී තිබුණද, මු.රෙ.109 (1) ප්‍රකාරව කටයුතු නොකර තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් ලෙස ඉදිරියට ගෙන ඒම සිදුකර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව අලාභහානිය සිදු වූ දිනයේ සිට තුන්මසක් ඇතුළත පූර්ණ වාර්තාව ඉදිරිපත් කළයුතු වූවද කෘෂිකර්ම අංශයට අදාළ 2013 වර්ෂයේ සිට 2023.12.31 දක්වා සිදු වූ සිද්ධීන් 26 කට අදාළ රු.3,765,406 ක සිදු වූ අලාභ සඳහා අවසන් වාර්තා ඉදිරිපත් කිරීම 2025 වර්ෂය තුළ සිදුකර තිබුණි. එසේම එම අංශයෙහි ඉකුත් වර්ෂවල සිට පැවත එන 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ අවසාන ශේෂ වශයෙන් දක්වා ඇති සිද්ධීන්ට 05 කට අදාළව එකතුව රු.6,185,021 ක අලාභ වටිනාකම් 2025 වර්ෂයේ ආරම්භක ශේෂයන් ලෙස දක්වා නොතිබුණි.

(ඈ) කෘෂිකර්ම අංශය විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛන අදාළ ආකෘතීන්ට අනුව යාවත්කාලීන කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශනවල නිරූපණය වන සිද්ධීන් 11ට අදාළ රු.9,970,679 ක අලාභ වටිනාකම හානි හා පාඩු ලේඛනයේ සටහන් කර නොතිබූ අතර එම අංශය විසින් හානි හා පාඩු ලේඛනයේ සටහන් කර තිබුණු සිද්ධීන් 05 ට අදාළ රු.15,120,182ක අලාභ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර නොතිබුණි.

(ඈ) 2025 වර්ෂය තුළ සිදු වූ සිද්ධීන් 07කට අදාළව මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ප්‍රාරම්භක වාර්තා සිද්ධිය සිදුවූ වහාම යැවිය යුතු වුවත් කෘෂිකර්ම අංශය විසින් මෙම වාර්තාවේ දින වන විටත් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2025 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව වාරිමාර්ග අංශයෙහි කපා නොහල ඉදිරියට ගෙන ගිය වාහන අනතුරක අලාභය රු.10,482,500 ක් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීම සිදුකර නොතිබුණි.

(ඊ) මුදල් රෙගුලාසි. 104(1) ප්‍රකාරව පාඩුවක් හෝ අලාභයක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතුව නිශ්චිත වශයෙන් දැනගැනීමට හා වගකිවයුත්තන් හඳුනා ගැනීම සඳහා පරීක්ෂාවන් වහාම සිදුකළ යුතු වුවත්, විගණිත දින වූ 2026 මාර්තු 26 දින වන විටත් ඉඩම් අංශයෙහි අංක PH-856, හා CAO-8946 දරන රථවල මූලික පරීක්ෂණ සිදුකර නොතිබුණි. ඉහත රථ දෙකට අමතරව 64-3203 දරන රථයේ 2025 මැයි 21 දින හා 2025 ජූනි 24 දින අනතුරු සිදුව ඇති අතර විගණිත දින වන විට මාස 07 කාලයක් ඉකුත්ව තිබුණද, මු.රෙ. 104(4) ප්‍රකාරව අවසන් පරීක්ෂණය සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

(උ) ඉඩම් අමාත්‍යාංශයේ හිටපු අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් භාවිතා කළ රජය සතු Sony Video Camera Battery Charger නම් අයිතමය භාරදී නොමැති බැවින් රජයට රු.93,750 ක මූල්‍ය අලාභයක් සිදුවී ඇති බව නිරීක්ෂණය වන අතර විගණිත දින වූ 2026 මාර්තු 27 දින වන විට අදාළ සිදුවීම සිදු වී වසර 02 කට වැඩි කාලයක් ගතවී තිබුණද, මු.රෙ 104(4) පරිදි අදාළ අලාභය වගකිව යුත්තන්ගෙන් අය කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 4.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452 (1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම් වලින් පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කල යුතු අතර එම විමසුම් වලට වහාම පිළිතුරු ලබා දිය යුතු වුවත් අමාත්‍යාංශය වෙත 2024.07.24 දින සිට 2026.02.27 දක්වා කාල පරිච්ඡේදය තුළදී නිකුත් කරන ලද විගණන විමසුම් 06ක් සඳහා මෙම වාර්තාවේ දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

### 4.7 කළමනාකරණ දුර්වලතා

(අ) 2016 අප්‍රේල් 08 දින සිට 2021 අප්‍රේල් 07 දින දක්වා එනම් වර්ෂ 05 ක කාල සීමාවක් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලී පදනම මත පෞද්ගලික සමාගමක් සමඟ ඇතිකර ගත් අංක 2178 දරන බදු ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, අංක 288 හි පිහිටි DPJ TOWER නැමැති ගොඩනැගිලි පරිශ්‍රය බදු දීමනාකරුට නැවත 2020 ජනවාරි 31 දින භාරදී ඇතත් අමාත්‍යාංශය විසින් එම බදු දීමනාකරු වෙත ගෙවන ලද රු.මිලියන 63 ක ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතුව මේ දක්වා අයකර ගෙන නොතිබුණි. ගිවිසුම් කොන්දේසි අංක 11 අනුව ගිවිසුම අවසන් වී බදු දේපළ භාරදීමෙන් එක් මසක කාලයක් තුළ බදු දීමනාකරු එම ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතුව බදු ගැණුම්කරු වෙත ලබාදීමට කටයුතු

කළයුතු වේ. ඒ අනුව බදු දීමනාකාර පාර්ශ්වය විසින් නීතිවිරෝධී ලෙස මෙම ආරක්ෂක තැන්පතුව රඳවා තබාගෙන මේ වන විට ඉක්මවා ගොස් ඇති කාලය වර්ෂ 05ක් විය.

(ආ) එවකට කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයා වෙත වෙන්කර දී ඇති පොහොර අංශයට අයත් රු.18,000,000 ක් වටිනා අංක KW-8202 දරන වාහනය 2021 මාර්තු 21 දින අනතුර සඳහා රු.7,500,000 ක රක්ෂණ වන්දියක් ගෙවීමට රක්ෂිත ආයතනය එකඟ වී ඒ අනුව වාහනය අලුත්වැඩියාවට 2022 දෙසැම්බර් 12 දින අදාල ගරාජයට භාර දී තිබුණි. 2023 මාර්තු 23 දින රු.5,625,000 ක මුදලක් වාහන අලුත්වැඩියා ආයතනයට රක්ෂණ සංස්ථාව විසින් ගෙවීමකර තිබුණි. මෙම වාර්තාවේ දින වන විට වර්ෂ 03 ක් ඉක්මගොස් ඇතත් අදාළ අලුත්වැඩියාව සිදුකර නොතිබුණි.

(ඇ) කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණ පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතන මඟින් 2024 වර්ෂයේ රු.125,574,546 ක ප්‍රාග්ධන වියදමක් දරා තිබුණි. එය 2023 වර්ෂයට සාපේක්ෂව සියයට 11.67 ක ප්‍රතිශතයකින් වැඩිවීමක් වුවද, පාඨමාලා සඳහා බඳවා ගන්නා නවක සිසුන් ප්‍රමාණයේ සැලකිය යුතු වැඩිවීමක් සිදු වී නොතිබුණි. ඒ අනුව 2024 හා 2025 වර්ෂයන් තුළ වාරිමාර්ග තාක්ෂණවේදය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවා ගත් නවක ශිෂ්‍යයන් සංඛ්‍යාව පිළිවෙලින් 23 ක් හා 36 ක් වැනි අඩු සංඛ්‍යාවක් විය.

(ඈ) කොත්මලේ වාරිමාර්ග සහ ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමලා පැවැත්විම සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2017 ජූලි මස 18 දිනැති අංක 17/1456/729/017 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ලැබී තිබුණු නමුත් ආයතනය විසින් මේ දක්වා පවත්වා තිබුණු ජාත්‍යන්තර පුහුණු පාඨමාලා සංඛ්‍යාව 5 ක් පමණක් වූ අතර 2019 වර්ෂයෙන් පසු කිසිදු ජාත්‍යන්තර පුහුණු පාඨමාලාවක් පවත්වා නොතිබුණි.

(ඉ) කොත්මලේ වාරිමාර්ග සහ ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර මට්ටමේ පුහුණු පාඨමාලා ප්‍රචාරය කිරිමට ඇති ප්‍රධානතම මාධ්‍යක් ලෙස ආයතනයේ වෙබ් අඩවිය භාවිතා කිරිමට හැකියාව පැවැතුණි. 2024 දෙසැම්බර් මස රු.168,275 ක මුදලක් වැය කර වෙබ් අඩවිය යාවත්කාලින කළද, පැවැත්වීමට සැලසුම් කරන ලද විදේශ පුහුණු පාඨමාලා, එම පාඨමාලාවල සංයුතිය (Course Contents), ආයතනය විසින් සපයනු ලබන පහසුකම් සහ එහි මිල ගණන් පිළිබඳ විස්තරාත්මක තොරතුරු කිසිවක් විදේශ සිසුන්ව ආකර්ශනය වන ආකාරයේ ප්‍රසිද්ධියක් මෙම වෙබ් අඩවිය මඟින් ප්‍රදර්ශණය කිරීමක් සිදුකර නොතිබුණි.

## 4.8 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

කොත්මලේ වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්යන්තර පුහුණු ආයතනයේ නේවාසිකාගාර වටා ආරක්ෂිත වැටක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත් ගිවිසුම යටතේ කාන්තා නේවාසිකාගාරයේ වැට මීටර් 200 ක් සහ පිරිමි නේවාසිකාගාරයේ වැට මීටර් 212 ක් ඉදිකිරීම සඳහා ගිවිසුම් ගතවී තිබුණි. 2025 ජූලි 28 දින මෙම ආයතනයේ උපදේශක මහතා සමඟ සිදුකරන ලද විගණන පරීක්ෂණයේදී වැටෙහි දිග මැනීමේදී ඉදි නොකල මීටර් 55 ක් සඳහා රු.529,627 ක් වැඩිපුර ගෙවා ඇති බව අනාවරණය විය.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශයේ අනුමත සේවක සංඛ්‍යාව 2177 ක් වූ අතර ඉන් තනතුරු 93 ක් පුරප්පාඩුව පැවතුණි. ඒ අතුරින් තනතුරු 21ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු බව නිරීක්ෂණය විය. පශු සම්පත් අංශයේ අනුමත සේවක සංඛ්‍යාව 566 ක් වූ අතර ඉන් තනතුරු 45ක් පුරප්පාඩුව පැවතුණි. ඉඩම් අංශයෙහි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 01ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 26ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 09 ක්ද පුරප්පාඩු පැවතිණි.

(ආ) 2025 ජූලි 14 දින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත යටතේ අත්අඩංගුවට ගෙන ඇප මත මුදාහැර ඇති ඉඩම් අංශයේ සහකාර ලේකම්වරියක් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදය යටතේ විනයානුකූලව කටයුතු නොකර ඉඩම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් මෙම නිලධාරිනිය සඳහා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස්වීමට නිර්දේශ ලබා දී තිබූ අතර එම නිලධාරිනිය 2025 ජූලි 14 දින අත් අඩංගුවට ගැනීමත් සමඟ ඉහළ තනතුරක රාජකාරි ඉටුකිරීම සඳහා ලබා දී ඇති අනුමැතියද අවසන් කර ඇති බැවින් නිලධාරිනිය වෙත වෙන්කර දී තිබූ වාහනය සහ රියදුරා 2025 අගෝස්තු 01 දින සිට ප්‍රවාහන අංශය වෙත භාරදෙන ලෙස සහකාර ලේකම් (පාලන) 2025.08.01 දිනැති අංක 1/16/35/101 දරන ලිපිය මගින් දන්වා තිබුණි. නමුත් අගෝස්තු මස තුල මෙම වාහනය සහ රියදුරු ප්‍රවාහන අංශය වෙත භාර නොදී වෙන්කල වාහනයක් ලෙස වාහනය භාවිතා කර තිබුණි.

පී.කේ.එම්.පී.නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පී.කේ.එම්.පී. නෝනිස්
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය